# 1. ආර්ථික ක්‍රියාකාරිත්වය, ගැටළු හා ප්‍රතිපත්ති

## 1.1 සමස්ත නිරීක්ෂණ

1998 දී ශ්‍රී ලංකා ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය ඇගයිය යුත්තේ, 1930 ගණන්වල මුල් භාගයේදී පැවති මහා ආර්ථික පරිහානියට පසුව මුළු ලෝක ආර්ථිකයම අත්විදිනු ලබන ඉතා අහිතකරම ආර්ථික අර්බුදය හමුවෙහි දැඩි ලෙස අස්ථිර වූ විදේශ වාතාවරණය සැලකිල්ලට ගැනීමෙනි. 1997 මැද භාගයේ සිට ලෝක මූල්‍ය වෙළෙඳපොළවල් හා විනිමය අනුපාතිකයන් දැඩි අස්ථාවර තත්ත්වයන්ට භාජනය විය. නැගෙනහිර ආසියාතික මූල්‍ය වෙළෙඳපොළ අර්බුදය වේගයෙන් පැතිරී ගිය අතර ලෝක ආර්ථිකය කෙරෙහි, විශේෂයෙන් මූල්‍ය හා භාණ්ඩ වෙළෙඳපොළ කෙරෙහි, වඩාත් කල් පවත්නා අහිතකර බලපෑම් ඇති කළේය. ඒ සමගම පැනනැගි රුසියාවේ ගෙවීම් හා මුදල් අර්බුදය, දකුණු අප්‍රිකාවෙහි, බ්‍රසීලයෙහි හා ලතින් ඇමෙරිකානු රටවල් කිහිපයක ඇතිවූ ආර්ථික ප්‍රශ්න යනාදිය මෙම අස්ථාවරත්වය වඩාත් තීව්‍ර කළේය. මීට අමතරව, මූල්‍ය අර්බුදයට භාජනය වී ඇති රටවල් සමග විශාල වශයෙන් ගණුදෙනු කිරීම හේතුවෙන් ඇතැම් ඉහළපෙළේ ජාත්‍යන්තර බැංකු හා ගෝලීය ආයෝජන අරමුදල්වල ස්ථාවරභාවය පිළිබඳව සැලකිල්ල යොමු වී තිබිණි. මේ අතර, ජපාන ආර්ථිකයද උග්‍ර මූල්‍යමය ප්‍රශ්න සමග නිරන්තර අරගලයක නිරත විය. මෙවැනි මූල්‍ය හා ආර්ථික ව්‍යසනයට පිළියම් යෙදීමේදී, ක්‍රමවත් ජාත්‍යන්තර වෙළඳාමක් හා ගෙවීම් ක්‍රමයක් වැඩිදියුණු කිරීම සඳහා ගෝලීය වශයෙන් වගකීම දරන ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ අනෙකුත් ආයතන සතුව ඇති සම්පත් විශාල වශයෙන් යොදගැණින. ආයතනික පරිපාලනය, නීති පද්ධති හා අධීක්ෂණ තත්ත්වයන් සම්බන්ධව පවත්නා දුර්වලතාවයන්, මූල්‍යමය හා වෙළඳ ආයතන පවත්වාගෙන යාමේදී රාජ්‍ය අංශයේ අධික මැදිහත්වීම, කාලීන තොරතුරු ප්‍රමාණවත් ලෙස නොලැබීම හා දේශපාලන අස්ථාවර භාවය යනාදිය හේතුවෙන් බොහෝ රටවල මූල්‍ය පද්ධතියෙහි පවත්නා අස්ථාවරභාවයද මෙම අර්බුදය මගින් ඉස්මතු කර පෙන්විය. අර්බුදයට ලක්වූ රටවල බොහෝ මූල්‍ය ආයතන වසා දැමීමට හෝ රාජ්‍ය අරමුදල් යොදගෙන ප්‍රතිව්‍යුහගත කිරීමට සිදුවිය. ගෝලීය වශයෙන්, සංවර්ධනය වෙමින් පවතින රටවල් වෙත මූල්‍ය ගලායෑම් ඉතා සෙමින් සිදු වූ අතර, විනිමය අනුපාතිකයෙහි ස්ථාවර භාවය තහවුරු කිරීම සඳහා ආරම්භයේදී පොලී අනුපාතිකයන් ඉහළ දැමීම තුළින් ද මූල්‍ය ප්‍රතිපත්තීන් දැඩි කරන ලදී. එසේම, තම තරඟකාරිත්වය නැවත ලබාගැනීම

**1.1. සංඛ්‍යා සටහන**

**තෝරාගත් සාර්ව ආර්ථික දර්ශක**

| ශීර්ෂය | 1980-89 සාමාන්‍ය | 1990-94 සාමාන්‍ය | 1994 | 1995 | 1996 | 1997 | 1998(අ) |
|---|---|---|---|---|---|---|---|
| ද.දේ.නි. (මූර්ත) වර්ධන අනුපාතය | 4.2 | 5.3 | 5.6 | 5.5 | 3.8 | 6.3 | 4.7 |
| ද.දේ.නි. අවධමනකය | 11.8 | 12.0 | 9.3 | 8.4 | 12.1 | 8.6 | 8.4 |
| ඒක පුද්ගල ද.දේ.නි. (නාමික) රුපියල් | 9,608 | 25,148 | 32,414 | 36,869 | 41,940 | 47,988 | 54,035 |
| ඒකපුද්ගල ද.දේ.නි. (නාමික) එ.ජ.ඩොලර් | 362 | 515 | 656 | 719 | 759 | 814 | 837 |
| සේවා වියුක්ති අනුපාතය (සියයට) | ලැ.නො. | 14.4 | 12.1 | 12.0 | 11.1 | 10.3 | 9.1 |
| විදේශීය වත්කම්වල ආනයන ආවරණය, මාස | | | | | | | |
| දළ විදේශීය වත්කම් | ලැ.නො. | ලැ.නො. | 7.2 | 6.6 | 6.0 | 6.4 | 5.9 |
| දළ නිල සංචිත | 1.8 | 3.6 | 5.1 | 4.7 | 4.3 | 4.2 | 4.0 |
| | | (ද.දේ.නි.යේ.ප්‍රතිශතයක් වශයෙන් ) | | | | | |
| දළ දේශීය ආයෝජන | 26.2 | 24.1 | 27.0 | 25.7 | 24.2 | 24.3 | 25.4 |
| දළ දේශීය ඉතිරිකිරීම් | 12.9 | 14.4 | 15.2 | 15.3 | 15.3 | 17.3 | 18.9 |
| විදේශීය ඉතිරිකිරීම් | 13.3 | 10.3 | 11.8 | 10.4 | 8.9 | 7.0 | 6.4 |
| ගෙවුම් ශේෂය ජංගම ගිණුම | -8.1 | -6.3 | -7.3 | -6.0 | -4.9 | -2.6 | -1.8 |
| රාජ්‍ය අයවැය වර්තන ගිණුම | 2.7 | -1.6 | -2.9 | -2.7 | -3.8 | -2.2 | -2.4 |
| රාජ්‍ය අයවැය සමස්ත ශේෂය | -12.4 | -9.8 | -10.5 | -10.1 | -9.4 | -7.9 | -9.2 |
| මුදල් සැපයුම ($M_{2b}$) වෙනස්වීමේ ප්‍රතිශතය (ආ) | ලැ.නො. | ලැ.නො. | 18.7 | 21.1 | 11.3 | 15.6 | 13.2 |
| කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය; වෙනස්වීමේ ප්‍රතිශතය | 12.8 | 13.1 | 8.4 | 7.7 | 15.9 | 9.6 | 9.4 |
| (රුපියල්/එ.ජ.ඩොලර්) විනිමය අනුපාතිකය,වෙනස්වීමේ ප්‍රතිශතය | -9.1 | -4.4 | -0.8 | -7.5 | -4.7 | -7.1 | -9.6 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව


(අ) තාවකාලික
(ආ) වි.ව්‍ය.මු.ඒ.ඇතුලත් ඒකාබද්ධ මුදල් සැපයුම

පිණිස සිය ව්‍යවහාර මුදල් අවප්‍රමාණය කිරීමට චීනයට සිදුවනු ඇතැයිද, එමනිසා බොහෝ ආසියානු රටවල අර්බුදයෙන් පසු ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම තර්ජනයට ලක්වනු ඇතැයිද යන සමපේක්ෂණයද අඛණ්ඩව පැවැතින. අර්බුදයට ලක්වූ බොහෝ රටවල් විසින් පීඩාකාරී එහෙත් අත්‍යවශ්‍ය වූ ව්‍යුහාත්මක ගැලපීම් සිදුකරනු ලැබීය. එය ජාත්‍යන්තර විශ්වාසනීයත්වය නැවත ඇතිකර ගැනීම සඳහා ආධාර විය. සමස්තයක් වශයෙන් ලෝක ආර්ථික වර්ධනය 1997 දී වූ සියයට 4.3 සිට 1998 දී සියයට 2.5 දක්වා අඩකින් පමණ පහත වැටුනු අතර එය ලෝක වෙළඳමෙහි වර්ධනය සියයට 70 කින් සංකෝචනය වීමට හේතු විය. සංවර්ධනය වෙමින් පවත්නා රටවල් වෙත යොමු වූ, ණය උත්පාදනය නොකෙරෙන ප්‍රාග්ධන ගලාඒම් 1997 දී සියයට 20 කටත් වඩා වැඩි ප්‍රමාණයකින් පහත වැටුණු අතර, අනෙකුත් ප්‍රාග්ධන ගලාඒම් ද තියුණු ලෙස පහත වැටිණි. ලෝක භාණ්ඩ හා මූල්‍ය වෙළෙඳපොළවල පැවති මෙම අස්ථාවර භාවයත් සමගම, විශේෂයෙන් ප්‍රධාන ව්‍යවහාර මුදල් අතර විනිමය අනුපාතික වෙනස්වීම් දැඩිලෙස උච්චාවචනය විය. එම තත්ත්වය ශ්‍රී ලංකාව වැනි සාපේක්ෂ වශයෙන් විවෘත හා කුඩා ආර්ථිකයන්හි විනිමය අනුපාතික හා මූල්‍ය ප්‍රතිපත්ති කළමනාකරණය දැඩි අභියෝගාත්මක කාර්යයක් බවට පත් කළේය. ඉතා අර්බුදකාරී ජාත්‍යන්තර ආර්ථික පරිසරයක් තුළ වුවද, විශාල පසුබෑමකට ලක් නොවී සිටීමට හැකිවීම සුවිශේෂ ජයග්‍රහණයක් වන අතර 1930 ගණන්වල සිට මෙතෙක් ඇතිවූ විශාලතම අර්බුදයට ශ්‍රී ලංකා ආර්ථිකය බෙහෙවින් සාර්ථක ලෙස මුහුණ දුන් බව නිගමනය කළහැක.

1998 දී ශ්‍රී ලංකාව සියයට 4.7 ක මධ්‍යස්ථ ආර්ථික වර්ධනයක් අත්කරගත් අතර එය ආර්ථිකයේ සියළු අංශ තුළම පාහේ පිළිබිඹු විය. බොහෝ රටවල් බෙහෙවින් අඩු හෝ සෘණ වර්ධන අනුපාතිකයන් පෙන්වූ තත්ත්වයක් තුළ මෙම ප්‍රගතිය පැසසුම් කටයුතුය. පසුගිය වසර පහක කාලය තුළ පැවති සියයට 5.6 ක සාමාන්‍ය වර්ධන අනුපාතිකයට වඩා මෙම වර්ධන අනුපාතිකය අඩු වුවද, 1998 දී සංවර්ධනය වන රටවල් සඳහා ඇස්තමේන්තුගත වර්ධන අනුපාතිකය වූ සියයට 2.8 හා සසඳන විට යහපත් වර්ධනයක් බව පෙනේ. වඩා යහපත් වූ සැපයුම් තත්ත්වයන්, මුදල් සැපයුමෙහි අඩුවීම හා ලෝක වෙළෙඳපොළෙහි මිල ඉතා තියුණු ලෙස පහත බැසීම නිසා ආනයනිත භාණ්ඩවල මිල ගණන්වල පහළ යෑම හේතුකොටගෙන උද්ධමන අනුපාතිකය පහත වැටීම අඛණ්ඩව සිදුවිය. මුදල් සැපයුමේ මන්දගාමී

**1.1 රූප සටහන**

**තෝරාගත් සාර්ව ආර්ථික දර්ශක**



වර්ධන වේගය හා ඉහළ ධනාත්මක මූර්ත පොලී අනුපාතිකයන්, මිල මත වූ ඉල්ලුම් පීඩනය අඩු කෙරිණ. 1998 දී විනිමය අනුපාතිකයෙහි අවප්‍රමාණයක් තිබියදී වුවද තිරිඟු, බොරතෙල්, පොහොර හා සීනි වැනි බොහෝ අත්‍යවශ්‍ය වෙළෙඳ ද්‍රව්‍යවල ආනයන මිල ගණන් තියුණු ලෙස පහළයෑම නිසා එම ද්‍රව්‍යයන්හි දේශීය මිල ගණන් ඉහළ යෑමෙන් තොරව පවත්වාගත හැකිවිය. දළ දේශීය නිෂ්පාදන අවධමනකය විසින් මනිනු ලබන වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 1997 දී වූ සියයට 8.6 සිට 8.4 දක්වා ආන්තික වශයෙන් අඩුවිය. 1998 දෙවන භාගයේදී දක්නට ලැබුණු මිල ඉහළ යෑමේ වේගයෙහි තියුණු පහත වැටීමත් සමග පාරිභෝගික මිල ගණන් සියයට 7-9 ක ප්‍රමාණයකින් ඉහළ ගියේය. නිෂ්පාදන, ඉදිකිරීම්, වෙළෙඳ, හෝටල් හා අසංවිධිත අංශයේ සේවා සඳහා බඳවා ගැනීම් වැඩිවීම හේතුවෙන් සේවා වියුක්ති අනුපාතිකය තවදුරටත් පහල ගියේය. ගෙවුම් තුලනය සම්බන්ධව සලකා බලනවිට, ප්‍රධාන වශයෙන් ඉහළ තේ මිල ගණන් හා ආනයන මිල ගණන් තියුණු ලෙස පහත බැසීම හේතුවෙන් වෙළෙඳ හිඟය අඩුවිය. පෞද්ගලික සංක්‍රාම අඛණ්ඩව ඉහළයෑම සහ පහත මට්ටමක පැවති වෙළෙඳ හිඟය නිසා වර්තන ගිණුමේ හිඟයද 1997 දී වූ ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 2.6 සිට 1998 දී සියයට 1.8 දක්වා අඩුවිය. අනෙකුත් අංශ සඳහා පැවති ප්‍රාග්ධන ගලාඒම්වලට අමතරව, පණිවුඩ හුවමාරුව හා බලශක්ති යන අංශ තුළ ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කිරීම හේතුවෙන් සෘජු විදේශ ආයෝජන ගලාඒම් එ.ජ.ඩොලර් දශ ලක්ෂ 150 දක්වා ඉහළ ගියේය. සමස්ත ගෙවුම් ශේෂයෙහි එ.ජ.ඩොලර් දශ ලක්ෂ 37 ක අතිරික්තයක් වාර්තා විය. විදේශ වත්කම් ප්‍රමාණය සෑහෙන පමණ සතුටුදයක මට්ටමක පැවති අතර එය මාස 5.9 ක ආනයන මූල්‍යනය කිරීම සඳහා ප්‍රමාණවත් විය. දළ නිල ජාත්‍යන්තර වත්කම් ප්‍රමාණය මාස 4 ක ආනයන සඳහා ප්‍රමාණවත් විය.

කෙසේ වුවද, රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වයේ පසුබෑමක් පිළිබිඹු කරමින් සමස්ත අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1997 දී වූ සියයට 7.9 සිට 1998 දී සියයට 9.2 දක්වා ඉහළ ගියේය. ආරක්ෂක කටයුතු සම්බන්ධ වියදම් වැඩිවීම, වැටුප් වියදම් වැඩිවීම, රාජ්‍ය අංශයේ පාඩු ලබන ආයතනවලට කරන ලද පැවරුම්, 1997 සහ 1998 වර්ෂවල අයවැය මගින් ලබාදෙන ලද විශාල බදු සහනයන් හේතුවෙන් බදු ආදායම් දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයට අනුරූපව වැඩි නොවීම සහ භාණ්ඩ හා සේවා බදු අනුපාතිකය ප්‍රශස්ත මට්ටමට වඩා අඩු මට්ටමක පැවතීම මෙයට ප්‍රධාන වශයෙන් හේතුවිය. අහිතකර ආර්ථික වාතාවරණය හා ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය තත්ත්වයක් තිබියදීත් පෙර වසරේදී මෙන්ම 1998 දී ද මූල්‍ය වෙළෙඳපොල සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවතිණි. මෙය ප්‍රධාන වශයෙන්ම, නම්‍යශීලි ලෙස කළමනාකරණය කරන ලද විනිමය අනුපාතිකයේත්, වෙළෙඳපොළ පොලී අනුපාතිකයේ සුළු වැඩිවීමකට මඟ සලසමින් මූල්‍ය පාලනය දැඩි කිරීමේත්, මූල්‍ය ආයතන පාලන හා අධීක්ෂණ කටයුතු ශක්තිමත් කිරීමේත් ප්‍රතිඵලයකි.

ඉහළ මට්ටමක පැවති අයවැය හිඟය සහිත තත්ත්වයක් යටතේ, උද්ධමනාත්මක පීඩනයේ පහත වැටීම හා අනුරූපීව පොලී අනුපාතිකද අඩුවීමට ඉඩ සැලසෙන පරිදි 1998 දී මූල්‍ය ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කිරීමට නොහැකි විය. එහෙත්, අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා දේශීය අංශයේ සම්පත් වැඩි වශයෙන් උපයෝජනය කිරීම හේතුකොට ගෙන රජයේ සුරැකුම්පත් සඳහා පොලී අනුපාතික සහ ප්‍රමුඛ ණය දීමේ අනුපාතිකය තරමක් දුරට ඉහළ ගියේය. මූල්‍ය ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කිරීමෙන් මිල ස්ථායිතාවයට මෙන්ම විනිමය වෙළෙඳපොළටද අහිතකර බලපෑම් ඇතිවිය හැකිව තිබුණි. පසුගිය වසර තුනෙහි සිදුවුනු ප්‍රශංසනීය ප්‍රගතිය හා සසඳන විට 1998 දී රාජ්‍ය මූල්‍ය කටයුතුවල පසුබෑමක් දකිය හැකි වුවද, බදු ව්‍යුහය, ණය කළමනාකරණය සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ යන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ කටයුතුවල තවදුරටත් ප්‍රගතියක් ඇතිවිය. එහෙත්, ආරක්ෂක කටයුතු සම්බන්ධ වියදම් පිළිබඳ අවිනිශ්චිත භාවය නිසා ඉදිරි වර්ෂ තුළදී ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය මෙමගින් අවධාරණය කෙරේ.

## 1.2 නිමැවුම


### ආර්ථික වර්ධනය

1998 දී අත්කරගත් සියයට 4.7 ක වර්ධන අනුපාතිකය, ඓතිහාසික දිගුකාලීන වර්ධන අනුපාතිකය වන සියයට 5 ට බොහෝදුරට සමානය. ලෝක ආර්ථික අවපාතය සමඟ ඇතිවනු බෙහෙවින් දුෂ්කර තත්ත්වයක් යටතේ වුවද ශ්‍රී ලංකා ආර්ථිකයට දුෂ්කරතාවලට මුහුණ දීමට ඇති හැකියාව මෙයින් පිළිබිඹු වේ. 1980-89 කාලච්ඡේදයේදී සාමාන්‍ය වර්ධන අනුපාතිකය සියයට 4.3 ක් වූ අතර විදේශීය ආර්ථික වාතාවරණය බෙහෙවින් සුබදායක වූ 1990-97 කාලච්ඡේදයේදී එම වර්ධනය සියයට 5.4 ක් විය. තවද, 1998 මෙම වර්ධන වේගය ළඟා කරගනු ලැබූයේ ශ්‍රී ලංකාවේ අපනයන කෙරෙහි, විශේෂයෙන්ම රබර්, පොල් නිෂ්පාදන, සකස් කළ දියමන්ති, මැණික් හා ස්වර්ණාභරණ කෙරෙහි දැඩි අහිතකර බලපෑමක් ඇතිකළ ලෝක ආර්ථික අවපාතය මධ්‍යයේය.

අපනයන අඩුවීම මගින් රටේ විදේශ විනිමය සංචිත කෙරෙහි ඇතිකළ අහිතකර බලපෑම, අත්‍යවශ්‍ය භාණ්ඩවල ආයාත මිල පහත වැටීම මගින් ප්‍රමාණයටත් වඩා සමහන් විය. එතෙකුදු වුවත්, බලපෑමට ලක්වූ සමහර අංශ ආර්ථික අවපාතයෙන් දැඩිලෙස පීඩාවට පත්විය. රබර් වගා අංශය එලෙස දැඩිලෙස පහර වැදුනු එක් අංශයකි. එකතු කළ වටිනාකම් අනුව බලන කල මෙම අංශයේ නාමික ආදායම් 1998 දී සියයට 21 කින් පහත වැටුණි. මෙය සිදුවූයේ 1997 දී ද ඇතිවූ එවැනිම පහත වැටීමකට පසුවය. 1998 දී රබර් අංශයෙහි මූර්ත නිමැවුම සියයට 9 කින් පහත වැටුණි. 1997 දී පැවති අහිතකර කාලගුණික තත්ත්වයෙහි පසුකාලීන අහිතකර බලපෑම නිසා දේශීය නිෂ්පාදනයෙහි පහත වැටීමකට හා නැගෙනහිර ආසියාතු අර්බුදය නිසා

**1.2 රූප සටහන**

**දළ දේ.නි. හි ආංශික සංයුතිය**




මිල තරඟයකටද ලක් වූ පොල් නිෂ්පාදන අංශය, සෙසු අංශවලට වඩා (රබර් අංශය හැර) බෙහෙවින් අඩු නාමික ආදයම් වර්ධනයක් පෙන්වීය. පොල් නිෂ්පාදන අංශයෙහි මූර්ත එකතු කළ අගය සියයට 3.2 කින් පහත වැටුණි. මූර්ත එකතුකළ අගයෙහි පහත වැටීම සමග මැණික් හා දියමන්ති සැකසීමේ කර්මාන්තයන්ද නාමික ආදයමේ අඩු වර්ධනයක් (සියයට 5 ක්) වාර්තා කළේය. අපනයනයන්හි ක්‍රමික අඩුවීමක් සමග කාර්මික අංශයෙහිද වර්ධන වේගය විශේෂයෙන්ම 1998 දෙවැනි භාගයේදී අඩුවිය.

1998 දී, පවත්නා වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 1015 ක් දක්වා සියයට 13.3 කින් ඉහළ ගියේය. 1998 ඇස්තමේන්තුගත මැදි වසර ජනගහනය දශ ලක්ෂ 18,774 ක් විය. ඒ අනුව ඒකපුද්ගල නාමික ආදයම 1997 දී වූ රුපියල් 47,988 (එ.ජ.ඩොලර් 814) සිට 1998 දී රුපියල් 54,035 ක් (එ.ජ.ඩොලර් 837) දක්වා වැඩිවූ බව පෙන්වයි. ලෝක බැංකුව විසින් කරනු ලබන, ආදයම් අනුව රටවල් වර්ග කිරීමට අනුව ශ්‍රී ලංකාව "අඩු ආදයම්" කාණ්ඩයේ සිට ඉහළට ගිය "අඩු මැදි ආදයම්" රටක් වශයෙන් පිළිගැනේ. මෙම කාණ්ඩයට අයත් ඇතැම් ආසියානු රටවල් නම් ඉන්දුනීසියාව, පිලිපීනය, තායිලන්තය, චීනය හා මාලදිවයිනයි. ඊළඟ මට්ටම නම් ඒකපුද්ගල දළ ජාතික ආදයම එ.ජ.ඩොලර් 3116-9635 දක්වා පරාසයට අයත් වන "ඉහළ මැදි ආදයම්" කාණ්ඩයයි. ඉදිරි දස වසර තුළදී ඉහළ මැදි ආදයම් කාණ්ඩයේ රටක් වීමට නම් ශ්‍රී ලංකාව සියයට 8.5 ක ස්ථායී වාර්ෂික ආර්ථික වර්ධනයක් අත්කරගත යුතුය. ආර්ථික වර්ධන වේගයෙහි මෑතකාලීන පසුබැසීම් සහ ලෝක ආර්ථිකය පිළිබඳ දුබල අපේක්ෂාවන් හමුවේ මෙය ළඟා කරගත නොහැකිය. තවත් සැලකියයුතු කාලයක් ශ්‍රී ලංකාව "පහළ මැදි ආදයම්" කාණ්ඩයෙහිම රැඳී සිටියත් සංවර්ධනය වන රටවල් සඳහා සැපයෙන විදේශ ආධාර ක්‍රමයෙන් අඩුවෙමින් පවතින වාතාවරණයක සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය සියලු විදේශ සම්පත් සහනදායී විදේශ ආධාර යටතේ ලබාගැනීමට ඇති ඉඩප්‍රස්ථා ඉතා අඩුය. ඉක්මනින්ම දේශීය ආයෝජන අනුපාතය සියයට 30 ක් දක්වා නැංවීමට හැකිනම් ක්‍රමයෙන් සියයට 7 වාර්ෂික වර්ධන වේගයක් කරා ළඟාවිය හැකිය. ඉතිරිකිරීම් අනුපාතිකයෙහි මෑතකාලීන ඉහළයාම් යහපත් වර්ධනයක් පෙන්වන නමුත්, වර්තන ගිණුමේ අතිරික්තයක් මගින් ඇතිවන අයවැය ඉතිරිකිරීම් නැංවීමකින් තොරව දේශීය ඉතිරිකිරීම් අනුපාතය ඊළඟ වසර තුනේදී සියයට 30 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් දක්වා ඉහළ දැමීමට නොහැකිය. මෙවැනි සීමාවක් යටතේ අනාගත සංවර්ධන ව්‍යාපෘති සඳහා ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළ මගින් විදේශීය මූල්‍ය සම්පත් සපයා ගැනීමට සිදුවිය හැකිය.

නිමැවුම සඳහා ආර්ථිකයේ විවිධ අංශයන්හි දයකත්වය සලකා බලන කල 1998 දී දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 23 ක් වූ ඉහළම දයකත්වය සැපයුනේ කර්මාන්ත අංශයෙනි. අනතුරුව ඉහළ දයකත්වයන් ලැබුණේ පිළිවෙලින් වෙළඳාම (සියයට 22 ක්) ගමනාගමනය හා පණිවිඩ හුවමාරු (සියයට 18), ඉදිකිරීම් (සියයට 11 ක්) සහ මූල්‍ය සේවා (සියයට 11 ක්) යන අංශ වලිනි. වී වගා අංශයෙහි දයකත්වය සියයට 12 ක් වුවද, අනෙකුත් කෘෂිකාර්මික අංශයන්හි සෘණ දයකත්වය නිසා කෘෂිකාර්මික අංශයෙහි සමස්ත දයකත්වය සියයට 7 ක් විය. කර්මාන්ත හා සේවා අංශයන් ආර්ථිකයේ වඩා වැදගත් අංශ බවට පත්වීම නොකඩවාම සිදුවිය.

**1.2 සංඛ්‍යා සටහන**

**ස්ථාවර මිල යටතේ දළ ජාතික නිෂ්පාදිතය (වාර්ෂික ප්‍රතිශත වෙනස)**

| | 1980-89 සාමාන්‍ය(අ) | 1990-96 සාමාන්‍ය(අ) | 1997(ආ) | 1998(ආ) |
|---|---|---|---|---|
| 1. කෘෂිකර්මය, දව ආදී වන ද්‍රව්‍ය හා ධීවර | 2.3 | 2.2 | 3.0 | 2.5 |
| 1.1 කෘෂිකර්මය | 2.3 | 2.2 | 2.9 | 1.8 |
| තේ | 0.3 | 4.4 | 7.1 | 1.1 |
| රබර් | -2.7 | 0.9 | -5.4 | -9.0 |
| පොල් | 3.1 | 0.8 | 3.3 | -3.2 |
| වී | 1.4 | 0.8 | 11.2 | 18.3 |
| අනෙකුත් | 4.6 | 3.5 | 0.5 | -1.5 |
| 1.2 දව ආදී වන ද්‍රව්‍ය | 3.3 | 1.5 | 1.3 | 1.2 |
| 1.3 ධීවර කර්මාන්තය | 2.7 | 2.9 | 5.0 | 8.3 |
| 2. පතල් හා කැනීම් කටයුතු | 6.3 | 3.3 | 3.8 | -5.4 |
| 3. නිමැවුම් කර්මාන්ත | 5.5 | 8.6 | 9.1 | 6.3 |
| 3.1 තේ, රබර් සහ පොල් සකස්කිරීම | 0.7 | 2.4 | 3.5 | -1.2 |
| 3.2 කර්මාන්තශාලා | 7.8 | 10.0 | 10.3 | 7.5 |
| 3.3 කුඩා කර්මාන්ත | 1.6 | 5.8 | 7.0 | 6.5 |
| 4. ඉදිකිරීම් | 1.3 | 5.0 | 5.4 | 7.1 |
| 5. විදුලිය, ගෑස්, ජලය සහ සනීපාරක්ෂක සේවා | 6.6 | 7.5 | 8.1 | 10.1 |
| 6. ප්‍රවාහනය ගබඩා කිරීම සහ සංනිවේදනය | 4.7 | 5.5 | 8.8 | 7.7 |
| 7. තොග සහ සිල්ලර වෙළෙඳම | 4.6 | 5.7 | 6.3 | 4.5 |
| 7.1 ආනයන | 2.7 | 7.8 | 9.6 | 8.2 |
| 7.2 අපනයන | 4.4 | 11.2 | 12.0 | 0.1 |
| 7.3 දේශීය | 6.4 | 2.7 | 2.2 | 2.0 |
| 8. බැංකු රක්ෂණ සහ නිශ්චල දේපල | 9.4 | 8.2 | 10.2 | 6.4 |
| 9. නිවාස අයිතිය | 2.9 | 1.3 | 1.3 | 1.2 |
| 10. රාජ්‍ය පරිපාලන සහ ආරක්ෂක කටයුතු | 10.2 | 3.1 | 5.2 | 3.0 |
| 11. සේවා (අන් තැනක සඳහන් නොවන) | 2.2 | 5.3 | 6.1 | 3.7 |
| 12. දළ දේශීය නිෂ්පාදිතය | 4.2 | 5.3 | 6.3 | 4.7 |
| 13. විදේශීය ශුද්ධ සාධක ආදයම | 43.5 | 4.4 | -21.7 | 11.9 |
| 14. දළ ජාතික නිෂ්පාදිතය | 4.0 | 5.4 | 6.8 | 4.6 |

(අ) 1982 ස්ථාවර සාධක පිරිවැය මිල අනුව
(ආ) 1996 ස්ථාවර සාධක පිරිවැය මිල අනුව

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## නිෂ්පාදන කර්මාන්ත

1997 දී අත්කරගත් සියයට 9.1 ක වර්ධනයට සාපේක්ෂව නිෂ්පාදන කර්මාන්ත අංශය 1998 දී සියයට 6.3 ක්වූ තරමක අඩු වේගයකින් වර්ධනය විය. තේ, රබර් සහ පොල් සැකසුම් කර්මාන්ත හැරුණු විට දේශීය වෙළෙඳ-පොළ කෙරෙහි යොමු වූ ඛනිජ තෙල් පිරිපහදු නිෂ්පාදන, සිමෙන්ති, ගොඩනැගිලි උපකරණ, තිරිඟුපිටි, සත්ව ආහාර, මත්පැන්, කිරි නිෂ්පාදන, ඖෂධ වර්ග, පාන වර්ග සහ රසායන ද්‍රව්‍ය වැනි කර්මාන්තවල ඉහළ ක්‍රියාකාරිත්වයක් පිළිබිඹු කරමින්, කම්හල් කර්මාන්ත 1998 දී සියයට 7.6 කින් වර්ධනය වීය. කම්හල් කර්මාන්ත අංශය 1997 දී අත්කරගත් වර්ධනය සියයට 10.3 ක් විය. අපනයනාභිමුඛ කර්මාන්ත මිශ්‍ර ක්‍රියාකාරිත්වයන් පෙන්වීය. ධීවර නිෂ්පාදන, රබර් සහ පිඟන් භාණ්ඩ නිෂ්පාදන ඉහළ වර්ධන අනුපාතිකයන් පවත්වාගත් යන අතර දියමන්ති, මැණික් සහ ස්වර්ණාභරණ අපනයන පහත වැටුණි. ප්‍රධාන කර්මාන්තයන් වන ඇඟළුම් හා රෙදිපිළි නිෂ්පාදන අංශයෙහි වර්ධනය, තියුණු වූ ජාත්‍යන්තර තරඟකාරිත්වය හමුවේ වසරේ දෙවන භාගයේදී මන්දගාමී විය. කාර්මික නිෂ්පාදන වටිනාකමෙන් සියයට 84 ක් වන කම්හල් කර්මාන්ත 1998 වර්ෂයේ සමස්ත ආර්ථික වර්ධනය සඳහා සියයට 22 ක දායකත්වයක් සපයා ඇත. කර්මාන්ත අංශයේ නිෂ්පාදන ධාරිතාවය 1998 දී සියයට 4 කින් ඉහළ ගොස් ඇති බවට ඇස්තමේන්තු කොට ඇති අතර ධාරිතා උපයෝජනය 1997 දී පැවති සියයට 84 ක මට්ටමේම නොවෙනස්ව පැවතුනි. ආයෝජන මණ්ඩලයට අයත් නොවන ව්‍යවසායන්ගේ ශ්‍රම ඵලදායිතාවද සියයට 4 කින් වර්ධනය වී ඇති බවට ඇස්තමේන්තු කර ඇත.

කර්මාන්ත අංශය මෙම වර්ධනය අත්පත් කරගනු ලැබුයේ, නැගෙනහිර ආසියාවේ මූල්‍ය අර්බුදය හා ඉන්පසුව රුසියාවද ඇතුළුව ජපානය සහ දකුණු සහ මධ්‍යම ඇමරිකානු රටවල ඇතිවූ ආර්ථික ගැටලු හේතුවෙන් අන්තර්-ජාතික වෙළඳම තුනෙන් දෙකකින් පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර වෙළඳපොළ පිරිහීමට ලක්වූ තත්ත්වයක් යටතේය. ජාත්‍යන්තර වෙළෙඳපොළ පරිහානි තත්ත්වයන් යටතේ අපනයන රටවල් අතර තරඟය උත්සන්න විය. ශ්‍රී

ලංකා රුපියලේ අගයද වේගයෙන් අවප්‍රමාණය වීම (පසුගිය වර්ෂ කිහිපය තුළ සියයට 5-6 වාර්ෂික අවප්‍රමාණය වීමට සාපේක්ෂව සියයට 9.6 කින් අවප්‍රමාණය වීම) කර්මාන්ත අංශයට යම් පමණකින් උපකාරී විය. ආසියා-පැසිපික් කලාපයේ සිදුවූ ආර්ථික පසුබෑස්ම නිසා සකස් කළ දියමන්ති, ස්වර්ණාභරණ සහ පිහන් භාණ්ඩ නිෂ්පාදන සඳහා වූ අපනයන ඉල්ලුම පහත වැටුණි. සැපයුම් නිශ්චිතතාවය සහ භාණ්ඩවල ගුණාත්මක තත්ත්වය පිළිබඳව සැලකිලිමත් වන ප්‍රධාන ගැණුම්කරුවන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදකයන් වෙත ඇණවුම් නොකඩවා ලබාදීම නිසා සමහර අපනයනාභිමුඛ කර්මාන්තයන්හි ක්‍රියාකාරිත්වය සතුටුදයක මට්ටමක පැවැතුණි. එසේ වුවද, අපනයනාභිමුඛ කර්මාන්ත අංශයෙහි ඇති වූ සාමාන්‍ය පසුබෑස්ම වලක්වා ගැනීමට නොහැකි විය.

**1.3 සංඛ්‍යා සටහන**

**දළ ජාතික නිෂ්පාදිතය (ආංශික සංයුතිය ප්‍රතිශතයක් වශයෙන්) (අ)**

| ශීර්ෂය | 1978 | 1988 | 1997 | 1998 |
|---|---|---|---|---|
| 1. කෘෂිකර්මය,වන හා ධීවර කර්මාන්තය | 30.4 | 26.3 | 21.7 | 21.3 |
| 2. පතල් හා කැනීම් කටයුතු | 2.3 | 2.7 | 2.0 | 1.8 |
| 3. නිමැවුම් කර්මාන්ත | 18.5 | 15.4 | 16.6 | 16.5 |
| 4. ඉදිකිරීම් | 4.8 | 7.3 | 6.9 | 7.1 |
| 5. සේවා | 43.9 | 48.2 | 52.8 | 53.0 |
| විදුලි බලය, ගෑස් ජලය සහ සනීපාරක්ෂක සේවා | 0.5 | 1.2 | 1.3 | 1.4 |
| ප්‍රවාහන, ගබඩා කිරීම සහ සංනිවේදනය | 10.8 | 10.8 | 11.1 | 11.2 |
| තොග සහ සිල්ලර වෙළෙඳම | 19.9 | 19.9 | 22.0 | 22.3 |
| බැංකු, රක්ෂණ සහ නිශ්චල දේපල | 2.4 | 4.4 | 7.4 | 7.5 |
| නිවාස අයිතිය | 3.8 | 2.6 | 1.9 | 1.9 |
| රාජ්‍ය පරිපාලනය සහ ආරක්ෂක කටයුතු | 3.8 | 5.4 | 5.0 | 4.9 |
| සේවා(අන් තැනක සඳහන් නොවන) | 4.3 | 3.8 | 4.0 | 3.9 |
| 6. දළ දේශීය නිෂ්පාදිතය | 100.0 | 100.0 | 100.0 | 100.0 |
| 7. විදේශීය ශුද්ධ සාධක ආදයම | -0.6 | -2.6 | -1.2 | -1.3 |
| 8. දළ ජාතික නිෂ්පාදිතය | 99.4 | 97.4 | 98.8 | 98.7 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) පවත්නා සාධක මිල අනුව

කර්මාන්තවල උසස් තාක්ෂණ භාවිතය සඳහා වූ රාජ්‍ය මූල්‍ය දිරිදීම්, ආයෝජන මණ්ඩලයට අයත් නොවන අපනයනකරුවන් සඳහා විදේශ මුදලින් ණය ලබා ගැනීමට අවස්ථාව සලසාදීම, රෙදිපිළි ආනයන ලිහිල් කිරීම සහ පෙර පැවති ඉහළ පොලී අනුපාතයන්ට සාපේක්ෂව පහළ පොලී අනුපාතයන් පවත්වා ගැනීම ඇතුළු ප්‍රතිපත්ති කර්මාන්ත අංශයේ වර්ධනය සඳහා ඉවහල් විය. නව ආයෝජනයන් සහ උසස් තාක්ෂණයෙහි වාසි හේතුවෙන් නිෂ්පාදන ධාරිතාවය පුළුල් වූ අතර කර්මාන්ත පදනම තවදුරටත් විවිධාංගීකරණය විය. තීරුබදු ඉවත් කිරීමෙන් ඇති වූ වාසිය ප්‍රයෝජනයට ගනිමින් වර්ෂය තුළදී ආයෝජන භාණ්ඩ ආනයනය සියයට 12 කින් ඉහළයාම දනට පවත්නා කර්මාන්ත නවීකරණය වීමට සහ නව කර්මාන්තශාලා ආරම්භ වීමට හේතුවිය. උසස් තාක්ෂණය සඳහා ආයෝජන ඉහළයාම බොහෝ කර්මාන්තවල ඵලදායීතාවය වර්ධනය වීමට හේතු වූ අතර (උදා: පළතුරු සහ මස් සැකසුම් කර්මාන්ත, රබර් සහ ඇඟළුම් කර්මාන්ත) එම තත්ත්වය වැටුප් හා වේතනවල වූ මධ්‍යස්ථ වර්ධනය සමනය කිරීමට උපකාරී විය.

නිෂ්පාදන කර්මාන්ත අංශයේ ශ්‍රම ඵලදායිතාවයෙහි ක්‍රමික වර්ධනයක් දකිය හැකි විය. මෙම අංශයේ සමස්ත නිෂ්පාදන පිරිවැයේ ඉහළයාම පිළිබිඹු කරනු ලබන ගම්‍ය මිල දර්ශකයට අනුව මෙම අංශය සාපේක්ෂව අඩු පිරිවැය සහිත අංශයන්ගෙන් එකක් විය. උදාහරණයක් වශයෙන් 1998 දී සමස්ත ද.දේ.නි. ගම්‍ය මිල දර්ශකය වූ සියයට 8.4 ට සාපේක්ෂව කම්හල් කර්මාන්ත අංශයේ ගම්‍ය මිල දර්ශකය සියයට 6 ක් විය. මෙම අංශයේ තරඟකාරිත්වය තවදුරටත් වැඩිදියුණුවීම ප්‍රධාන වශයෙන් ඵලදායිතා වර්ධනය තුළින් ලබා ගතයුතු වේ. කාලීන අවශ්‍යතා අනුව යන්ත්‍රෝපකරණ සහ මානව කුසලතා වර්ධනය කිරීමට අමතරව මාර්ග සහ ප්‍රවාහන පද්ධති, වරාය පහසුකම් සහ පණිවිඩ හුවමාරු ජාලයන්හි වැඩිදුර සංවර්ධනය කර්මාන්ත අංශයෙහි වේගවත් වර්ධනයක් සඳහා අත්‍යවශ්‍ය වේ. ශ්‍රම ඉල්ලුම සහ සැපයුම අතර පවත්නා නොගැලපීම සහ ශ්‍රම වෙළඳපොළෙහි දක්නට ඇති අනම්‍යශීලී බව කර්මාන්ත අංශයේ වේගවත් ප්‍රසාරණයක් සඳහා පවතින සංරෝධකයක් වේ.

## කෘෂිකර්මය

1997 වර්ෂයේ සියයට 3 ක වර්ධනය සමග සසඳ බලන කල 1998 මූර්ත කෘෂිකාර්මික නිමවුම සියයට 2.5 කින් වර්ධනය වූ බවට ඇස්තමේන්තු කර ඇත. යහපත් කාලගුණික තත්ත්වය නිසා වී වගාව යටතේ වූ බිම් ප්‍රමාණය සැලකියයුතු ලෙස වැඩිවීම මෙන්ම වී අස්වනු ඉහළ යාමද වී නිෂ්පාදනය සියයට 20 කින් ඉහළ යාමට දායක විය. මහ සහ යල කන්න දෙකෙහිම නිෂ්පාදන මට්ටම් වැඩිවීම් පෙන්නුම් කෙරිණි. 1997 වර්ෂයේ පැවති නියඟයෙන් පසු යම් ප්‍රමාණයකින් යථා තත්ත්වයට පත් වූ මහ සහ යල කන්නයේ වී නිෂ්පාදනය පිළිවෙලින් සියයට 22 කින් සහ සියයට 16 කින් වර්ධනය විය. සාමාන්‍ය වී නිෂ්පාදන මිල සියයට 7 කින් පහත වැටී වී බුසලක මිල රුපියල් 215 ක් විය. දේශීය නිෂ්පාදනය වැඩිවීමත් සමගම සහල් ආනයනය 1997 වර්ෂයේදී වූ මෙට්‍රික් ටොන් 306,000 සිට 1998 දී මෙට්‍රික් ටොන් 168,000 ක් දක්වා පහත වැටුණි. පාරිභෝගිකයින්ගේ මෙන්ම නිෂ්පාදකයින්ගේ ද අවශ්‍යතාවය සලකා දේශීය වෙළෙඳපොළෙහි සහල් මිල සාධාරණ මට්ටමක පවත්වා ගැනීම පිණිස සහල් ආනයන මත වූ තීරු බද්ද සියයට 35 ක මට්ටමට පත්කරන ලදී.

පෞද්ගලීකරණ කළමනාකරණය යටතේ තේ නිෂ්පාදනයේ වර්ධනයක් පෙන්නුම් කළ අතර 1998 වර්ෂයේ මැද භාගය වනතුරු මිල ගණන්ද අඛණ්ඩ වර්ධනයක් පෙන්වීය. 1998 වර්ෂයේදී තේ නිෂ්පාදනය සියයට 1 කින් වර්ධනය වී නව වාර්තාගත මට්ටමක් කරා එනම්, කිලෝග්‍රෑම් දශලක්ෂ 280 ක් දක්වා ඉහළ ගියේය. 1998 ජූලි මාසයේදී රුසියානු මුදල් අර්බුදය හේතුකොටගෙන තේ මිල ගණන්

පහත වැටීම ආරම්භ වූ අතර ප්‍රධාන වශයෙන් කෙන්යාවේ තේ නිෂ්පාදනය යථා තත්ත්වයට පත්වීමත් (සියයට 30) සමග ලෝක තේ සැපයුමට සැලකිය යුතු ලෙස ඉහළ යාම, නිසා තේ මිල ගණන් තවදුරටත් පහත වැටුණි. මිල ගණන් පහල යාම තවදුරටත් තීව්‍ර කරමින් ඉන්දියාවේ තේ නිෂ්පාදනයද වැඩිවිය. කොළඹ වෙන්දේසියේ තේ සඳහා වූ සාමාන්‍ය මිල සියයට 13 කින් ඉහළ ගිය අතර අපනයන මිල සියයට 17 කින් ඉහළ ගියේය. (එ.ජ.ඩොලරයට අනුව සියයට 7 කින්) 1998 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ මුළු තේ අපනයනයෙන් සියයට 40 ක් නිදහස් පොදු රාජ්‍ය මණ්ඩලීය රටවලට, තුර්කියට සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය වෙත සිදු කරන ලදී. රුසියානු ගැණුම්කරුවන්ගේ නොපියවූ අපනයන බිල්පත් නිසා තේ අපනයනකරුවන් දුෂ්කරතාවලට මුහුණපා ඇත. 1998 ප්‍රථම භාගයේදී තේ කිලෝග්‍රෑම් දශ ලක්ෂ 25 ක් රුසියාවට අපනයනය කරනු ලැබූ අතර වර්ෂයේ දෙවන භාගය තුළදී එම ප්‍රමාණය කිලෝග්‍රෑම් දශ ලක්ෂ 14 දක්වා පහත වැටුණි. තේ වල සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය සියයට 14 කින් ඉහළ ගොස් කිලෝග්‍රෑමයක් රුපියල් 107 ක් විය. තේ වගා අංශයේ දෛනික වේතනය රුපියල් 83 සිට රුපියල් 101 දක්වා ඉහළයාම 1998 වර්ෂයේ පිරිවැය ඉහළ යාමට ප්‍රධාන වශයෙන් දයක විය. 1998 වර්ෂයේදී ද ශ්‍රී ලංකාව ලෝකයේ විශාලතම තේ අපනයනකරුවාගේ තත්ත්වය තවදුරටත් පවත්වාගෙන ගියේය.

ප්‍රධාන වශයෙන්ම, 1996 වර්ෂයේ සිට නොකඩවා මිල පහත වැටීම නිසා රබර් නිෂ්පාදකවරුන්ගේ ලාභය අඩුවී යාම හේතුවෙන් සාමාන්‍ය රබර් නිෂ්පාදනය සියයට 9 කින් පහත වැටුනි. අපනයන මිල සියයට 10 කින් පහත වැටී කිලෝග්‍රෑමයක් රුපියල් 68 ක් වූ අතර, කොළඹ වෙන්දේසියේ මිලද සියයට 12 කින් පහත වැටී කිලෝග්‍රෑමයක් රුපියල් 49.76 ක් විය. 1998 වර්ෂයේ මුල් භාගයේදී තායිලන්ත රජය විසින් රබර් තොග වෙළෙඳපොළට මුද හැරීම සහ නැගෙනහිර ආසියාතික රටවල සිදුවූ මුදලේ අගය අවප්‍රමාණ කිරීමද ජාත්‍යන්තර වෙළඳපොළේ රබර් මිල ගණන් පහත වැටීමට හේතුවිය. ජාත්‍යන්තර ස්වාභාවික රබර් මිල ස්ථායීකරණ වැඩපිළිවෙල මගින් මිල පහත වැටීම නවතාලීමට නොහැකි වූ අතර මූල්‍ය ගැටලු හේතුකරගෙන ජාත්‍යන්තර ස්වාභාවික රබර් ගිවිසුමද සතුටුදයක ලෙස ක්‍රියාත්මක නොවීය. කෙසේ වුවද, කාර්මික අංශය විසින් අපනයන සහ දේශීය වෙළඳපල සඳහා වන නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍යයක් වශයෙන් දේශීය රබර් වැඩි වශයෙන් පාවිච්චි කිරීම සතුටුදායක නැඹුරුවකි. 1998 දී මුළු රබර් නිමවුමෙන් සියයට 50 කටත් වඩා දේශීය කර්මාන්ත සඳහා යොදගෙන ඇත.

1997 වර්ෂයේ පැවැති අයහපත් කාලගුණික තත්ත්වයේ පසුකාලීන බලපෑම යටතේ පොල් නිෂ්පාදනයේ පහත වැටීමක් වාර්තා විය. කෙසේවෙතත්, 1998 වර්ෂයේ දෙවන භාගය තුළදී පොල් වගා අංශය යම් පමණකින් ප්‍රකෘතිමත් වීමේ ලක්ෂණ පෙන්නුම් කළේය. කපාපු පොල් නිෂ්පාදනය සියයට 31 කින් පහත වැටුණු අතර, පොල්තෙල් නිෂ්පාදනය සියයට 16 කින් වර්ධනය විය. එයට අමතරව, රසකැවිලි සහ බිස්කට් නිෂ්පාදනය වැනි දේශීය කර්මාන්තවල අමුද්‍රව්‍යයක් ලෙසද පොල් නිෂ්පාදිත භාවිතා කිරීම නිසා මෑතකාලයේදී දේශීය පොල් පරිභෝජනය ද වැඩිවිය. පොල් සැපයුමෙහි අඩු වීමක් වර්ෂය පුරාම දක්නට ලැබුණු හෙයින් පොල් ගෙඩියක මිල වසර පුරාම ඉහළ මට්ටමක පැවතුනි.

ගම්මිරිස්, කොකෝවා, කෝපි, කරදමුංගු, සාදික්කා සහ කුරුඳුතෙල් නිෂ්පාදනයේ වාර්තාගත වැඩිවීමත් සමගම අනෙකුත් අපනයන බෝග නිෂ්පාදනයෙහි සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි. ඉහළ මිල ගණන් පැවතීම මෙම බෝග සඳහා වාසිදයක වූයේය. අනෙකුත් ක්ෂේත්‍ර බෝග අතුරින් උඳු, මුං ඇට, කව්පි සහ සෝයා බෝංචි නිෂ්පාදනය ඉහළ ගියේය. කෘෂි භාණ්ඩ සම්බන්ධ වෙළෙඳ ප්‍රතිපත්තිය 1996 දී සම්පූර්ණයෙන් ලිහිල් කිරීමෙන් පසු ඉන්දියාවෙන් සහ පකිස්ථානයෙන් කරන ලද ආනයන සමග ඉහළ නිෂ්පාදන පිරිවැයක් සහිත දේශීය නිෂ්පාදකයාට තරඟ කිරීමට නොහැකි වූ බැවින් මිරිස්, රතු ළූණු, ලොකු ළූණු සහ අර්තාපල් නිෂ්පාදනය පහළ මට්ටමකට වැටුණි.

විශේෂයෙන් මිරිදිය ධීවර අංශය වැඩිදියුණු වීම හේතුවෙන්, වර්ෂය තුළදී ධීවර නිෂ්පාදනය සියයට 8 කින් ඉහළ ගියේය. 1998 දී පශු නිෂ්පාදන අංශයද වැඩිදියුණු වීමක් පෙන්නුම් කළේය.


## පතල් සහ කැණීම්


1998 දී පතල් සහ කැණීම් අංශයෙහි පහත වැටීමක් සිදුවිය. ආසියානු අර්බුදය හේතුවෙන් මැණික් සහ වෙනත් වටිනා ගල් සඳහා ඉල්ලුම අඩුවීම, පතල් කර්මාන්තයට අහිතකර ලෙස බලපෑවේය. මැණික් අපනයනයෙන් ලද ඉපයීම් එ.ජ.ඩොලර් වටිනාකම අනුව සියයට 34 කින් අඩුවිය. ඉදිකිරීම් අංශයේ සිදුවූ වර්ධනය හේතුවෙන් කැණීම් අංශයෙහි ක්‍රියාකාරීත්වය ද යහපත් වූ අතර මෙමගින් පතල් අංශයේ සිදුවූ ඌණ වර්ධනය යම්දුරකට සමහන් කරගැනීමට හැකිවිය.


## ආර්ථික යටිතල පහසුකම්

දියුණු යටිතල පහසුකම් පද්ධතියක් නොමැතිවීම, ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රසාරණය සීමා කිරීමටත්, දේශීය භාණ්ඩවල විදේශීය තරඟකාරීත්වයට බාධා පැමිණවීමටත් හේතු වන සාධකයක් වී ඇත. උතුරු-නැගෙනහිර ප්‍රදේශවල පවත්නා යුධමය තත්ත්වය නිසා සම්පත් සීමාවීම හේතු-කොටගෙන, ප්‍රධාන ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම බොහෝදුරට සීමා කිරීමට සිදුවිය. යටිතල පහසුකම් සංවර්ධනයෙහි රාජ්‍ය ආයෝජන ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන් 1985 දී වූ සියයට 13 සිට 1997 දී සියයට 5 ක් පමණ දක්වා අඩුවිය. ඒ අනුව, ඉදිරි වර්ෂ කිහිපය තුළදී, සියයට 5 කට වැඩි ආර්ථික වර්ධන වේගයක් ළඟාකර ගැනීම සඳහා සමස්ත ආයෝජන අනුපාතිකය ප්‍රමාණවත්

**1.3 රූප සටහන**
**ඉතිරිකිරීම් හා ආයෝජන**




පරිදි වර්ධනය වී නොමැත. මෙම තත්ත්වය මනාව අවබෝධ කරගැනීම හේතුවෙන්, රාජ්‍ය ආදායමෙහි අඩුවීමක් සහ ආරක්ෂක වියදම්වල වැඩිවීමක් සිදුව තිබියදීත්, රජයේ ප්‍රාග්ධන වියදම් 1998 අයවැය වාර්තාවේ සැලසුම්කොට තිබූ පරිදිම පවත්වා ගන්නා ලදී. 1998 වර්ෂයේ රාජ්‍ය ආයෝජන ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 6.8 ක් වූ අතර 1999 දී, එය සියයට 7.5 ක් වශයෙන් ඉලක්ක කොට ඇත.

1998 වර්ෂයේදී රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයම ප්‍රධාන යටිතල පහසුකම්වල සැලකියයුතු ආයෝජනයක් සිදුකරන ලදී. විදුලිබලය, විදුලිසංදේශ සහ වරාය යන අංශවල පෞද්ගලික අංශයේ සහභාගිත්වය 1998 වර්ෂයේදී තවදුරටත් වර්ධනය විය. පුද්ගලික අංශයේ සහභාගිත්වය ඉහළයාමත්, ජපානයේ එන්ටීටී සමාගම යටතේ ලංකා ටෙලිකොම් සමාගමේ කළමනාකරණය ප්‍රතිසංවිධානය කිරීමේ හේතුවෙන් එහි කාර්යක්ෂමතාවය ඉහළයාමත් නිසා, විදුලි සංදේශ අංශය තවදුරටත් වැඩිදියුණු විය. මීට අමතරව, කුඩා විදුලි බලාගාර ගණනාවක් ඉදිකිරීම හා සම්බන්ධ පෞද්ගලික අංශයේ යෝජනා කිහිපයක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් වර්ෂය තුළදී ඇගයීමට ලක් කරන ලදී. එයාර් ලංකා සමාගමේ කොටස් හිමිකමෙන් කොටසක් එහි කළමනාකරණ වගකීමද සමග එමිරේට්ස් ගුවන් සමාගමට පැවරීම රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනෙහි වැදගත් ඉදිරි පියවරක් විය. එළිසබෙත් රැජින පාලම එ.ජ. ඩොලර් දශ ලක්ෂ 240 ක පිරිවැයකින්, 'ඉදිකිරීම, හිමිකම තබාගැනීම හා පැවරීම' (BOT) පදනම යටතේ සංවර්ධනය කිරීම සඳහා වූ මූලික ගිවිසුමක් ශ්‍රී ලංකා රජය සහ සවුත් ඒසියා ගේට්වේ ටර්මිනල් (පුද්ගලික) සමාගම අතර අත්සන් කෙරිණි.

විදුලිබල උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම හා සම්බන්ධ ආයෝජන සියයට 58 කින් තියුණු ලෙස වර්ධනය විය. නව තාප බලාගාර පිහිටුවීමත් සමග තාප විදුලිබල උත්පාදන ධාරිතාවය සියයට 4 කින් වර්ධනය වූ අතර, ඒ අනුව ජල විදුලිබලය මත ඇති රැඳියාව සියයට 69 දක්වා අඩුවිය. විදුලි සංදේශ අංශය, එහි ඉල්ලුම් වර්ධනය අභිබවා ශීඝ්‍රයෙන් වර්ධනය වූ අතර, වර්ෂ 2002 වනවිට පොරොත්තු ලේඛණයේ සිටින සියලුම දුරකථන ඉල්ලුම්කරුවන්ට දුරකථන සැපයීමට හැකිවනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, රැහැන් රහිත සහ ජංගම දුරකථනද ඇතුලත්ව, එක් දුරකථනයක් සඳහා සිටින පුද්ගලයන් සංඛ්‍යාව (දුරකතන ඝණත්වය) 1997 දී වූ 41 සිට 1998 දී 27 දක්වා අඩුවිය. ජාතික මාර්ග පද්ධතිය නඩත්තු කිරීමේ ප්‍රයත්නයන් තවදුරටත් ශක්තිමත් කරන ලදී. මාතර-කොළඹ අධිවේගී මාර්ගය, කොළඹ-කටුනායක අධිවේගී මාර්ගය සහ කොළඹ ප්‍රධාන මහා මාර්ග සම්බන්ධ කරමින් ඉදිකිරීමට නියමිත කොළඹ-පිටත වට මාවත වැනි මහා පරිමාණයේ මාර්ග ව්‍යාපෘතිවල මූලික වැඩකටයුතු 1998 දී අරඹන ලදී.

අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය මනාව අවබෝධ කරගෙන ඇති රජය, අපේක්ෂා සහගත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ 1998 දී හඳුන්වා දුන්නේය. සෞඛ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ යටතේ, සෞඛ්‍ය සේවා ව්‍යාප්ත කිරීමේ මනා සැලසුමක් සහිතව, සමාජයේ මතුවන නව සෞඛ්‍ය අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් සෞඛ්‍ය අංශයේ ප්‍රමුඛතාවයන් නැවත සකස් කරන ලදී. සෞඛ්‍ය අංශයේ මූලික ප්‍රතිසංස්කරණ 1998 වර්ෂයේදී ආරම්භ කෙරිණි. වර්තමානයේදී රජය අධ්‍යාපන සහ සෞඛ්‍ය යන අංශවල ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරයි. මෙම අංශවල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කරගැනීම සඳහාත්, රජයේ සම්පත්වල සීමිත බව නිසාත්, මෙම අංශ දෙකෙහිම පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඵලදායී ලෙස ධෛර්යවත් කළයුතුව ඇත. මේ අතර, නිවාස සහ නාගරික සංවර්ධනය

පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් නිවාස පහසුකම් සැපයීමෙහිලා පෞද්ගලික අංශය දිරිගැන්වීමේ අවශ්‍යතාවය අවධාරණය කොට ඇත.

## 1.3 ආයෝජන සහ ඉතුරුම්


දළ දේශීය ආයෝජනය ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන් 1997 දී වූ සියයට 24.3 සිට 1998 දී සියයට 25.4 දක්වා වර්ධනය වී ඇති බවට ඇස්තමේන්තු කර ඇත. මෙම වර්ධනය සම්පූර්ණයෙන්ම රාජ්‍ය ආයෝජන ඉහළයාම නිසා සිදුවූවක් විය. එහෙත්, අවිනිශ්චිත ජාත්‍යන්තර ආර්ථික වාතාවරණයක් යටතේ ඉදිරි වසර දෙකක පමණ කාලය තුළ ශීඝ්‍ර ආර්ථික ප්‍රසාරණයක් පිළිබඳ අපේක්ෂා තැබිය නොහැකි තත්ත්වයක් පැවතියදීත්, පෞද්ගලික අංශයේ ආයෝජන ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 18.5 ක් ලෙස පසුගිය වර්ෂයේ පැවැති මට්ටමේම පවත්වා ගැනීමට හැකිවීම ඉතා වැදගත්ය. නව ආයෝජන, බොහෝදුරට යටිතල පහසුකම් සැපයීමේ යෝජනා ක්‍රම සහ නිමැවුම් කර්මාන්තවල ප්‍රසාරණය යන අංශ කෙරෙහි යෙදවිනි. පසුගිය සිව් වසර තුළදී පෞද්ගලික ආයෝජන ක්‍රමයෙන් වැඩිවුවද, එය ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සැලකියයුතු පරිදි වැඩිකිරීම සඳහා ප්‍රමාණවත් නොවීය.


ශ්‍රී ලංකාවේ දළ දේශීය ඉතුරුම් අනුපාතිකය 1997 දී වූ සියයට 17.3 සිට 1998 දී සියයට 18.9 දක්වා වැඩිවිය. දළ ජාතික ඉතුරුම් අනුපාතිකයද, ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 21.5 සිට සියයට 23.2 දක්වා වැඩිවිය. ඉතුරුම්වල වර්ධනයට ඒකපුද්ගල ආදායම වර්ධනය වීමත්, මූර්ත පොලී අනුපාතිකය ධන අගයක් ගැනීමත් ප්‍රධාන වශයෙන් හේතුවී ඇත. 1998 වර්ෂයේ දෙවන භාගයේදී උද්ධමනය පහත වැටීමත්, නාමික පොලී අනුපාතිකයන් සියයට දෙකකින් පමණ ඉහළ යාමත් නිසා, රාජ්‍ය ණය උපකරණවල ආයෝජනය කරන්නන්ගේ මූර්ත පොලී අනුපාතිකය වඩාත් ධන අගයක් ගනු ලැබීය. වාණිජ බැංකුවල තැන්පතු අනුපාතිකය 1997 දී වූ සියයට 10 සිට 1998 දී සියයට 9.2 දක්වා අඩු වුවද, 1998 අගෝස්තු මාසයේ සිට ලක්ෂ්‍යමය උද්ධමන අනුපාතිකය සියයට 6 කට වඩා අඩු මට්ටමක පැවතීම නිසා බැංකු තැන්පතු සඳහා වූ මූර්ත පොලිය ද වඩාත් ධන අගයක් ගනු ලැබීය. පසුගිය දෙවර්ෂය පුරාම ආන්තික ඉතුරුම් අනුපාතිකය සියයට 30 ක් වශයෙන් නොවෙනස්ව පැවැතිණි. ඉතිරිකිරීම් ක්‍රමයෙන් ඉහළයාම දිරිගන්වනසුළු ලක්ෂණයකි. ඉහළ මට්ටමක ආයෝජන, තමන්ගේම සම්පත් මගින් මූල්‍යකරණය කිරීමට රට තුළ වර්ධනය වෙමින් පවත්නා හැකියාව මෙමගින් පිළිඹිබු කිරීමයි. කෙසේ වෙතත්, ඉතිරිකිරීම්වල සිදුවන වර්ධනය හා සැසඳීමේදී ආයෝජන වර්ධනය මන්දගාමීව සිදුවීම අවධානයට ලක්වියයුතු කරුණක්ව පවතී.

## 1.4 මිල

1998 දී උද්ධමනයෙහි අඩුවීම, සියලුම මිල දර්ශක මගින් පිළිබිඹු කෙරිණි. පාරිභෝගික භාණ්ඩ මිල ගණන් 1998 දී සියයට 6.9-9.4 අතර ප්‍රමාණයකින් වැඩිවූ අතර එය 1997 දී සියයට 7.1-9.6 අතර ප්‍රමාණයකින් වැඩිවිය. ප්‍රාථමික වෙළෙඳපොළ මට්ටමේ මිල ගණන් හැසිරීම පෙන්නුම් කරන තොග වෙළෙඳ මිල දර්ශකය, 1997 දී වූ සියයට 6.9 ක වර්ධනයට සාපේක්ෂව 1998 දී සියයට 6.1 ක වැඩිවීමක් පිළිබිඹු කළේය. ආර්ථිකයේ සියළුම භාණ්ඩ මිල ගණන්වල වෙනස්වීම පිළිබිඹු කරන වඩාත් පුළුල් මිල දර්ශකයක් වන ද.දේ.නි. අවධමනකය, 1997 දී වූ සියයට 8.6 සිට 1998 දී සියයට 8.4 දක්වා අඩුවිය.

**1.4 රූප සටහන**
**මිල වෙනස්වීම්**







වර්ෂයේ දෙවන භාගයේදී මිල ගණන් වැඩිවීමේ වේගය වඩාත් කැපී පෙනෙන ලෙස පහත වැටිණි. 1998 අගෝස්තු මාසයෙන් පසු පාරිභෝගික මිල උද්ධමනය සියයට 6 ට වඩා අඩු මට්ටමක පැවැතිණි. වර්ෂයේ දෙවන භාගයේදී මිල ගණන් ඉහළයාමේ වේගය අඩු මට්ටමක තිබියදීත්, ආහාර ද්‍රව්‍ය මිල ගණන් අඛණ්ඩව ඉහළ මට්ටමක තිබිණි. ආහාර ද්‍රව්‍ය මිල ගණන් සියයට 8-10 ත් අතර ප්‍රමාණයකින් වැඩි වූ අතර, එය 1998 පාරිභෝගික මිල ගණන් වැඩිවීමේ ප්‍රමාණයෙන් සියයට 80 කට පමණ දායක විය. කෙසේ වෙතත්, වර්ෂය අවසානය වනවිට, ආහාර ද්‍රව්‍ය මිල වැඩිවීමේ වේගය සියයට 2-4 දක්වා අඩු වූ අතර ඊට, යල සහ මහ කන්නවල සතුටුදායක වී අස්වැන්නක් ලැබීම ඇතුළුව දේශීය ආහාර සැපයුම ඉහළ යාමත්, ආනයනික ආහාර ද්‍රව්‍ය සැපයුම ඉහළ යාමත් හේතුවිය. 1997 සැප්තැම්බර් මාසයේදී විදුලිබල ගාස්තු සංශෝධනය කිරීමේ වක්‍ර බලපෑම 1998 දී දැඩි ලෙස දනෙන්නට විය. රෙදිපිළි, පාවහන්, විදුලි සංදේශ සහ සෞඛ්‍ය යන සේවාවල මිල ගණන් ඉහළ යාමේ වේගය සැලකිය යුතු පරිදි අඩු වූ අතර ඊට ප්‍රධාන වශයෙන් එම අංශවල ක්‍රියාකාරිත්වය වැඩිදියුණුවීම හේතු වී ඇත. 1998 අප්‍රේල් මාසයේ සිට, පිරිවැටුම් බද්ද වෙනුවට භාණ්ඩ හා සේවා බද්ද හඳුන්වා දීම, පාරිභෝගික මිල ගණන් සියයට 2-3 ත් අතර ප්‍රමාණයකින් වැඩිවීමට තුඩුදුන් අතර, එය ප්‍රධාන වශයෙන් සමහර වෙළෙඳ ආයතන විසින් එතෙක් ගෙවන ලද පිරිවැටුම් බදු වෙනුවෙන් සුදුසු පරිදි ගැලපීම් කිරීමකින් තොරව භාණ්ඩ මිල වැඩිකිරීම නිසා සිදුවිය.

## 1.5 වැටුප්

වර්ෂ කිහිපයක් තිස්සේ වාර්තා වූ අඩු වර්ධන වේගයකට පසුව 1998 දී, රාජ්‍ය අංශය ඇතුළු බොහෝ අංශවල නාමික සහ මූර්ත වැටුප් සැලකියයුතු පරිදි වැඩිවිය. වැටුප් සමාලෝචන කමිටුවේ නිර්දේශ අනුව, වැටුප් වැඩිකිරීමේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීමත් සමග රාජ්‍ය සේවකයන්ගේ නාමික වැටුප් දර්ශකය 1998 දී සියයට 10.5 කින් වැඩිවිය. පඩිපාලක සහා රාශියකට අදළ වන

**1.5 රූප සටහන**
**වැටුප් අනුපාතික දර්ශක (1991-100)**




අවම වැටුප්වල ඉහළ දැමීමේ ප්‍රතිඵලයක් වශයෙන්, සංවිධිත අංශයේ බොහෝ කාණ්ඩවලට අයත් සේවකයන්ගේ වැටුප් සැලකියයුතු පරිදි වැඩිවීමක් දක්නට ලැබිණි. 1998 ජනවාරි මස සිට ක්‍රියාත්මක වන පරිදි, සාමූහික ගිවිසුම් මගින් ආවරණය වන තේ වතුවල සේවකයන්ගේ දෛනික වැටුප රුපියල් 83 සිට 95 දක්වා වැඩිකළ අතර, තේ මිල ගණන් යම් මට්ටමකට වඩා වැඩිවන අවස්ථාවලදී පමණක් දිනකට රුපියල් 6 ක විශේෂ දීමනාවක් ගෙවීමටද තීරණය විය. මෙම දීමනාව ගෙවීම පිළිබඳව සෑම මාස 18 කටම වරක් සමාලෝචනය කෙරේ. මෙම ගිවිසුම මගින් ආවරණය වන රබර් වතුවල සේවකයන්ටද රබර් මිල මත පදනම් වූ අතිරේක දීමනාවක් ගෙවනු ලබන අතර, එම ප්‍රමාණය රබර් කිලෝ එකක මිල රුපියල් 65 ඉක්මවන සෑම රුපියලක් සඳහාම සත 30 ක් වේ. වෙනත් පඩි පාලක සභා 19 ක් යටතට වැටෙන සේවකයන්ගේ අවම වැටුප්ද වැඩි කරන ලදී. මේ අනුව, පඩිපාලක සභා වලින් ආවරණය වන සේවකයන්ගේ අවම වැටුප් අනුපාත දර්ශකය 1998 දී සියයට 12 කින් වැඩිවිය.

කුඩා පරිමාණ ඉදිකිරීම් අංශයේ සේවය කරනු ලබන වඩුවන්, පෙදරේරුවන් සහ කුඩා පරිමාණ කෘෂිකාර්මික අංශයේ (තේ, රබර් සහ වී වගාව) සේවකයන්ගෙන් සමන්විත අසංවිධිත අංශයේ සේවකයන්ගේ වැටුප් සියයට 7-15 අතර ප්‍රමාණයකින් වැඩිවූ අතර, රබර් මිල ගණන් අඩුවීම නිසා කුඩා රබර් වතු සේවකයන්ගේ නාමික වැටුප අඩුවිය.

## 1.6 සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය

1998 දී සේවා වියුක්ති අනුපාතිකය තවදුරටත් පහළ වැටුණි. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ශ්‍රම බලකාය පිළිබඳ කාර්තුමය සමීක්ෂණයට අනුව, සේවාවියුක්තිය 1990 මුල් භාගයේදී වූ සියයට 16 සිට 1998 තුන්වැනි කාර්තුව වනවිට සියයට 9.1 දක්වා පහත වැටුණි. එහෙත්, සේවා වියුක්තිය පිළිබඳව අතීත දත්ත හා මෑතකාලීන දත්ත සෘජුවම සැසඳිය නොහැකිය. ඊට හේතුව, ගෙවීමක් නොලබන පවුලේ ශ්‍රමිකයන්ද සේවා නියුක්ති පුද්ගලයන් ලෙස ඇතුලත් වන පරිදි සමීක්ෂණයේ ආවරණය මෑත කාලයේදී වැඩිදියුණු කර තිබීමය. ගෙවීමක් නොකරන පවුලේ ශ්‍රමිකයන් ඉවත් කළහොත් සේවාවියුක්ති අනුපාතිකය සියයට 10.3 ක් පමණ වියහැකි අතර, එමගින්ද සේවා වියුක්තියෙහි පහළ බැසීමේ උපනතිය තවදුරටත් තහවුරු වේ. නිෂ්පාදන කර්මාන්ත, ඉදිකිරීම්, වෙළෙඳම, හෝටල්, රක්ෂණය, දේපල වෙළඳම සහ පෞද්ගලික සේවා සපයන අංශ රැකියා උත්පාදනයේ ප්‍රධාන අංශ විය. 1998 අලුතින් ආරම්භ කරන ලද ව්‍යාපෘති 137 ක් ද ඇතුළුව, ආයෝජන මණ්ඩලය යටතට ගැනෙන ආයතන වර්ෂය තුළදී නව රැකියා අවස්ථා 36,000 ක් පමණ උත්පාදනය කර ඇත. මෙය, 1997 දී මෙම අංශයේ උත්පාදනය වූ රැකියා 16,000 සමග සසඳ බලන විට විශාල වැඩි වීමකි. රාජ්‍ය අංශය මගින් උත්පාදනය කරන ලද නව රැකියා සංඛ්‍යාව 19,000 ක් පමණ වේ යැයි ඇස්තමේන්තු කර ඇත. 1997 තුන්වැනි කාර්තුව අවසානය සමග සසඳ බලන කළ, 1998 තුන්වැනි

කාර්තුව අවසානයේදී නිෂ්පාදන කර්මාන්ත අංශය නව රැකියා 27,000 ක් පමණ උත්පාදනය කර ඇත. 1997 ට වඩා වේගයෙන් වර්ධනය වූ ඉදිකිරීම් අංශය 1998 දී නව රැකියා 5,400 ක් පමණ උත්පාදනය කර තිබේ. 1998 රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙන් සියයට 9 ක් පමණ තාවකාලික සේවකයන් විය. දශ ලක්ෂ 2.4 ක් පමණ වේයැයි ඇස්තමේන්තු කර ඇති කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිය, මුළු සේවා නියුක්තියෙන් සියයට 38 පමණ නියෝජනය කරයි. සියයට 15 ට මඳක් වැඩි ප්‍රමාණයක් කාර්මික අංශයෙහිද, ඉතිරි සියයට 47 සේවා අංශයෙහිද විය. රාජ්‍ය අංශයෙහි සේවානියුක්තියෙහි දායකත්වය, 1993 දී වූ සියයට 25 සිට 1998 දී සියයට 18 දක්වා පහත වැටෙමින් පැවතිණි.

## 1.7 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ අයවැය කටයුතු

පසුගිය වර්ෂ දෙකෙහි සාර්ථක ලෙස සිදුකළ අයවැය පරතරය අඩු කිරීම, 1998 දී තවදුරටත් පවත්වාගත නොහැකි විය. 1998 අයවැයෙහි ඉලක්කය වූයේ වර්තන ගිණුමෙහි අතිරික්තයක් ජනනය කර ගනිමින් සමස්ත අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස සියයට 6.5 දක්වා අඩු කර ගැනීමයි. කෙසේ වුවද, බදු ආදායමේ මන්දගාමී වර්ධනය සහ ආරක්ෂක කටයුතු වැනි අංශයන්හි වියදම් අධික ලෙස වැඩි වීම, වර්තන ගිණුමේ සහ සමස්ත අයවැය කටයුතුවල විශාල හිඟයන් ඇති කරලීමට හේතුවිය. වර්තන ගිණුමේ හිඟය, දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස 1997 දී වූ සියයට 2.2 සිට 1998 දී 2.4 දක්වා වැඩි වූ අතර, සමස්ත අයවැය හිඟය (ප්‍රදානයන්ට සහ පුද්ගලීකරණ ලැබීම්වලට පෙර) 1997 පැවැති සියයට 7.9 සිට 1998 දී සියයට 9.2 දක්වා වැඩි විය. මූලික අයවැය හිඟය එනම්, පොලී ගෙවීම් හැර අයවැය හිඟය, 1997 දී වූ සියයට 1.7 සිට 1998 දී සියයට 3.8 දක්වා වැඩි විය. පසුගිය කාලයේ වර්තන ගිණුමේ විශාල හිඟය මත ප්‍රාග්ධන වියදම් කපා දැමීම සිදු වුවද, යටිතල පහසුකම්වල ඌණතාවන් අඩු කරලීම සඳහා 1998 දී රජයේ ආයෝජන, අයවැයෙන් අපේක්ෂිත පරිදි සැළකිය යුතු ලෙස වැඩි විය. මේ අනුව 1998 සමස්ථ අයවැය හිඟයෙහි විශාල වැඩිවීමට රාජ්‍ය ආයෝජන වර්ධනයද යම්තාක් දුරට බලපෑවේය.

**1.4 සංඛ්‍යා සටහන**


**රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරිත්වයේ සාරාංශය**


| ශීර්ෂය | (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1980 | 1985 | 1990 | 1994 | 1995 | 1996 | 1997 | 1998(අ) |
| 1. මුළු ආදයම | 19.6 | 22.3 | 21.1 | 19.0 | 20.4 | 19.0 | 18.5 | 17.3 |
| 2. වියදම සහ ශුද්ධ ණයදීම් | 41.8 | 34.1 | 31.0 | 29.5 | 30.5 | 28.5 | 26.4 | 26.4 |
| 2.1 වර්තන වියදම | 18.5 | 20.1 | 22.3 | 21.9 | 23.1 | 22.8 | 20.7 | 19.7 |
| 2.1.1 ආරක්ෂක | 1.3 | 4.5 | 4.1 | 4.6 | 6.5 | 5.8 | 5.1 | 5.0 |
| 2.1.2 පොලී | 3.4 | 4.6 | 6.4 | 6.6 | 5.7 | 6.4 | 6.2 | 5.4 |
| 2.1.3 වැටුප් (ආ) | 4.5 | 3.6 | 3.9 | 3.1 | 3.4 | 3.3 | 3.1 | 3.0 |
| 2.1.4 සහනාධාර හා සංක්‍රාම | 8.4 | 5.5 | 6.5 | 5.9 | 6.1 | 6.0 | 5.1 | 4.6 |
| 2.1.5 අනෙකුත් | 0.9 | 1.9 | 1.4 | 1.8 | 1.4 | 1.3 | 1.3 | 1.6 |
| 2.2 ප්‍රාග්ධන හා ශුද්ධ ණයදීම් | 23.3 | 13.9 | 8.7 | 7.5 | 7.4 | 5.7 | 5.7 | 6.8 |
| 2.2.1 රාජ්‍ය ආයෝජන | 18.5 | 13.8 | 8.3 | 7.0 | 7.9 | 6.0 | 5.8 | 6.7 |
| මූර්ත වත්කම් අත්පත් කර ගැනීම් | 7.9 | 4.5 | 3.7 | 2.9 | 3.4 | 2.7 | 2.9 | 3.2 |
| ප්‍රාග්ධන සංක්‍රාම | 9.4 | 8.6 | 2.3 | 2.4 | 2.9 | 2.2 | 2.1 | 2.2 |
| ණයදීම් | 1.2 | 0.6 | 2.2 | 1.7 | 1.7 | 1.1 | 0.8 | 1.4 |
| 2.2.2 අනෙකුත් | 4.7 | 0.2 | 0.4 | 0.6 | -0.5 | -0.3 | -0.1 | 0.0 |
| ප්‍රතිව්‍යුහගත කිරීමේ වියදම් | 0.0 | 0.0 | 0.0 | 0.6 | 0.5 | 0.0 | 0.2 | 0.4 |
| අනෙකුත් | 4.7 | 0.2 | 0.4 | -0.1 | -1.0 | -0.3 | -0.3 | -0.3 |
| 3. ජංගම ගිණුමේ ශේෂය | 1.1 | 2.2 | -1.2 | -2.9 | -2.7 | -3.8 | -2.2 | -2.4 |
| 4. ප්‍රදානයන් හා පෞද්ගලීකරණ ලැබීම් හැර සමස්ත හිඟය | -22.2 | -11.7 | -9.9 | -10.5 | -10.1 | -9.4 | -7.9 | -9.2 |
| 5. හිඟය පියවීම | 22.2 | 11.7 | 9.9 | 10.5 | 10.1 | 9.4 | 7.9 | 9.2 |
| 5.1 විදේශ ණය | 9.2 | 6.4 | 5.7 | 3.5 | 4.5 | 2.3 | 1.9 | 1.7 |
| 5.1.1 ණය | 5.3 | 4.4 | 3.6 | 2.0 | 3.2 | 1.3 | 1.1 | 1.0 |
| 5.1.2 ප්‍රදනයන් | 3.9 | 2.0 | 2.1 | 1.4 | 1.4 | 1.0 | 0.8 | 0.7 |
| 5.2 දේශීය ණය | 13.0 | 5.3 | 4.2 | 6.5 | 5.1 | 6.5 | 3.4 | 7.0 |
| 5.2.1 බැංකු | 9.8 | 2.9 | 0.1 | 0.2 | 1.1 | 1.7 | -0.2 | 1.9 |
| 5.3 පෞද්ගලීකරණ ලැබීම් | 0.0 | 0.0 | 0.0 | 0.5 | 0.4 | 0.6 | 2.5 | 0.4 |
| සටහන : | | | | | | | | |
| මුළු වැටුප් වියදම | 5.0 | 4.2 | 4.9 | 5.1 | 5.2 | 5.0 | 5.0 | 5.3 |
| දළ ආරක්ෂක වියදම (ඇ) | 1.3 | 4.5 | 4.1 | 4.6 | 6.5 | 6.0 | 5.4 | 5.6 |


(අ) තාවකාලික
(ආ) ආරක්ෂක සේවා කාර්‍ය මණ්ඩල ගෙවීම් හැර
(ඇ) කල් දමන ලද ගෙවීම් පියවීමද ඇතුළුව

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

### 1.6 රූප සටහන
### සමස්ත රාජ්‍ය මූල්‍ය තිරීක්ෂණ




ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශයේ ආයෝජන වැඩි-කිරීම සඳහා ලබාදුන් බදු නිදහස් කිරීම් හා බදු සහනයන් හේතුවෙන් දළ ජාතික නිෂ්පාදනයේ වර්ධනයට අනුරූපීව බදු ආදායම වර්ධනය වැඩිවීම 1998 දී තවදුරටත් අඩු විය. මීට අමතරව, සංක්‍රාන්තික අවස්ථාවේ ඇතිවන ගැටළු හේතුවෙන් භාණ්ඩ හා සේවා බද්ද (භා.සේ.බ.) මගින් බලාපොරොත්තු වූ ආදයම ලබා ගැනීමට නොහැකි විය. තවද, භා.සේ. බදු අනුපාතිකය වූ සියයට 12.5, ඇස්තමේන්තු ගත ආදයම් පහල නොයන බදු අනුපාතිකය (අන්‍යොන්‍ය වශයෙන් පිරිවැටුම් බදු වෙනුවට යෙදවූ) වන සියයට 17 ට වඩා පහත මට්ටමක පැවතුනි. මුළු බදු එකතු කිරීම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1997 දී වූ සියයට 16 සිට 1998 දී සියයට 14.5 දක්වා අඩු විය. තීරුබදු නිදහස් කිරීම් හා තීරුබදු සහන සහ ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයනයන්ගේ මිල පහත වැටීම පිළිබිඹු කරමින් ආනයන වටිනාකම් පහත වැටීම නිසා ආනයන මත තීරුබදු අඩුවිය. රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් අමතර ලාභාංශ පැවරුම්, වතු සමාගම් වලින් ලැබුණු බදු කුලිය වැඩිවීම සහ අතිකුත් බදු නොවන ආදයම් වන පොලී, විශේෂ අයකිරීම් සහ ලාභාංශ නියමිත වේලාවට ලැබීම නිසා බදු නොවන ආදයම සැලකියයුතු ලෙස ඉහළ ගියේය. එමගින්, බදු ආදයමේ මන්දගාමී වර්ධනය නිසා රජයේ ආදයමේ පහත වැටීම යම් ප්‍රමාණයකට සමනය කළ හැකිවිය. මුළු ආදයම, 1997 දී වූ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 18.5 සිට 1998 දී 17.3 දක්වා අඩුවිය. මෙම ආදයමෙහි පහත වැටීම ඇස්තමේන්තුගත හිඟයට වඩා නියම හිඟයෙහි වූ වැඩි වීමෙන් සියයට 44 කට වගකිව යුතුවිය.

පොලී වියදම් හා කුටුම්බයන්ට කරන ලද සහනාධාර ගෙවීම් අඩුවීම නිසා වර්තන වියදම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 19.7 ක පවත්වා ගැනීමට හැකිවුනු අතර එය 1997 පැවති සියයට 20.8 සිට පහත වැටීමකි. පොලී ගෙවීම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 6.2 සිට 1998 දී සියයට 5.4 දක්වා අඩු වූ අතර මින් පිළිබිඹු වූයේ 1997 දී පුද්ගලීකරණ ලැබීම් මගින් රාජ්‍ය ණය වලින් කොටසක් ගෙවා නිදහස් කිරීමත් ඇතුළත්ව, පසුගිය වර්ෂ දෙක තුළදී රාජ්‍ය මූල්‍ය අංශයේ සිදු වූ ප්‍රගතියයි. කුටුම්භයන්ට පැවරීම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1997 දී වූ සියයට 4.1 සිට 1998 දී සියයට 3.7 දක්වා අඩු විය. කෙසේ වෙතත්, වැටුප් සඳහා දැරූ වියදම 1997 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5 සිට 1998 දී සියයට 5.3 දක්වා වැඩි විය. මෙය රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව වැඩි වීම මෙන්ම, වර්ෂය තුළ වැටුප් වැඩි වීම නිසා ද සිදු විය. මුළු ආරක්ෂක වියදම, ආරක්ෂක උපකරණ සඳහා කරන ලද ගෙවීම්ද ඇතුළත්ව 1997 දී වූ රුපියල් දශ ලක්‍ෂ 47,718 (දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5.4) සිට 1998 දී රුපියල් දශ ලක්‍ෂ 56,390 (දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5.6) දක්වා වැඩි වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

1998 දී රාජ්‍ය ආයෝජනය (දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6.7) 1998 අයවැයෙන් ඉලක්කගත ප්‍රමාණය වූ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6.9 ට ආසන්න විය. 1995 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7.9 සිට 1997 දී සියයට 5.8 දක්වා වූ පහත වැටීම හා සැලකීමේදී මෙය කැපීපෙනෙන වර්ධනයකි. 1998 දී විදේශීය ආධාර උපයෝජනය වැඩි වීම නිසා රාජ්‍ය ආයෝජනයන්හි ඉහළ වර්ධනයක් ඇතිවිය. රජය සිය ආයෝජන වැඩසටහන පවත්වාගෙන යාමට ඇපකැප වීම නිසා ඉකුත් වසරවලදී මෙන් නොව, අවශ්‍ය රුපියල් සම්පත් ප්‍රමාණය ඉතා කඩිනමින් ලබාදී ඇත. ප්‍රාග්ධන වියදම්, ප්‍රධාන වශයෙන් බලශක්ති, ප්‍රවාහනය, විදුලි සංදේශ, වරාය සහ ජලසම්පාදන සහ ජලාපවාහන යන වැදගත් අංශවලට යොමු වී ඇත.

මෙම අංශයන්හි ආයෝජන කැපීපෙනෙන ලෙස සියයට 55 කින් වැඩි වූ අතර, එය මුළු රාජ්‍ය ආයෝජනයෙන් සියයට 66 ක් විය. ලෝක වෙළෙඳපළෙහි පැවැති අවපාත තත්ත්වය හේතුකොට ගෙන පෞද්ගලික ආයෝජනයන් වඩාත් අඩු මට්ටමක පැවතීම නිසා රාජ්‍ය ආයෝජනයන්ගේ වර්ධනය වඩාත් වැදගත් වේ. මෙය ඉදිරි වසරවල සමස්ත ආර්ථික වර්ධනය කෙරෙහි වඩාත් ඵලදායි අයුරින් බලපානු ඇත.

1998 අයවැය හිඟය පියවීම සඳහා ශුද්ධ විදේශීය සම්පත් මගින් සහ රාජ්‍ය ආයතනවල කොටස් විකිණීමෙන් ලත් ලැබීම් යොදා ගත් අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2 ක් විය. ද.දේ.නි. යෙන් සියයට 7 කට සමාන ඉතිරි කොටස දේශීය ණය ගැනීම් මගින් පියවා ගැනීමට සිදුවිය. රජයේ දේශීය සම්පත් අවශ්‍යතාවය වැඩිවීම හේතුවෙන්, බැංකු අංශයෙන් ණය ගැනීම් සැලකියයුතු ලෙස ඉහළ ගිය අතර, මෙයට කෙටිකාලීන ණයක් වූ විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක (FCBUs) මගින් ලබා ගත් ඇ.එ.ජ. ඩොලර් දශ ලක්ෂ 100 ත් අයත් විය. සාමාන්‍යයෙන් මෙබඳු අධික ලෙස බැංකු ණය ගැනීම් මගින් පොලී අනුපාතික කෙරේ දැඩි පීඩනයක් ඇති විය හැක. කෙසේ වුවද, පුද්ගලික අංශයට දෙනු ලබන ණය අඩු වීම හේතුවෙන් බැංකු ක්‍රමය තුළ අමතර සම්පත් ඉතිරි වූ අතර, එමගින් මූල්‍ය ප්‍රසාරණය මධ්‍යස්ත වී තියුණු ලෙස පොලී අනුපාතික ඉහළ යාමද වැළකිනි. 1997 දී වූ ආපසු ගෙවීම් රුපියල් දශලක්ෂ 13,991 ට සාපේක්ෂව 1998 දී මහ බැංකු මූලාශ්‍ර මගින් පියවූ අයවැය හිඟය රුපියල් දශලක්ෂ 5,609 කින් වැඩිවිය.

සමස්ත අයවැය හිඟය හා සලකා බලන කළ 1998 රාජ්‍ය මූල්‍ය අංශයේ කටයුතුවල පසුබෑමක් දිස් වුවද, බදු ක්‍රමයේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ සහ ණය කළමණාකරණයෙහි තවදුරටත් ප්‍රගතියක් දක්නට ලැබිණි.

බදු ව්‍යුහය සරල කිරීම, බදු පදනම වර්ධනය කිරීම සහ බදු ක්‍රමයේ පාරදෘශ්‍ය භාවය ඉහළ නැංවීම අරමුණු කරගෙන බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණයන් 1998 වර්ෂයේදී තවදුරටත් ක්‍රියාත්මක විය. 1998 අප්‍රේල් 1 වන දින සිට පිරිවැටුම් බදු වෙනුවට භාණ්ඩ හා සේවා බද්ද (භා.සේ.බ.) හඳුන්වා දීම බදු ක්‍රමයේ ප්‍රධාන ව්‍යුහාත්මක වෙනස්කමක් විය. පිරිවැටුම් බදු ක්‍රමය යටතේ සිදු වූ බදු මත බදු පැනවීම, භාණ්ඩ හා සේවා බද්ද මගින් ඉවත් කළ අතර, බදු අනුකූලතාවය වර්ධනය වී පාරදෘශ්‍ය භාවයද වැඩි දියුණු විය. භා.සේ.බ. යටතේ සියලුම අපනයනයන් ශුන්‍ය බදු අනුපාතිකයක් යටතේ වූ අතර දේශීය පාරිභෝජනය බදුවලට යටත් වේ. සකස් නොකල කෘෂිකාර්මික නිෂ්පාදන පොදු ප්‍රවාහනය, පොහොර, සිමෙන්ති, ඖෂධ වර්ග සහ වඩාත් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය යනාදිය භා.සේ. බද්දෙන් නිදහස් කර ඇත. අපනයන සකස් කිරීම පිණිස වූ ආනයනයන්, පිරිවැටුම් බදු යටතේ නිදහස් කල අතර ඒවා භා.සේ. බදු ක්‍රමය යටතට ගැනින. මූල්‍ය සේවා, පිරිවැටුම් බදු ක්‍රමය යටතේ අඛණ්ඩව පැවතුන ද, පෙර පැවති සියයට 2 හා සැසඳීමේදී එය සියයට 1 වැනි අඩු අනුපාතයක පැවතින. බොහෝ රටවල් භාණ්ඩ හා සේවා බද්ද හඳුන්වා දීමේදී සැලසුම් කර තිබුනේ ආදායම පවත්නා මට්ටමට වඩා අඩු නොවී තබා ගැනීමට හෝ ආදායම වැඩි කර තබා ගැනීමටය. කෙසේ වෙතත් ශ්‍රී ලංකාව, ආදායම වෙනස් නොවී පවතින බදු අනුපාතිකයට වඩා අඩු අනුපාතිකයක් (සියයට 12.5 ක) හඳුන්වාදුන් රටවල් අතරින් එක් රටකි. ආදායම අඩු නොවී පවතින බදු අනුපාතිකය සියයට 17 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. 1999 අප්‍රේල් වනවිට පූර්ණ වසරක් සම්පූර්ණ වුවද, 1998 දී භා.සේ. බද්දෙන් ප්‍රමාණවත් ආදායමක් උපයා නොගත් බව 1998 වසරෙහි දත්ත මගින් සනිටුහන් විය. මෙයට ආරම්භක අවස්ථාවේදී පවතින සංක්‍රාන්තිමය ගැටළු සහ භා.සේ.බ. අඩු අනුපාතයක පැවතීම ද හේතුවිය. බදු ක්‍රමය මගින් රැස්කල ආදායම දළ දේශීය නිෂ්පාදිතය අනුකූලව වැඩි නොවීමට මෙය ප්‍රධාන හේතුවක් විය. ද.දේ.නි. හි අනුපාතයක් ලෙස බදු ආදායම 1997 දී වූ සියයට 16 සිට 1998 දී සියයට 14.5 දක්වා පහත වැටුණි.

තීරු බදු අනුපාතිකයන්, අනු කාණ්ඩ 3 කින් යුත් තීරු බදු ව්‍යුහය වූ සියයට 10, 20 සහ 35 සිට සියයට 5, 10 සහ 30 දක්වා අඩු කරන ලදී. සියලුම කාර්මික අමු ද්‍රව්‍යයන් සහ ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය නොකරනු ලබන යන්ත්‍රෝපකරණ ආනයනයන් සියයට 5 තීරු බදු අනුපාතිකය යටතට ගැනුන අතර, ප්‍රවාහන, විදුලි සංදේශ සහ වෛද්‍ය උපකරණ ආනයනයන් ශුන්‍ය බදු අනුපාතයන් යටතේ වර්ගීකරණය කරනු ලැබීය. මෝටර් කාර් සහ ජීප් රථ සඳහා බදු සියයට 50-100 සිට සියයට 30 දක්වා අඩු කල අතර, මෙම අඩු කිරීම හේතුවෙන් ආදායමේ අඩු වීම පියවා ගැනීමට සියලුම ආනයනික වාහන සඳහා සියයට 10 ක අමතර නිෂ්පාදන බද්දක් (විශේෂ විධිවිධාන යටතේ) අය කරන ලදී. දේශීය කෘෂිකාර්මික අංශය ආරක්ෂා කිරීමේ අදහසින්, කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා සියයට 35 ක බද්ද නොවෙනස්ව පැවති අතර සමහර ආනයනයන් සඳහා සියයට 20 ක බදු අනුපාතිකයක් අඛණ්ඩව පැවතින. මෙම සංශෝධනයන්ට පසු, ශ්‍රී ලංකාවේ දනට අගයන් 5 කින් යුක්ත තීරු බදු අනුපාතිකයක් ක්‍රියාත්මක වේ. තීරු බදු සඳහා ජනාධිපති කොමිසම් වාර්තාවේ නිර්දේශ අනුව වර්ෂ 2000 දී තීරු බදු ව්‍යුහය අනුකාණ්ඩ 2 කින් යුක්තව පවත්වාගෙන යාමට බලාපොරොත්තු වේ. 1998 දී රාජ්‍ය මූල්‍ය කටයුතු හා අදාළ වූ අනෙකුත් ප්‍රධාන ප්‍රතිපත්ති වෙනස්වීම් අතර රෙදිපිළි ආනයනය ලිහිල් කිරීම සහ අනතුරුව රෙදිපිළි අංශයේ ණය වගකීම් රජය භාර ගැනීම සහ නිෂ්පාදකයන් හට උපකාරී වන පරිදි රෙදිපිළි නිෂ්පාදකයින්ගේ ණය ආපසු අය කර ගැනීම සඳහා අරමුදලක් (Textile Debt Recovery Fund) පිහිටුවීම, ඇඟළුම් සඳහා සියයට 10 ක තීරු බද්දක් ස්ථාපිත කිරීම යනාදිය වැදගත් වේ. මීට අමතරව, සංවර්ධන සහ පර්යේෂණවලට, අයහපත් තත්ත්වයනට ගොදුරු වියහැකි කණ්ඩායම්වලට, තෝරා ගත් ප්‍රමුඛතා අංශයන්ට සහ ප්‍රාදේශීය කාර්මීකරණට සහාය පිණිස විවිධ අයුරින් ආධාර දෙන වැඩපිළිවෙල හඳුන්වා දෙන ලදී.

1997 අයවැය මගින් සාමූහික ලාභ මත බදු සහ උපරිම පෞද්ගලික ආදායම් බදු අනුපාතය සියයට 35 සිට 1998 දී සියයට 30 දක්වාද, 1999 දී එය සියයට 25

දක්වාද අඩු කරන බව ප්‍රකාශයට පත් කරන ලදී. කෙසේ වෙතත්, 1998 දී එමගින් ආදායමට ඇතිවිය හැකි බලපෑම සලකා මෙම යෝජනාව 1998 දී ක්‍රියාත්මක නොකරන ලදී. ඒ වෙනුවට, තෝරා ගත් ප්‍රමුඛ අංශයන්ට ආදයම් බදු සහන සලසා දී තිබුණි. එලෙසම කෘෂිකාර්මික, ධීවර, පශු සම්පත් සහ සංචාරක ආයතන සඳහා සාමූහික බදු අනුපාතිකය සියයට 15 දක්වා අඩු කරන ලදී. නිෂ්පාදන බදු, මත්පැන් සඳහා සියයට 10 කින්ද, පෙට්‍රල් සඳහා සියයට 25 සිට සියයට 50 දක්වාද වැඩි කරන ලදී. 1998 දී මූල්‍ය වෙළෙඳපොළ ගණුදෙනුවල පිරිවැය අඩු කිරීම සහ රජයේ සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළෙඳපොළ දියුණු කිරීම සඳහා ප්‍රති මිලදී ගැනීම්, පොරොන්දු නෝට්ටු, විනිමය බිල්පත්, උකස් සුරැකුම් සහ කල් බදු උකස් බැඳුම්කර සඳහා මුද්දර බද්ද, සැළකිය යුතු ලෙස අඩු කරන ලදී.

## ණය කළමනාකරණය

රජයේ ණය වැඩසටහනෙහි වෙළෙඳපළ නැඹුරුව වැඩිදියුණු කිරීම් සහ කෙටිකාලීන ණය මත රැඳියාව අඩු කිරීමේ ප්‍රගතියක් අත්කර ගන්නා ලදි. අයවැය හිඟයෙන් විශාල ප්‍රමාණයක් මූල්‍යකරණය සඳහා රජය විසින් භාණ්ඩාගාර බැඳුම්කර, යොද ගන්නා ලදී. 1997 දී රුපියල් දශ ලක්ෂ 10,000 ක භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරනු ලැබූ අතර, 1998 දී එය රුපියල් දශ ලක්ෂ 38,915 ක් විය. ඒ අනුව භාණ්ඩාගාර බැඳුම්කර මගින් රැස්කරගත් ණය ප්‍රමාණය මුළු ශුද්ධ දේශීය ණය ගැනීම් වලින් 1997 දී වූ සියයට 22 සිට 1998 දී සියයට 72 දක්වා වැඩි විය. මුළු ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් 1997 දී වූ සියයට 86 සිට 1998 දී සියයට 89 දක්වා වැඩි වූ අතර, කෙටිකාලීන ණය 1997 දී වූ සියයට 40 සිට 1998 දී සියයට 37 දක්වා අඩු විය. 1998 දී විදේශීය ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 45.4 දක්වා වැඩි වූ අතර එම වැඩිවීමෙන් සියයට 84 ක් ම විනිමය අනුපාතිකය අවප්‍රමාණයවීම නිසා සිදුවිය. මුළු ණය සේවා ගෙවීම් 1997 දී පැවති දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10.4 සිට 1998 දී සියයට 11.3 දක්වා වැඩි විය. පොලී ගෙවීම් මුළු ණය සේවා ගෙවීම් වලින් සියයට 48 ක් විය.

භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ දියුණු කිරීම සඳහා පියවර කීපයක් ගන්නා ලදී. සේවක අර්ථසාධක අරමුදල සෘජුවම භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියට සහභාගී වීම 1998 සිට නවතන ලදී. මේ අනුව, වෙළෙඳපොළ මූලධර්මවලට පටහැනි තරඟකාරිත්වයෙන් තොර වූ ලංසු එනම්, අනුපාතිකයක් රහිතව ලංසු තැබීම නැවතිනි. 1999 දී කල්පිරෙන කාලසීමාව අඩුම වශයෙන් වර්ෂ 6 දක්වා දීර්ඝ කෙරේ යයි යන අපේක්ෂාවෙන් භාණ්ඩාගාර බැඳුම්කර-වල පරිනත කාලසීමාව වර්ෂ 2 සිට 4 දක්වා ක්‍රමයෙන් දීර්ඝ කරන ලදි. ආයෝජකයින්ට ඔවුන්ගේ මූල්‍ය කළමනා-කරණය වඩා පහසු ලෙස හසුරුවා ගත හැකි පරිදි සමූහ වශයෙන් භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම (Jumbo Issues) (එක් විශාල භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයක් විවිධ කාලසීමාවන් තුළදී කුඩා ප්‍රමාණ වලින් නිකුත් කිරීම) සිදු විය. වාණිජ බැංකුවලට භාණ්ඩාගාර බැඳුම්කර ද්‍රවශීල වත්කමක් ලෙස සැලකීම සඳහා අවසර ලබා දුනි. මීට අමතරව, අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීමට හෝ තාවකාලික ද්‍රවශීල දුෂ්කරතා පියවා ගැනීම සඳහා වාණිජ බැංකුවලට සහ ප්‍රාථමික ගණුදෙනුකරුවන්ට මහ බැංකුවේ ද්විපිතික කවුළුව තුළින් භාණ්ඩාගාර බැඳුම්කර ගණුදෙනු කිරීමට අවසර දෙන ලදි. මීට අමතරව පසුගිය කාලයේ ලබා ගත් පිරිවැය අධික වූ රුපියල් සුරැකුම්පත් රුපියල් දශ ලක්ෂ 16,000 ක් එම ණය කලින් ගෙවා නිදහස් කිරීමේ විකල්පය යටතේ ගෙවා නිදහස් කරන ලදී.

## 1.8 ජාත්‍යන්තර වාතාවරණය සහ විදේශීය අංශය

1998 වර්ෂය තුළදී ජාත්‍යන්තර ආර්ථික වාතාවරණය අයහපත් සිද්ධීන්ගෙන් ගහන වූවක් විය. විශේෂයෙන්ම 1998 වර්ෂය තුළදී නැගෙනහිර ආසියානු මූල්‍ය අර්බුදයේ ප්‍රතිවිපාක ලෝක ආර්ථිකය කෙරෙහි දැඩි ලෙස දැනෙන්නට විය. ජපානයේ දිගටම පවත්නාවූ දැඩි අවපාතය, අගෝස්තු මස සිට රුසියාවේ රූබල් අර්බුදය හා තරමක් මඳ වශයෙන් දකුණු ඇමරිකාවේ ඇති ප්‍රශ්න, අවිනිශ්චිත ලෝක ආර්ථික හා මූල්‍ය වාතාවරණය තවදුරටත් තීව්‍ර කරන්නට හේතු විය. මෙම පසුබිම යටතේ, ඉල්ලුමේ තියුණු පහත වැටීම භාණ්ඩ මිල ගණන්හි තියුණු ලෙස පහත වැටීම සමග ඇතිවූ අවධමන පීඩනය සහ නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන් වෙතින් ප්‍රාග්ධනය ඉවතට ගලා යාම යන හේතූන් නිසා, ලෝක ආර්ථිකය නිරන්තර ලෙස පීඩාවට පත් විය.

ලෝක ආර්ථිකය 1997 වර්ෂයේ දී වූ සියයට 4.2 ක වර්ධනයේ සිට සියයට 2.2 ක් පමණක් දක්වා තියුණු ලෙස පහත වැටුණි. ආසියාවේ දියුණු වෙමින් පවතින රටවල වර්ධන වේගය 1997 දී වූ සියයට 6.6 සිට සියයට 3.8 දක්වා පහත වැටුණි. කාර්මික රටවල වර්ධන වේගයද 1997 දී වූ සියයට 3.2 සිට 2.2 දක්වා පහත වැටුණු අතර ජපානය සියයට 2.8 ක සෘණ වර්ධන වේගයක් පෙන්නුම් කරන ලදී. යුරෝ කලාපයේ නිමැවුම සියයට 2.9 කින්, එනම් 1997 වර්ෂයේදී පැවතියාට වඩා වැඩි වේගයකින් වර්ධනය විය. දිගු කාලයක් තිස්සේ ලෝක නිමැවුම් වර්ධනයේ ප්‍රමුඛ ස්ථානයක් හිමිකරගත් ආසියාව, මූල්‍ය අර්බුදය හේතුවෙන් පසුබෑමකට ලක් වූ අතර, වර්ධන වේගය ආරම්භයේදී පුරෝකථනය කල සියයට 7.4 ට එරෙහිව සියයට 1.8 ක් විය. කෙසේ නමුත් වඩාත් අපහසුතාවයකට පත් කරන ආකාරයට නිමැවුමෙහි අඩු වීමක් දක්නට ලැබුනේ 1997 දී වර්ධන වේගය සියයට 3.8 දක්වා පහත වැටීමෙන් පසු 1998 දී සියයට 9.5 ක සෘන වර්ධන වේගයක් වාර්තා කල ආසියාතික රටවල් හතරෙහිය (ඉන්දුනීසියාව, මැලේසියාව, පිලිපීනය සහ තායිලන්තය). 1998 වර්ෂයේ ලෝක ආර්ථිකයෙහි දක්නට ලැබුණු දිරිගන්වන සුළු ලක්ෂණයන් වූයේ, ලෝක නිමැවුමෙන් සියයට 60 කට පමණ දායක වන එක්සත් ජනපදයේ හා යුරෝපයේ බොහොමයක් ආර්ථිකයන් තවදුරටත් ශක්තිමත් ලෙස පැවතීමයි. එක්සත් ජනපද ආර්ථිකය 1997 දී මෙන් සියයට

**විශේෂ සටහන - 1**

# යුරෝ

යුරෝ යනු යුරෝපා සංගමයේ සාමාජික රටවල් 15 න් 11 ක සහභාගිත්වයෙන් තනි ආර්ථික කලාපයක් ලෙස අළුතින් නිර්මානය වූ යුරෝලන්තයෙහි පොදු ව්‍යවහාර මුදලයි.[1] යුරෝපය සඳහා වූ පොදු ව්‍යවහාර මුදලක සංකල්පයේ මූලාරම්භය යුරෝපා ආර්ථික සංගමය බිහි කිරීමට තුඩු දුන් 1957 රෝම සම්මුතියේදී යෝජනා කරන ලද යුරෝපා ආර්ථික එකමුතුවක් කරා වූ ප්‍රයත්නය දක්වා දිව යන නමුත් එම සංකල්පය තහවුරු වූයේ 1969 දී හේග් නුවර පැවති යුරෝපීය නායකයන්ගේ සමුළුවේදීය. මෙම ක්‍රියාදාමයෙහි අවසන් ප්‍රතිඵලය ලැබුනේ 1992 දී සාමාජික රටවල් විසින් යුරෝපා සංගමය හා සම්බන්ධව මාස්ට්‍රිච්ට් සම්මුතිය අනුමත කර අත්සන් කිරීමත් සමඟය.

යුරෝපා මූල්‍ය සංගමය සහ යුරෝ ව්‍යවහාර මුදල නිළ වශයෙන් ඉදිරිපත් කිරීම පියවර තුනකින් සිදු වේ. මෙහි පළමු පියවර 1990 ජූලි 1 දින ආරම්භ කල අතර, එය යුරෝපා සංගමය තුළ ප්‍රාග්ධන සංචලනයේ පාලනයන් ඉවත් කිරීම සහ ප්‍රාදේශීය අසමමිතිකතා අවම කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. 1994 ජනවාරි 1 දින ආරම්භ වූ දෙවන පියවර මගින් සාමාජික රටවල රාජ්‍ය මූල්‍ය හා මූල්‍ය අභිසාරී බව ලබා ගැනීමේ අරමුණ ඉටු කර ගැනීම ප්‍රවර්ධනය කිරීමත්, යුරෝපා මහ බැංකුව ආරම්භ කිරීමට පූර්විකාවක් ලෙස සැලකෙන යුරෝපා මූල්‍ය ආයතනය ආරම්භ කිරීමත් ඉලක්ක කෙරුණි. මෙහි අවසාන පියවර 1999 ජනවාරි 1 දින යුරෝ ව්‍යවහාර මුදල හඳුන්වා දීම සහ සහභාගී වන රටවල් අතර විනිමය අනුපාතිකයන් නැවත වෙනස් කළ නොහැකි ලෙස ස්ථාවර කිරීමත් සමඟ ආරම්භ කෙරුණි.[2] යුරෝ නෝට්ටු හා කාසි ජාතික ව්‍යවහාර මුදල් හා සමාන්තරව 2002 ජනවාරි 1 දින භෞතික වශයෙන් එළි දකිනු ඇත. මාස හයක සංක්‍රාම කාලයකට පසු 2002 ජූලි මස 1 දින, සහභාගී වන රටවල ජාතික ව්‍යවහාර මුදල් මුළුමනින්ම ඉවත් කෙරෙන අතර යුරෝ ව්‍යවහාර මුදල බවට පත්වේ. එදින සිට මෙම ජාතික ව්‍යවහාර මුදල් 11 නීත්‍යානුකූල මුදල් ලෙස පිළි නොගැනෙනු ඇත. බ්‍රෙටන් වුඩ්ස් ආයතන හඳුන්වා දීමෙන් පසු ලෝක මූල්‍ය ක්ෂේත්‍රයේ දක්නට ලැබුණු ආයතනික සංවර්ධනයේ වඩාත්ම වැදගත් සිද්ධිය ලෙස සලකනු ලබන යුරෝ ව්‍යවහාර මුදල හඳුන්වා දීම ලෝක ආර්ථිකය මත දීර්ඝකාලීන බලපෑම් ඇති කරනු ඇත. යුරෝ ජාත්‍යන්තර වශයෙන් පිළිගැනෙන ස්ථායී ව්‍යවහාර මුදලක් බවට පත් වුවහොත් ලෝකයේ විශාලතම දේශීය මූල්‍ය වෙළෙඳපොළ නිර්මානය කිරීමට හැකියාව ඇති මෙම මූල්‍ය සංගමය, බල තුලනය හා ලෝක ආර්ථික සම්බන්ධතා කෙරෙහි බලපෑම් ඇති කරනවා පමණක් නොව දීර්ඝකාලීනව ඒවායේ මුහුණුවරද වෙනස් කරනු ඇත.

යුරෝ හඳුන්වා දීම තුළින් ලබා ගත හැකි වාසි නොයෙකුත් අංශයන්ගෙන් ඇති විය හැකිය. යුරෝ භාවිතා කෙරෙන වෙළෙඳපොළෙහි අති විශාලත්වය, එ.ජ. ඩොලර්වලට පමණක් දෙවැනි වූ ද්‍රවශීලතාවයක් හා ව්‍යාප්තියක් යුරෝ ව්‍යවහාර මුදලට ලැබිය හැකි බව පෙන්නුම් කරයි.[3] පහත දැක්වෙන සංඛ්‍යා සටහන ගෙනහැර දක්වන පරිදි යුරෝපා සංගමය තුළ දේශීය ව්‍යවහාර

**ප්‍රාග්ධන වෙළෙඳපොළ උපකරණයන්**
**(1997.3.31 දිනට එ.ජ.ඩොලර් බිලියන)**

| | දේශීය ව්‍යවහාර මුදල් බැඳුම්කර | ලැයිස්තුගත කොටස් | රාජ්‍ය ණය |
|---|---|---|---|
| ඇමරිකා එක්සත් ජනපදය | 4,677 | 6,939 | 7,231 |
| යුරෝපා සංගමය (අ) | 2,776 | 4,359 | 4,689 |
| ජපානය | 1,368 | 3,106 | 3,203 |

(අ) රටවල් 15 ම ඇතුලත්ය.

1 මේ වනවිට යුරෝපා සංගමයේ සාමාජික රටවල් 15 න්, 11 ක් යුරෝපා මූල්‍ය සංගමයට බැඳී ඇත. එම රටවල් නම්, ඔස්ට්‍රියාව, බෙල්ජියම, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, අයර්ලන්තය, ඉතාලිය, ලක්ස්සම්බර්ග්, නෙදර්ලන්තය, පෘතුගාලය සහ ස්පාඤ්ඤ යයි. එක්සත් රාජධානිය, ඩෙන්මාර්කය සහ ස්වීඩනය ඔවුන්ගේම හේතු මත ස්වේච්ඡාවෙන් ඉවත්ව සිටීමට තීරණය කර ඇති අතර ග්‍රීසිය අභිසාරී නිර්ණායකයන්හි අඩංගු ඉලක්ක සපුරාලීමට අපොහොසත් වීම හේතුවෙන් ස්වේච්ඡාවෙන් තොරව ඉවත්ව සිටීමට සිදුව ඇත. මෙම අභිසාර නිර්ණායකයන්ට (අ) මිළ ස්ථාවරත්වය (යු.ස. රටවල් අතරින් අඩුම උද්ධමනය ඇති රටවල් තුනෙහි සාමාන්‍ය උද්ධමනය හා සියයට 1.5 ක පරාසයක් තුළ උද්ධමනය පවත්වාගෙන යාම ලෙස අර්ථ නිරූපිත) (ආ) දිගුකාලීන පොලී අනුපාතික පහල මට්ටමක පවත්වා ගැනීම (අඩුම පොලී අනුපාතික ඇති රටවල් තුනෙහි පොලී අනුපාතික හා සියයට 2 ක පරාසයක් තුළ පොලී අනුපාතික පවත්වාගෙන යාම ලෙස නිර්වචනය කර ඇති), (ඇ) විනිමය අනුපාත ස්ථායීතාව (යුරෝපා මූල්‍ය ක්‍රමය යටතේ නියම කර ඇති සාමාන්‍ය විචලන පරාසයන් තුළ අවම වශයෙන් වසර දෙකක් තම විනිමය අනුපාත පවත්වාගෙන යා තිබීම) සහ (ඈ) පවත්වාගෙන යා හැකි රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් තිබීම ( (i) අයවැය හිඟය ද.දේ.නි. යෙන් සියයට 3 කට වඩා වැඩි නොවන හා (ii) රාජ්‍ය ණය ද.දේ.නි. යෙන් සියයට 60 කට නොවැඩි වීම ලෙස අර්ථ නිරූපිත).

2. 1999 ජනවාරි 1 දින යුරෝපා මූල්‍ය සංගමයේ සහ යුරෝපා මූල්‍ය සංගමය සාමාජික රටවල ජාතික ව්‍යවහාර මුදල් අතර විනිමය අනුපාත පහත දැක්වෙන පරිදි ස්ථාවර කරන ලදී.

| | බෙල්ජියම | ජර්මනිය | ස්පාඤ්ඤය | ප්‍රංශය | අයර්ලන්තය |
|---|---|---|---|---|---|
| යුරෝ 1= | 40.3399 | 1.95583 | 166.386 | 6.55957 | 0.787564 |

| ඉතාලිය | ලක්සම්බර්ග් | නෙදර්ලන්තය | ඔස්ට්‍රියාව | පෘතුගාලය | ෆින්ලන්තය |
|---|---|---|---|---|---|
| 1936.27 | 40.3399 | 2.20371 | 13.7603 | 200.482 | 5.94573 |

3 1997 වර්ෂයේ යුරෝපා සංගමය ලෝක නිෂ්පාදනයෙන් සියයට 24 කට දායක වූ අතර අපනයන සහ ආනයන ලෝක වෙළෙඳමෙහි පිළිවෙලින් සියයට 39 කට හා 35 කට දායක විය. මීට සංසන්දනාත්මකව එක්සත් ජනපදය සහ ජපානය ලෝක නිෂ්පාදනයෙන් පිළිවෙලින් සියයට 27 හා සියයට 14 කට දායක විය. ඔවුන්ගේ අපනයනයන් පිළිවෙලින් සියයට 13 කට හා සියයට 8 කටද, ආනයනයන් සියයට 16 ක් හා සියයට 6 කටද දායක විය. එම වර්ෂය තුළදී ශ්‍රී ලංකාවේ මුළු අපනයනයෙන් සියයට 30 ක් හා මුළු අපනයනයන්ගෙන් සියයට 17 ක් යුරෝපා සංගමයේ රටවල් හා සමග විය.

**විශේෂ සටහන - 1 (සම්බන්ධයි)**

මුදල් බැඳුම්කර, ලැයිස්තුගත කොටස් සහ රාජ්‍ය ණය ප්‍රමාණයන් ජපානයට වඩා බෙහෙවින් වැඩිය. මෙවැනිම තත්වයක් ජාත්‍යන්තර ණය හා විදේශීය විනිමය වෙළෙඳ-පොළවලද ඇතිවිය හැකිය.

යුරෝ වෙළෙඳපොළවල් මෙම භව්‍ය විශාලත්වය, වඩා අඩු මූල්‍යනය පිරිවැයකින් යුත් යුරෝ වලින් සමන්විත නව මූල්‍ය උපකරණ සංවර්ධනයවීමට තුඩු දෙනු ඇත. යුරෝ කලාපය තුළ ආයතන අතර දිගුකාලීන මූර්ත සහ මූල්‍ය කොන්ත්‍රාත්තුවල විදේශ විනිමය අවදානමද යුරෝ මඟින් ඉවත් කෙරෙනු ඇති අතර, එය විනිවිද භාවය හා කාර්යක්ෂමතාව වැඩි කිරීම තුළින් පොලී අනුපාතික අතර පරතරයන් පටු කිරීම සඳහා අනුබලයක්ද සපයනු ඇත. මීට අමතරව, යුරෝ කලාපය තුළ වැඩිවෙමින් පවතින තරඟකාරී පීඩනය මඟින් මෙතෙක් පැවැති භූගෝලීය වශයෙන් පවතින වාසි ඉවත් කෙරෙනු ඇති අතර එය වෙළෙඳපොළ ඒකාග්‍රතාවය වැඩි කිරීමට මඟ පාදනු ඇත. යුරෝ කලාපය තුළ සාර්ව ආර්ථික විචලනයන් අභිසාරී වීම, විශේෂයෙන්ම යුරෝපා මහ බැංකු ක්‍රමයට ප්‍රමුඛ කාර්යයක් ලෙස මිල ස්ථාවරත්වය (සියයට 2 කට අඩු වාර්ෂික උද්ධමන අනුපාතයක් ලෙස අර්ථ නිරූපනය කර ඇති) පවත්වාගෙන යාමට බලය පැවරී තිබීම සෙසු ලෝකයාට වඩාත් යහපත් බලපෑම් ඇති කිරීමට හේතු වනු ඇත. ලෝක පොලී අනුපාතිකයන් අඩු කිරීම සඳහා යුරෝහි බලපෑම ශ්‍රී ලංකාව වැනි ප්‍රාග්ධන ආනයනික රටවල් කෙරෙහි වාසිදයක වන අතර, යුරෝ කලාපීය ආර්ථිකයන්හි අපේක්ෂිත ආර්ථික වර්ධන-යන් ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවත්නා රටවල විදේශ සෘජු ආයෝජන හා ජාත්‍යන්තර වෙළෙඳම වැඩි වීමට තුඩු දෙනු ඇත.

තනි ව්‍යවහාර මුදලක සංකල්පය සහ ඒ සඳහා අවශ්‍ය ව්‍යුහාත්මක වෙනස්කම්, යුරෝපීය මූල්‍ය සංගමයේ සාර්ථකත්වය හා එය දිගටම පවත්වාගෙන යාම කෙරෙහි තියුණු අභියෝගයන්ගෙන් ද තොර වූයේ නොවේ. මෙම ක්‍රමයෙහි විකාශය සාමාජික රටවල දේශපාලනික හා සමාජයීය එකමුතුකම මත දැඩි ලෙස රඳා පවතිනු ඇත. එක්සත් රාජධානිය තනි ව්‍යවහාර මුදලක් භාවිතා කිරීමෙන් ස්වේච්ඡාවෙන් ඉවත්ව සිටීම සඳහා බොහෝවිට බල කරන්නට ඇතැයි සැලකෙන මූල්‍ය හා විනිමය අනුපාතික ප්‍රතිපත්තීන් තීරණය කිරීමේ ස්වාධීනත්වය යුරෝපා මහ බැංකුවට පැවරීමත් සමඟම, සාමාජික රටවලට තම ආර්ථිකයන් කෙරෙහි බලපෑම් කිරීමට ඇති එකම උපකරණය වන්නේ අභිසාරී නිර්ණායකයන් යටතේ පාලනය වන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියයි. කෙසේ නමුත්, යුරෝලන්ත මට්ටමේදී යෝග්‍ය ප්‍රතිපත්ති සමුදායන් ලඟා කර ගැනීම අභියෝගාත්මක කර්තව්‍යයක් වනු ඇත. මෙයට හේතුව ජාතික මට්ටමේ ව්‍යුහාත්මක ප්‍රශ්න නිරාකරණය කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය ප්‍රතිපත්තීන් තනි මූල්‍ය ප්‍රතිපත්තියක් හා යුරෝ විනිමය අනුපාතිකය ක්‍රියාත්මක කිරීම මත බලපෑම් කෙරෙන හෙයිනි. යුරෝ කලාපයේ බොහොමයක් සාමාජික රටවල් සැලකිය යුතු මට්ටමේ පාලනයන්ගෙන් යුක්ත වන අතර ව්‍යුහාත්මක ප්‍රශ්න වලින් මිරිකී සිටී. ශ්‍රම සංචලනය සීමා කර ඇති අතර ජාතික ශ්‍රම වෙළෙඳපොළවල් බොහෝ සේ අනම්‍යය සමහර සාමාජික රටවල ඉහළ මට්ටමේ විරැකියාවක් පවතී. ඉදිරි කාලයේදී යුරෝපා මූල්‍ය සංගමයේ ශක්තිය හා ස්ථායීතාව, සාමාජික රටවල පවත්නා සාර්ව ආර්ථික අභිසාරීතාවයක් පවත්වාගෙන යාම කෙරෙහි ඇති කැප වීම, ව්‍යුහාත්මක ගැලපුම්වල වේගය සහ වැදගත් ප්‍රතිපත්ති ප්‍රශ්න හා සම්බන්ධව යුරෝ සාමාජික රටවල දේශපාලනික එකමුතු-කම මත රඳා පවතී. කෙසේ නමුත්, රාජ්‍ය නායකයන් සහ යුරෝපා කොමිසමේ සභාපතිගෙන් සමන්විත යුරෝපා කවුන්සිලය, වඩාත් පුළුල් කළයුතුව තිබෙන ප්‍රතිපත්ති සම්බන්ධීකරණයේ අවශ්‍යතාව හොඳින් අවබෝධ කරගෙන ඇත.

3.9 කින් වර්ධනය විය. රුසියාවේ ආර්ථික වර්ධනයෙහි සියයට 4.6 ක පහත වැටීමක් පිළිබිඹු කරමින් සංක්‍රාන්තික මට්ටමේ පවතින රටවල්හි ආර්ථික වර්ධනය සියයට 0.1 කින් පහත වැටුණි.

ලෝක ඉල්ලුමෙහි අඩුවීම හේතුවෙන් පහත වැටෙමින් පවතින භාණ්ඩ මිල ගණන් සහ මිල ස්ථාවරත්වය සඳහා රජයයන්ගේ දැඩි කැප වීම නිසා, ආසියාවේ සහ සංක්‍රාන්තික රටවල් හැරෙන්නට, අනෙක් බොහෝ කලාපයන්හි උද්ධමනය පහළ යාමක් ඇතිවිය. කාර්මික රටවල පාරිභෝගික මිල උද්ධමනය 1997 දී වූ සියයට 2.1 සිට 1998 දී සියයට 1.5 දක්වා පහළ ගිය අතර, සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි එය සියයට 9.3 සිට 10.4 දක්වා ඉහළ නැඟුණි. මේ අතර සංක්‍රාන්තික රටවල උද්ධමනය සියයට 28.2 සිට සියයට 30.8 දක්වා ඉහළ ගියේය. උද්ධමන වේගයෙහි පහත යාමට සමාන්තරව ලෝක පොලී අනුපාතිකයන් ද පහත වැටුණි. 1997 වර්ෂයේ දී සියයට 10 ක වර්ධනයක් පෙන්නුම් කල ජාත්‍යන්තර වෙළෙඳම 1998 වර්ෂයේද සියයට 3.4 ක් දක්වා තියුණු ලෙස අඩු විය. ජාත්‍යන්තර වෙළෙඳමේ වර්ධනයෙහි මන්දගාමී බව සියළුම කලාපයන්හි දක්නට ලැබුණි. සංවර්ධනය වෙමින් පවතින රටවල අපනයන වර්ධනය 1997 වර්ෂයේ වූ සියයට 11.4 සිට 1998 දී සියයට 1.8 දක්වා අඩු විය. සංවර්ධනය වූ රටවල අපනයන වර්ධන වේගයද 1997 දී පැවති සියයට 10.4 සිට සියයට 3.6 දක්වා පහත වැටුණි. එම රටවල ආනයනයන්ද සියයට 4.2 කින් අඩු විය. වෙළෙඳ අනුපාතය, සංවර්ධන රටවලට වඩා වාසිදයක ලෙස සියයට 0.9 කින් වැඩි දියුණු වූ අතර මීට ප්‍රතිවිරුද්ධව, සංවර්ධනය වෙමින් පවත්නා රටවල එම අනුපාතය සියයට 3.2 කින් තවදුරටත් පහත වැටුණි. මේ අතර, සංවර්ධනය වෙමින් පවතින රටවල

ගෙවුම් ශේෂයන්හි ජංගම ගිණුම්හි හිඟය 1997 සියයට 4.9 සිට 1998 දී සියයට 6.4 දක්වා අඛණ්ඩව පිරිහුණි.

1998 වර්ෂය තුළදී ඉහළ සැපයුම් මට්ටම් හා ඉල්ලුමෙහි පහත යාම යන කරුණු දෙකම හේතුකොටගෙන ප්‍රධාන භාණ්ඩයන්ගේ ජාත්‍යන්තර මිල මට්ටම් තවදුරටත් පහළ ගියේය. දුර්වල ඉල්ලුම් තත්ත්වයන් හා සැපයුම් ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් ඒ වනවිටත් පහළ මට්ටමක පැවති ඉන්ධන මිල එ.ජ. ඩොලර් මිල ගණන් අනුව සියයට 32 කින් තියුණු ලෙස පහත වැටුණි. ඉන්ධන නොවන භාණ්ඩයන්ගේ මිල ගණන් සියයට 15 කින් පහත වැටුණි. දුර්වල ආර්ථික තත්ත්වයන් හේතුවෙන් රුසියානු සමූහාණ්ඩුව සහ ආසියානු රටවල්වල ඉල්ලුම පහත යාමත්, නොකඩවා සිව්වෙනි වසරටත් වෙළෙඳපොළෙහි අධි සැපයුම් තත්ත්වයන් පැවතීමත් හේතුවෙන් ජාත්‍යන්තර සීනි මිල ගණන් වර්ෂය පුරාම පහත වැටුණි. මේ අතර, ප්‍රධාන වශයෙන් ආසියාවේ ආර්ථික වර්ධනයේ පසුබෑම් නිසා ඇතිවූ දුර්වල ඉල්ලුම් තත්ත්වයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂය තුළදී තිරිඟු මිලද පහත වැටුණි. අනෙක් අතට සහල් තොග, වර්ෂ 25 ක් තුළ පැවති අවම මට්ටමකට පහත වැටීමට ප්‍රතිචාර වශයෙන් සහල් මිල ගණන් තියුණු ලෙස ඉහළ ගියේය. ලෝක සහල් නිෂ්පාදනයෙහි පහත යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ලෝක සහල් නිෂ්පාදනයෙන් අඩකටත් වඩා වැඩියෙන් නිපදවන හා ලෝක සහල් අපනයනන්ගෙන් හතරෙන් එකකට දයක වන චීනයේ සහ ඉන්දියාවේ නිෂ්පාදනය අඩු වීමයි. වර්ෂයේ වැඩි කාලයක් තිස්සේ ජාත්‍යන්තර රබර් මිල ගණන්, වර්ෂය මුලදී පැවති පහළ මට්ටමට වඩා ඉහළ මට්ටමක පැවතිය ද පසුගිය වර්ෂයේ වූ ප්‍රමාණයට වඩා බෙහෙවින් අඩු මට්ටමක පැවතින. පොල් නිෂ්පාදනවල ජාත්‍යන්තර මිල ගණන් වර්ෂයේ පළමු මාස පහ තුළදී තියුණු ලෙස වැඩි වුවද ඉන්පසු තරමක් අඩු වන්නට විය. පොල් නිෂ්පාදනවල මිල ඉහළ යාමට හේතු වූයේ ප්‍රධාන වශයෙන්ම අසාමාන්‍ය කාලගුණික තත්ත්වයන් නිසා පිලිපීනයේ සහ ඉන්දුනීසියාවේ පොල් නිෂ්පාදනය පහත වැටීමය. 1997 වර්ෂයේදී ඉහළ මට්ටමක පැවති තේ මිල ඉහළ සැපයුම් හා අඩු ඉල්ලුම් හේතුවෙන් 1998 වර්ෂය තුළදී පසුබෑමකට ලක් විය. යහපත් කාලගුණික තත්ත්වයන්, ප්‍රධාන තේ නිෂ්පාදන රටක් වන කෙන්යාවේ තේ නිෂ්පාදනය සියයට 30 කින් ඉහළ නැංවීමට හේතු වූ අතර ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනයන් පිළිවෙලින් සියයට 3 කින් සහ සියයට 1 කින් ඉහළ ගියේය. ඉන්දියානු තේ අපනයනයන්ගෙන් සියයට 65 කටත් ශ්‍රී ලංකාවේ තේ අපනයනයන්ගෙන් සියයට 20 කටත් පමණ දයක වන, රුසියාවේ දුබල ඉල්ලුම ලෝක තේ මිල ගණන් පහත හෙළීමට හේතු විය.

විශේෂයෙන්ම, 1997 වර්ෂයේදී හා 1998 මුල් කාලයේදී අපහසුතාවයන්ට පත් වූ නැගෙනහිර ආසියානු රටවල්හි විනිමය අනුපාතිකයන්ගේ විශාල විතැන්වීම්වල නිවැරදි කිරීමක් වර්ෂයේ අවසන් භාගය තුළදී දක්නට ලැබුණි. දේශීය ආර්ථිකයන්හි මූල්‍ය අංශයේ ප්‍රශ්න නිරාකරණය සඳහා කරන ලද ප්‍රතිසංස්කරණ ප්‍රයත්නයන් ආයෝජක විශ්වසනීයත්වය ඇති කිරීමට උපකාරී වූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් එ.ජ. ඩොලරයට එරෙහිව කොරියානු වොන් සියයට 42 කින්ද, තායි බාත් සියයට 29 කින්ද, පිලිපීන පෙසෝ සියයට 3 කින් සහ මැලේසියානු රින්ගිට් සියයට 2 කින්ද වටිනාකම ඉහළ ගියේය. කෙසේ නමුත්, අවිනිශ්චිත ආර්ථික හා දේශපාලනික පසුතලයකට එරෙහිව ඉන්දුනීසියානු රුපියා, එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 31 කින් අවප්‍රමාණය විය. මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක කිරීම සඳහා ගන්නා ලද පියවරයන්ට ප්‍රතිචාර වශයෙන් ජපාන යෙන් එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 12 කින් ඉහළ ගියේය. මේ අතර, 1999 ජනවාරි 1 දින යුරෝ මුදල් හඳුන්වා දීමේ මහත් අපේක්ෂාවන් බොහොමයක් යුරෝපීය ව්‍යවහාර මුදල් එ.ජ. ඩොලරයට එරෙහිව අගය වැඩි වීමට හේතු විය. රුසියාවේ මූල්‍ය අංශයේ ප්‍රශ්න රූබලයේ කඩා වැටීමකට තුඩු දුන් අතර එය 1998 වර්ෂය තුළදී එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 71 කින් අවප්‍රමාණ විය. ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළවල තවමත් පවත්නා අවිනිශ්චිතතා පෙන්නුම් කරමින් දකුණු අප්‍රිකානු රැන්ඩ් හා බ්‍රසීල රියාල් පිළිවෙලින් සියයට 17 කින් හා සියයට 8 කින් අවප්‍රමාණය විය.

ලොව පුරා පහළ යමින් පවත්නා උද්ධමන අනුපාතිකයන්ට ප්‍රතිචාර වශයෙන් කෙටිකාලීන පොලී අනුපාතික අඩු වන්නට විය. මාස හයක කාලයක් සඳහා වූ ලන්ඩන් අන්තර් බැංකු ණය අනුපාතිකය 1997 අවසානයේදී වූ සියයට 5.84 සිට 1998 අවසානයේදී සියයට 5.06 දක්වා පහත වැටුණි. මිල ස්ථායීතාව කෙරෙහි කැප වීමත් දිගුකාලීනව අඩු උද්ධමන අනුපාතික අපේක්ෂාකිරීමත් දිගුකාලීන පොලී අනුපාතික තවදුරටත් පහත වැටීමට හේතු විය. උදහරණයක් වශයෙන් වර්ෂ 30 එක්සත් ජනපද භාණ්ඩාගාර බැඳුම්කර අනුපාතිකය 1997 දෙසැම්බර් මස පැවති සියයට 5.81 සිට 1998 දෙසැම්බර් මාසයේදී සියයට 5.59 දක්වා පහත වැටුණි. කෙසේ නමුත්, පොලී අනුපාතිකයන්ගේ මෙම අඩු වෙන ප්‍රවනතාවයන් තිබියදීත්, 1998 වර්ෂය තුළදී දක්නට ලැබුණු, අපහසුතාවයට පත් කරනු ලබන කරුණක් වූයේ විශේෂයෙන්ම නැගී එන වෙළෙඳපොළ රටවල ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළවල බැඳුම්කර නිකුතුවන් සඳහා ඉහළ අවදනම් අධි මිලක් ඇදීමත්, එමගින් එම රටවල ආර්ථිකයන් යථා තත්ත්වයට පත් වීම තවදුරටත් ප්‍රමාද කිරීමත්ය. මෙය රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකෙහිම නිකුතුන්ට අහිතකර ලෙස බලපෑ අතර පෞද්ගලික අංශය කෙරෙහි වඩාත් තියුණු බලපෑමක් ඇති විය. උදහරණයක් ලෙස ඉන්දියාව පිලිපීනය සහ තායිලන්තය යන රටවල නිකුතුන් සඳහා පොලී ආන්තිකය පදනම් අංක 300 කින් (ප්‍රතිශතාංක 3 කින්) ඉහළ ගිය අතර කොරියාව, සහ හොංකොං යන රටවල නිකුතුන් සඳහා පොලී ආන්තිකයන් පදනම් අංක 500 කින් වැඩි විය. ඉන්දුනීසියාව සහ මැලේසියාව විසින් කල නිකුතුන් සඳහා පදනම් අංක 1,000 කටත් වඩා වැඩි ප්‍රමාණයකින් වැඩි විය. එහි ප්‍රතිඵලයක් ලෙස ලොව පුරා ශුද්ධ පෞද්ගලික ප්‍රාග්ධන ගැලීම් 1997 වූ එ.ජ. ඩොලර් බිලියන 124 සිට 1998 දී එ.ජ. ඩොලර් බිලියන 57 දක්වා තියුණු ලෙස පහත වැටුණි. 1997 දක්නට ලැබුණු එ.ජ. ඩොලර් බිලියන 29 ක ශුද්ධ ගලා ඒමක් හා සසඳන කල 1998 වර්ෂයේදී එ.ජ. ඩොලර් බිලියන 44 ක ශුද්ධ ගලා යාමක් පෙන්නුම් කළ ආසියාව වඩාත්ම තියුණු බලපෑමට ලක් විය.

නැගෙනහිර ආසියාතු මූල්‍ය අර්බුදය සහ ඉන් අනතුරුව විශේෂයෙන්ම රුසියාව සහ දකුණු ඇමෙරිකාව ඇතුළත් ලොව අනෙකුත් කලාපවල ඇති වූ අහිතකර සිද්ධීන් සහ ඒවායේ ජාත්‍යන්තර බලපෑම සාපේක්ෂ වශයෙන් කෙටි කාලයකදී සමනය කිරීමට බ්‍රෙට්න් වුඩ්ස් ආයතන අපොහොසත් වීම හේතුවෙන් 1998 වර්ෂයේ වැඩි කාලයක් තුළ විවාදයට ලක් වූ කරුණක් වූයේ අර්බුද විසඳීම සහ වැලකීම සඳහා නව ජාත්‍යන්තර මූල්‍ය ක්‍රමයක අවශ්‍යතාවයයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සහ ලෝක බැංකුව විසින් තාක්ෂණික පහසුකම් හා මූල්‍ය සම්පත් සැපයීමෙන් අර්බුදකාරී තත්ත්වයකට පත් වූ ආර්ථිකයන් ස්ථායී තත්ත්වයකට ගෙන ඒමේ මූලිකත්වය ගන්නා ලදී. වර්තමාන තත්ත්වය යටතේ ලෝකයේ සම්පත් අවශ්‍යතාවයන් සපුරාලනු වස් ජා.මු.අ. එහි පංගු ප්‍රමාණය සියයට 45 කින් වැඩි කිරීමට යෝජනා කළේය. රූබල් අර්බුදය හමුවේ රුසියාව සඳහා පොදු සම්මුතිය (GAB) නැවත ක්‍රියාත්මක කල අතර, බ්‍රසීල ආර්ථික හා මූල්‍ය වැඩපිළිවෙලට සහාය දීම සඳහා "ණය ගැනීම් සඳහා නව සම්මුතිය" (NAB) ක්‍රියාත්මක කරන ලදී.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රමුඛත්වයෙන් යුතුව ජාත්‍යන්තර මූල්‍ය ක්‍රමය ශක්තිමත් කිරීම, සංවර්ධනය වෙමින් පවත්නා රටවල දැඩි අපේක්ෂාව වූ අතර, එමගින් වෙළෙඳපොළ හැසිරීමෙහි අනර්ථකාරී වෙනස්වීම් අඩු කිරීමත්, මූල්‍ය අර්බුදයන්හි පැතිර යාමේ සහ ඉතිර යාමේ බලපෑම් මර්දනය කිරීමත්, අර්බුද විසඳීමේ ප්‍රයත්නයන්ගේ කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීමත්, අරමුණු කොට ගති. මූල්‍ය වෙළෙඳපොළ සුපරීක්ෂණයෙහි හා අධීක්ෂණයෙහි සඵලතාව ශක්තිමත් කිරීමත්, ආයතනික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමත්, විනිවිද බව, වෙළෙඳපොළ විනය හා ආයතනික පාලනය වැඩිදියුණු කිරීම සහ මූල්‍ය ආයතනවල අවදනම් කළමණාකරණ ක්‍රම වැඩි දියුණු කිරීමත් අවසන් ඉලක්ක කොටගත් ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ මනා ව්‍යවහාර මූලධර්ම සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම කෙරෙහි වැඩි අවධානය යොමු කොට තිබේ.

නැගෙනහිර ආසියාතු මූල්‍ය අර්බුදයේ දැඩි සහ සංකීර්ණ බව තුළින් තහවුරු වනුයේ ප්‍රාග්ධන ගිණුම ලිහිල්කරණය සඳහා ක්‍රමවත් සහ සුපරීක්ෂාකාරී ක්‍රියා-මාර්ගයක් අනුගමනය කිරීමේත්, ක්‍රමානුකූල ප්‍රතිසංස්කරණ සඳහා ආයතනිකමය හැඩගැස්වීම්වල අවශ්‍යතාවය කෙරෙහිත් සංවර්ධනය වෙමින් පවතින රටවල් නහන හඬෙහි වැදගත්කම සහ අදාලත්වයයි. වර්ෂය තුළදී, ණය බර තුරන් කිරීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග සැකසීම, අධික ණය බරින් පෙළෙන දුප්පත් රටවල (HIPC) ණය ක්‍රමානුකූලව අඩු කිරීම සඳහා ක්‍රමවත් ක්‍රියාදමයන් සැකසීම සහ මනාලෙස සැලසුම් කරන ලද පශ්චාත් යුද වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කෙරෙහිද සංවර්ධනය වන රටවල් විසින් සිය අවධානය යොමු කරන ලදී.


මේ අතර, මෙම ශත වර්ෂය තුළ ජාත්‍යන්තර මූල්‍ය ක්‍රමයෙහි සිදු වූ ඉතාම වැදගත් සිදු වීම් වලින් එකක් වූ 1999 ජනවාරි 1 දින යුරෝ හඳුන්වා දීම ඉතා උද්‍යෝගිමත්ව සිදු කෙරුණ අතර එහි ප්‍රගතියක්ද දක්නට ලැබුණි. ඇමරිකා එක්සත් ජනපදය වැනි ප්‍රමුඛ පෙළේ කාර්මික ආර්ථිකයන් හා සසඳන කළ අඩු තරඟකාරී තත්ත්වයක් ඇති කිරීමට හේතු වූ ඉහළ ශ්‍රම පිරිවැය, අනම්‍ය ශ්‍රම වෙළෙඳපොළවල් සහ ඉහළ බදු වලින් මෙතෙක් පීඩාවට පත් වූ යුරෝපයෙහි, තරඟකාරිත්වය ඇති කිරීම සඳහා තනි ව්‍යවහාර මුදල් ඒකකයක් අත්‍යවශ්‍ය සාධකයක් වේ යයි අපේක්ෂා කරන ලදී. යුරෝපා සංගමයේ ප්‍රතිපත්ති හා උපාය මාර්ගවල දිශාව ලෝක ආර්ථිකය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් කරනු ඇත. එක්සත් ජනපදය, ජපානය සහ යුරෝපා සංගමය ලෝක ආර්ථිකයෙහි උසුලන වැදගත් ස්ථානය, ලෝක ආර්ථිකය ප්‍රකෘති තත්ත්වයට පත් කිරීමේලා මෙම ආර්ථිකයන් මත පැටවී ඇති වගකීම් පෙන්නුම් කරයි.

## විදේශීය අංශයේ වර්ධනයන්

1998 ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලනයේ මිශ්‍ර ප්‍රතිඵල දක්නට ලැබුණි. ආනයන මිල ගණන්වල තියුණු අඩු වීම ස්වයංක්‍රීය ස්ථායීකරණයක් ලෙස කටයුතු කල අතර, අපනයනයන්ගේ සැලකිය යුතු අඩු වීමෙන් වෙළෙඳ ශේෂය මත වූ බලපෑම සමහන් කිරීමට එය ඉවහල් විය. වෙළෙඳ හා ජංගම ගිණුම්වල හිඟයන් තවදුරටත් අඩු වූයේ, සමස්ත ගෙවුම් තුලනයේ එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 37 ක අතිරික්තයකට මඟ පෙන්වමිනි. 1997 දී වාර්තා වූ සියයට 13 ක වර්ධනයට එරෙහිව, ලෝක අපනයනයන්ගේ තියුණු සංකෝචනය හමුවේ වුවද, ශ්‍රී ලංකාවේ අපනයන සියයට 2 ක සුළු වර්ධනයක් වාර්තා කිරීමට සමත් විය. බොර තෙල්, තිරිඟු, පොහොර හා සීනි ආනයන මිල ගණන් ලෝක වෙළෙඳපළ අවපාත තත්ත්වයන් යටතේ තියුණු ලෙස පහත වැටීම හේතුවෙන් ආනයන වටිනාකම වර්ධනයවූයේ සුළු වශයෙනි. (සියයට 0.5). 1997 දී වූ එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 159 හා සසඳනවිට සේවා ගිණුම එක්සත් ජනපද ඩොලර් 143 ක අතිරික්තයක් වාර්තා කළේය. පෞද්ගලික සංක්‍රාමවල වූ අඛණ්ඩ වර්ධනය හා 1990 ගල්ෆ් යුද්ධය හේතුකොටගෙන අස්ථානගත වූ කුවේටයේ සේවය කල ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් ලද එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 78 ක වන්දි ගෙවීම්, ජංගමගිණුමේ හිඟය 1997 දී එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 393 සිට එක්සත් ජනපද ඩොලර් 289 දක්වා අඩු කිරීමට උපකාරී විය. දළ ජාතික නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ජංගම ගිණුමේ හිඟය 1997 සියයට 2.6 සිට 1998 දී සියයට 1.8 දක්වා පහත වැටිණි. විදේශීය දිගුකාලීන පෞද්ගලික ප්‍රාග්ධන ගලා ඒම් අඛණ්ඩව ඉහළ ගිය අතර, කොටස් වෙළෙඳපළ තුළින් කෙටිකාලීන ප්‍රාග්ධනයේ ශුද්ධ ගලා යාමක් දකිය හැකි විය. මූල්‍ය වෙළෙඳපළ ස්ථාවරත්වය පවත්වා ගැනීමේ ලා දේශීය මූල්‍ය හා විදේශ විනිමය අනුපාතික ප්‍රතිපත්තියේ සාර්ථකත්වය හේතුකොටගෙන, ශ්‍රී ලංකාවේ විදේශ විනිමය හා මූල්‍ය වෙළෙඳපොළ සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවතිනි.

1997 දී එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 301 ක වටිනාකමින් යුතු විශාල ප්‍රමාණයක පෞද්ගලිකකරණ ලැබීම් හා සසඳනවිට 1998 දී එය එක්සත් ජනපද ඩොලර් දශ


## 1.7 රූප සටහන
## විදේශීය අංශයේ තෝරාගත් දර්ශක




ලක්ෂ 56 ක් වීම හේතුකොටගෙන මූල්‍ය ගිණුමේ ශුද්ධ ගලා ඒම් 1998 දී අඩු මට්ටමක විය. වාණිජ බැංකුවල විදේශ වගකීම් අඩු වීම හා කොටස් වෙළෙඳපොළ තුළින් කෙටිකාලීන ප්‍රාග්ධන ගලා යාමක් තිබියදීත්, 1998 දී කෙටිකාලීන ශුද්ධ පෞද්ගලික ප්‍රාග්ධන ගලා යාම් පහත වැටිණි. විදේශ සෘජු ආයෝජනයන්ද ඇතුළුව, දිගුකාලීන පෞද්ගලික ප්‍රාග්ධන ගලා ඒම් 1998 දී අඛණ්ඩව ඉහළ යාම සැලකිය යුතු කරුණකි. ඉහළ මට්ටමක ප්‍රාග්ධන වියදම් පවත්වාගන යාමට රජයේ වූ කැපවීම පිළිබිඹු කරමින් රජයේ සහනදායී දිගුකාලීන ප්‍රාග්ධන ගලා ඒම් වසර තුළ වර්ධනය විය. රජයට දළ ප්‍රාග්ධන ගලා ඒම් (1997 දී නිකුත් කරන ලද පාවෙන අනුපාත නෝට්ටු හැරුණුකොට) 1998 දී සියයට 8 කින් වැඩි විය. ඉහළ ණය ආපසු ගෙවීම් හේතුකොටගෙන ශුද්ධ ප්‍රාග්ධන ගලා ඒම් අඩු විය.

පෞද්ගලික අංශයට ගලා ආ දිගුකාලීන ප්‍රාග්ධනයට, ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළ සඳහා ලංකා සංවර්ධන මූල්‍ය සමායතන බැංකුව (DFCC Bank) මගින් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 65 ක් සඳහා නිකුත් කරන ලද පාවෙන අනුපාතික නෝට්ටු (Floating Rate Notes - FRN) සහ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් එක් රැස් කර ගන්නා ලද එ.ජ. ඩොලර් දශ ලක්ෂ 43 ක ණයද ඇතුළත් වේ. කෙසේ වුවද, මෙම අංශය සඳහා ශුද්ධ දිගුකාලීන මූල්‍ය ගලා ඒම් අඩු වීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ එයාර් ලංකා සමාගම

## 1.8 රූප සටහන
## අපනයන පරිමා වර්ධනය



**විශේෂ සටහන - 2**

# මුල්‍ය තත්ත්ව දර්ශකය
## (Monetary Conditions Index)

මුල්‍ය ප්‍රතිපත්තීන්ට මග පෙන්වීමක් වශයෙන් ක්‍රියාත්මක සහ අතර මැදි ඉලක්කයන් (Operational and Intermediate targets) මහ බැංකුව විසින් භාවිතා කෙරේ. රටක උද්ධමනය අඩු කිරීම සහ ආර්ථික වර්ධනය නංවාලීම අවසාන ඉලක්කයන් සේ සලකා මහ බැංකුව මුල්‍ය උපකරණයන්හි වෙනස්කම් කළවිට එහි බලපෑම එම ඉලක්කයන් වෙත සම්ප්‍රේෂණය කෙරෙන මාර්ග කිහිපයක් ඇත. මුල්‍ය ප්‍රතිපත්තීන්හි ඇතිවන වෙනස්කම්වල බලපෑම අවසාන ඉලක්කයන් වෙත සම්ප්‍රේෂණය කෙරෙන ප්‍රධාන මාර්ග ලෙස පොලී අනුපාතික සහ විනිමය අනුපාතික හඳුනාගෙන ඇත.[1] ඒ නිසා පොලී අනුපාතික හා විනිමය අනුපාතික මුල්‍ය ප්‍රතිපත්තියට මග පෙන්වන ප්‍රධාන ක්‍රියාත්මක ඉලක්කයන් සේ භාවිතා කළ හැක. මුල්‍ය තත්ත්ව දර්ශකය යනු මෙම පොලී අනුපාතික සහ විනිමය අනුපාතිකයන්ගේ සංකලනයෙන් සකස් කළ, ක්‍රියාත්මක ඉලක්කයක් සේ භාවිතා කළහැකි දර්ශකයකි.

පොලී අනුපාතික සහ විනිමය අනුපාතික රටක උද්ධමන වේගය සහ ආර්ථික වර්ධනය තීරණය කරන සමස්ත ඉල්ලුම හා සැපයුම (Aggregate Demand and Supply) කෙරෙහි බලපෑම් ඇති කරයි. පොලී අනුපාතිකයෙහි ඉහළයෑමක් ආයෝජනය සහ පාරිභෝජනය අධෛර්යමත් කරමින් සමස්ත ඉල්ලුම මෙන්ම සමස්ත සැපයුමද අඩු කරන අතර ඉතිරි කිරීම් (Savings) දිරිමත් කරයි. සාමාන්‍යයෙන් සමස්ත ඉල්ලුමට ඇතිවන මෙම බලපෑම සමස්ත සැපයුමට ඇති කරන බලපෑමට වඩා වැඩි බැවින් සමතුලිත මිල මට්ටමේ සහ නිමැවුමෙහි පහත වැටීමකට තුඩුදේ. නිෂ්පාදකයන් ආනයනික අන්තර් භාණ්ඩ වැඩි වශයෙන් භාවිතා කරන අවස්ථාවන්හිදී විනිමය අනුපාතිකයෙහි ක්ෂයවීමක් (Depreciation) මගින් නිෂ්පාදන පිරිවැය ඉහළ නැංවෙන අතර එමගින් සමස්ත සැපයුම පහත වැටීමකට ලක් කෙරෙයි. එමෙන්ම මෙම තත්ත්වය සමස්ත ඉල්ලුමෙහි වැඩි වීමක් ඇති වීමට තුඩු දෙන පරිදි අපනයනකරුවන්ගේ ආදායම වැඩි කරයි. මේවායේ ඒකාබද්ධ ප්‍රතිඵලය වනුයේ මිල මට්ටමෙහි ඉහළ යාමකි. මේ අනුව පොලී අනුපාතිකයේ වැඩිවීම සහ විනිමය අනුපාතිකය ක්ෂයවීම යන දෙකම මිල මට්ටම මත එකිනෙකට ප්‍රතිවිරුද්ධ බලපෑම් ඇති කරයි. මෙය වෙනත් ආකාරයකට දක්වන්නේ නම්, පොලී අනුපාතිකයේ අඩු වීමක් සහ විනිමය අනුපාතිකයේ ක්ෂයවීමක් මිල මට්ටමෙහි වැඩි වීමකට හේතුවේ. මුල්‍ය ප්‍රතිපත්තිමය වෙනස්වීම්වලට ප්‍රතිචාර දක්වන බැවින් ද, මෙම අවසාන ඉලක්කයන් වෙත බලපෑම් ඇති කෙරෙන බැවින් ද, මෙම විචල්‍යයන් දෙකෙහි හැසිරීම වෙන් වෙන් වශයෙන් හා ස්වාධීනව නිරීක්ෂනය කිරීම ප්‍රමාණවත් නොවේ. මෙම විචල්‍යයන් දෙකෙහි භරිත අගයක් ලෙස ගැනෙන මුල්‍ය තත්ත්ව දර්ශකය ඒ වෙනුවෙන් භාවිතා කිරීම වඩා යෝග්‍යය. ක්‍රියාත්මක ඉලක්කයක් සේ මුල්‍ය තත්ව දර්ශකය භාවිතා කිරීම මුල්‍ය ප්‍රතිපත්ති සැකසුම් ක්‍රියාවලියේ නම්‍යතාවය වැඩි කරයි. ඇතැම් අවස්ථාවලදී වෙළෙඳපල අවශ්‍යතා මත එක් විචල්‍යයකට මඳ වෙනස් කිරීමක් ද අනෙකුත් විචල්‍යයට ඊට සරිලනසේ ගැලපීම් කිරීමට ද අවශ්‍ය වියහැකි අතර මෙම දර්ශකය මගින් ප්‍රතිපත්ති සම්පාදකයන්ට ඒ සඳහා ඇති ඉඩකඩ පුළුල් කෙරේ. මෙම නම්‍යශීලීභාවය බොහෝ උපකාරී වනුයේ මුල්‍ය අධිකාරියෙහි ඇති බලපෑමෙන් තොරව විනිමය අනුපාතිකය වෙළෙඳපල ක්‍රියාකාරකම් මත නිදහසේ තීරණය වන අවස්ථාවන් වලදීය.

මුල්‍ය ප්‍රතිපත්තියේ වෙනස්කම් අප්‍රමාදව පොලී අනුපාතික සහ විනිමය අනුපාතිකවලට (එනම් මුල්‍ය තත්ව දර්ශකයට) බලපාන අතර මෙම ක්‍රියාත්මක ඉලක්ක අවසාන ඉලක්කය දක්වා ගමන් කිරීමට තරමක් දිගු කාලයක් ගත වේ. එම කාලසීමාව ආර්ථිකයේ ස්වභාවය සහ ව්‍යුහය මත රඳා පවතී. මේ අනුව එක්සත් රාජධානිය සහ කැනඩාව වැනි රටවල මෙම සම්ප්‍රේෂණ කාලසීමාව කාර්තු 8-10 දක්වා පමණ වන අතර, වඩා පුළුල් විවෘත ආර්ථිකයක් පවත්නා ශ්‍රී ලංකාවේ එම සම්ප්‍රේෂණ කාලසීමාව කාර්තු 3-4 දක්වා ප්‍රමාණයක පවතී.

මුල්‍ය තත්ත්ව දර්ශකය සකස් කිරීම සඳහා පොලී අනුපාතික සහ විනිමය අනුපාතික සම්බන්ධ සාපේක්ෂ භාරයන් ලබාගැනීමේ ආකාර කීපයක් ඇත. ප්‍රධාන වශයෙන් විශාල ප්‍රමාණයේ ව්‍යුහාත්මක මාදිලියක් (Large scale stuctural model) හෝ අවප්‍රමාණ කළ මාදිලියක් (reduced form model) හෝ දෛශික ස්වායත්ත මාදිලියක් (Vector autoregressive model) භාවිතා කළහැක. එමෙන්ම මුල්‍ය තත්ත්ව දර්ශකය මූර්ත විචල්‍යයක් (real variable) හෝ නාමික විචල්‍යයක් (nominal variable) සේ ද නිර්මාණය කළ හැක. මහ බැංකු එම දර්ශකයේ පුරෝකථනය කළ මාර්ගය සහ ප්‍රතිපත්තීන්ට ගැලපෙන සේ අවශ්‍ය කරන මාර්ගය යන මාර්ග දෙකම නිර්ණය කරති. මෙම මාර්ග දෙකෙහි සැහෙන අපගමනයක් ඇතිවන අවස්ථාවලදී මුල්‍ය ප්‍රතිපත්තීන්හි වෙනසක් කිරීමෙන් එම මාර්ගයන් ඒකාබද්ධ කළ යුතු ය.

---

[1] අනෙකුත් මාර්ග වනුයේ ප්‍රාප්‍ය ණය පහසුකම් (credit availability) සහ අපේක්ෂිත උද්ධමනයයි. (expected inflation)

**විශේෂ සටහන - 2 (සම්බන්ධයි)**

පදනම් කාලයේ සිට පොලී අනුපාතිකයේ සහ විනිමය අනුපාතිකයේ සිදු වූ අපගමනයන්ගේ හරිත සාමාන්‍යය ලෙස මෙම දර්ශකය ගණනය කරනු ලැබේ.[2] මෙමගින් උද්ධමනය පදනම් වර්ෂයෙහි පැවති මට්ටමෙන් වෙනස් වූ ප්‍රමාණය මත පොලී අනුපාතය හා විනිමය අනුපාතය වෙනස්වීමෙන් ඇති වූ බලපෑම මනිනු ලබයි. සාමාන්‍යයෙන් පොලී අනුපාතිකයේ වෙනස්වීමට සුසංයෝගික භාරය 1 ලෙස ක්‍රමාංකනය කරන අතර විනිමය අනුපාතිකයේ වෙනස්වීමට සුසංයෝගික භාරය (1/W) ලෙස ක්‍රමාංකනය කරයි. මේ සැකැස්ම අනුව පොලී අනුපාතිකයේ ප්‍රතිශතාංක 1 ක වෙනස්වීම විනිමය අනුපාතිකයේ W ප්‍රතිශතකයක වෙනස්වීමකට සමාන වේ. මෙම W භාරය රඳා පවතිනුයේ ආර්ථිකයක විවෘත භාවය මතය. සාපේක්ෂව විවෘත භාවය අඩු රටවල්වල මෙම භාරය 10 වැනි ඉහළ අගයන් (එනම් පොලී අනුපාතිකයෙහි පදනම් ඒකක 100 ක වෙනස්වීමක් විනිමය අනුපාතයෙහි සියයට එකක වෙනස්වීමෙන් ඇතිවන බලපෑම මෙන් දස ගුණයක බලපෑමක් ඇතිකරයි) ගතහැකි අතර වඩා විවෘත සහ ආනයන මත බොහෝ සේ රඳා පවතින රටවල එය 1 වැනි අඩු අගයක් ගනී.[3]

ශ්‍රී ලංකාවේ භාවිතා කළහැකි ක්‍රියාත්මක දර්ශකයක් සේ මූල්‍ය තත්ත්ව දර්ශකයේ ප්‍රයෝජනවත් භාවය ප්‍රදර්ශනය කිරීමට මූර්ත මූල්‍ය තත්ත්ව දර්ශකය සහ උද්ධමනාත්මක පීඩනයන් පුරෝකථනය කිරීමට එයට ඇති හැකියාව භාවිතා කළහැක. ශ්‍රී ලංකාවේ පොලී අනුපාතික සහ විනිමය අනුපාතිකයන් විවෘත වෙළෙඳපොළ මගින් තීරණය වූයේ කෙටි කාලසීමාවක් තුළ බැවින්, මූල්‍ය තත්ව දර්ශකයට අවශ්‍ය භාරයන් ලබාගැනීමට අවප්‍රමාණ කළ සංක්ෂිප්ත මාදිලියක් (parsimoneous model) භාවිතා කරන ලදී. කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ මාසික පදනම මත වෙනස්වීම් (month -to- month changes) උද්ධමන වේගය මැනීමට භාවිතා කරන ලදී. නාමික පොලී අනුපාතිකය වශයෙන් ප්‍රාථමික වෙළෙඳපල තුළ නිර්ණය වන ත්‍රෛමාසික භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධ පොලී අනුපාතිකය භාවිතා කරන ලදී. නාමික පොලී අනුපාතිකය සහ අපේක්ෂිත උද්ධමනය අතර පරතරය මූර්ත පොලී අනුපාතිකය ලෙස භාවිතා කළ අතර, එම අපේක්ෂිත උද්ධමන වේගය ලබා ගැනීමට ආර්ථිකය තුළ තාර්කික අපේක්ෂාවන් (Rational Expectations) පවතින බව උපකල්පනය කරන ලදී. මේ අනුව ඕනෑම මාසයක අපේක්ෂිත උද්ධමනය, ඉදිරි මාස 9 ක කාලය තුළ මාසික පදනම යටතේ ගණනය කළ උද්ධමනයේ සාමාන්‍යය සේ උපකල්පනය කරන ලදී.[4] මූර්ත විනිමය අනුපාතිකය වශයෙන් ප්‍රධාන ආනයනික රටවල් පහක් හා සම්බන්ධ සඵල විනිමය අනුපාතිකය (Real Effective Exchange Rate) භාවිතා කරන ලදී. පදනම් කාලය වශයෙන් 1993 වර්ෂයේ ජනවාරි මස තෝරා ගන්නා ලදී. මූල්‍ය ප්‍රතිපත්ති වෙනස් කිරීමේ සිට අවසාන ඉලක්ක දක්වා එය පැතිරීමට ගතවන කාලය මාස 9 ක් ලෙස සොයා ගන්නා ලදී. මාස 9 ක විලම්භ (lagged) මූර්ත පොලී අනුපාතිකය සහ සඵල විනිමය අනුපාතිකය, දැනට පවත්නා උද්ධමන අනුපාතිකය මත ප්‍රතිපායනය කිරීම මගින් අවශ්‍ය භාරයන් සකසන ලදී.[5] මේ අනුව, මූර්ත පොලී අනුපාතිකයේ සහ සඵල විනිමය අනුපාතිකයේ ප්‍රතිපායන සංගුණක අතර අනුපාතය, මූල්‍ය තත්ත්ව දර්ශකයේ විනිමය අනුපාතික හැසිරීමෙහි භාරය (මූල්‍ය තත්ත්ව දර්ශක අනුපාතය හෝ W) වේ. මේ අනුව ඇස්තමේන්තු කළ මූල්‍ය තත්ත්ව දර්ශක අනුපාතය 1.5 වූ අතර එය ශ්‍රී ලංකා ආර්ථිකයේ සාපේක්ෂ විවෘත භාවය පෙන්නුම් කරයි.

මූර්ත පොලී අනුපාතිකයේ සහ විනිමය අනුපාතිකයේ හැසිරීම පළමුවන රූප සටහනෙන් දක්වා ඇත. මූර්ත විනිමය අනුපාතිකයේ ඉහළට ඇති වූ අපගමනයන් මගින් විනිමය අනුපාතිකයේ අගය ඉහළ යාමක් සහ උද්ධමනික පීඩනයන්හි අඩුවීමක් (reduction in inflationary pressures) පෙන්නුම් කරයි. එසේම, පහළට ඇති වූ අපගමනයක් විනිමය අනුපාතිකයේ ක්ෂයවීමක් සහ උද්ධමනික පීඩනයන්හි වැඩිවීමක් පෙන්නුම් කරයි. මූර්ත පොලී අනුපාතිකයේ ඉහළට ඇති වූ අපගමනයක්ද උද්ධමනික පීඩනයන්හි අඩු වීමක් පෙන්නුම් කරයි. මේ අනුව මූල්‍ය තත්ත්ව දර්ශකයේ ඉහළට ඇති වූ අපගමනයන් උද්ධමනික පීඩනයන්හි අඩු වීමක් පෙන්නුම් කරන අතර පහළට ඇතිවන අපගමනයන් එම පීඩනයන්හි

---

[2] මූල්‍ය තත්ව දර්ශකය = [ මූර්ත පොලී අනුපාතිකය - පදනම් කාලයේ තිබූ මූර්ත පොලී අනුපාතිකය] + 1 / W [{ සඵල විනිමය අනුපාතිකය (සවිඅ)/පදනම් කාලයේ සවිඅ - 1 } x100] මෙහිදී W යනු සවිඅ හා සම්බන්ධ භාරයයි.

[3] Mayes, David G. and Viren Matti, 1998 ' Exchange Rate Considerations in a Small Open Economy: A Critical Look at the MCI as a Possible Solution ' mimeo , South Bank University and Bank of Finland

[4] දත්තයන් තවමත් නොමැති ඉදිරි කාලපරිච්ඡේදයේ අපේක්ෂිත උද්ධමනය එම උද්ධමනයේ දිගුකාලීන හැසිරීම් රටාව සහ අනාගත උද්ධමනය පිළිබඳ නිල වාර්තා භාවිතයෙන් සකසා ගන්නා ලදී.

[5] පොලී අනුපාතය සහ ස.වි.අ.සම්බන්ධ මූර්ත ප්‍රතිපායනයෙන් ලබා ගන්නා ප්‍රතිපායන සංගුණක $\alpha$ හා $\beta$ වේ නම් $(1 / W) = \beta/\alpha$ සහ $W = \alpha / \beta$ අනුපාතය ලෙස ගැනේ.


**විශේෂ සටහන - 2 (සම්බන්ධයි)**


වැඩිවීමක් පෙන්නුම් කරයි. මාස 9 ක විලම්භ මූල්‍ය තත්ත්ව දර්ශකයේ හැසිරීම සහ උද්ධමන වේගයේ අපගමනයන් පෙන්වන දෙවන රූප සටහන ඉහත පෙන් වූ හැසිරීම මැනවින් පෙන්වයි.

මෙම මූල්‍ය දර්ශකය භාවිතා කරන මහ බැංකු, එය විනිමය අනුපාත සහ පොලී අනුපාත තීරණය කිරීමට යොදා ගන්නා දැඩි නීතියක් ලෙස නොව ප්‍රතිපත්තීන් සැකසීමට සුදුසු උපකාරකයක් ලෙස භාවිතා කරන බව කිව යුතුය. එමෙන්ම එම දර්ශකය පොලී අනුපාතිකයේ සහ විනිමය අනුපාතිකයේ බලපෑමෙන් සමස්ත ඉල්ලුම සහ සැපයුමේ ඇතිවන වෙනස්කම් තුළින් ජනනය වන උද්ධමනකාරී පීඩනයන් මැන ගැනීමට උපකාරී වේ. මේ අනුව මූල්‍ය තත්ත්ව දර්ශකය ශීර්ෂ උද්ධමනය (Headline Inflation) පුරෝකථනය කිරීමට අපොහොසත් වේ. මීට හේතුව ශීර්ෂ උද්ධමනය ඇතිවනුයේ මූල්‍ය තත්ත්ව දර්ශකය මඟින් පෙන්නුම් කරන පීඩන මෙන්ම, සැපයුමෙහි සහ ඉල්ලුමෙහි ඇතිවන අනෙකුත් පරිබාහිර පීඩන එනම් ස්වායත්ත පරිභෝජන වෙනස්කම්, කාලගුණික තත්ත්වයන් මත නිෂ්පාදනයේ ඇතිවන වෙනස්කම් යන දෙකෙහිම ඒකාබද්ධ ප්‍රතිඵලයක් වශයෙනි. එමෙන්ම මූල්‍ය තත්ත්ව දර්ශකය ක්‍රියාත්මක ඉලක්කයක් ලෙස මිස මූල්‍ය ප්‍රතිපත්තියක මූලික මිනුමක් සේ ද භාවිතා නොකළ යුතුය. මෙම දර්ශකය නිර්ණය කිරීමේදී තාක්ෂණික අඩුපාඩු ද ඇති වේ. දනට භාවිතා කරන විචල්‍යයන් දෙක හැරුණු කොට තවත් විචල්‍යයන් එකතු කළයුතු ද යන්න තීරණය කළයුතුව ඇත. එමෙන්ම සාපේක්ෂ භාරයන් නිර්මාණය කිරීමේදී ඇතිවන ගැටළු නිරාකරණය කළ යුතුව ඇත. මෙම දර්ශකයට අලුතෙන් විචල්‍යයන් එක් කිරීම, දර්ශකය සඳහා වඩා නිරවද්‍ය භාරයන් ඇස්තමේන්තු කිරීම සහ ක්‍රියාත්මක ඉලක්කයක් ලෙස එහි උචිත භාවය නිර්ණය කිරීම හා අදාළව පර්යේෂණ කටයුතු කෙරෙමින් පවතී.

මෙම දර්ශකය භාවිතා කරන ප්‍රධාන මහ බැංකුවක් වූ නවසීලන්ත සංචිත බැංකුව එහි භාවිතය 1999 පෙබරවාරි මාසයේදී නතර කරන ලදී. ආසියානු අර්බුදය නිසා නවසීලන්තයේ විනිමය අනුපාතිකය දැඩි ලෙස ක්ෂය වූ අතර, මූල්‍ය තත්ත්ව දර්ශකයේ අවශ්‍ය ගමන් මඟ පවත්වා ගැනීමට ඉහත ක්ෂය වීමට සරිලන සේ පොලී අනුපාතික ඉහළ නැංවීමට සිදුවිය. පොලී අනුපාතිකයන්හි වූ මෙම තියුණු වැඩිවීම නිසා නවසීලන්ත ආර්ථිකය සැලකිය යුතු ලෙස දුර්වල විය. පොලී අනුපාතිකයෙහි සිදුකල යුතු වෙනස්කම් තීරණය කිරීමේදී දනට නවසීලන්ත මහ බැංකුව සුනම්‍ය පොලී අනුපාතික ප්‍රතිපත්තියක් (relaxed interest rate policy) භාවිතා කරයි.

කෙසේ නමුත් මූල්‍ය සහ විනිමය ප්‍රතිපත්ති තීරණය කිරීමේ දී මෙම දර්ශකය දෘඪ උපකරණයක් ලෙස භාවිතා නොකළ යුතුය. එහෙත් ප්‍රතිපත්ති බලපෑම ඇගයීමට සහ අනාගත ප්‍රතිපත්ති සඳහා මඟපෙන්වීමට මෙම දර්ශකය මඟින් ප්‍රයෝජනවත් සංකල්පමය රාමුවක් සැපයේ.



මඟින් එහි ගුවන් යානා සංඛ්‍යාව වැඩි කිරීමේ වැඩපිළිවෙල සඳහා අත්තිකාරම් වශයෙන් ගෙවන ලද එ.ජ. ඩොලර් දශ ලක්ෂ 48 ක මුදල නිසා ප්‍රාග්ධනය පිටතට ගලා යාමයි.

ජපානයේ යෙන් අධි ප්‍රමාණය වීම හේතුකොටගෙන ණය තොගය එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 200 කින් පමණ ඉහළ නැංවිණි. ණය/දළ දේශීය නිෂ්පාදිත අනුපාතය සියයට 56 ක පැවතිණි. මෙම වැඩිවීමෙන් ප්‍රතිශත අංක 1 කට පමණ හේතු වූයේ යෙන් අතිප්‍රමාණය වීමයි. කෙටිකාලීන ණය තොගය, මුළු ණය ප්‍රමාණයෙන් සියයට 6 ක් පමණක් විය. 1998 දී ශ්‍රී ලංකාවේ ණය සේවා අනුපාතය සියයට 11 ක් ලෙස ඇස්තමේන්තු කරන ලද අතර එය 1997 අගයට සමාන වේ.

විනිමය වෙළෙඳපොළහි තුලිත භාවය සඳහා මැදිහත් වන්නකුගේ කාර්ය භාරය ඉටු කරමින් මහ බැංකුව විදේශ විනිමය අනුපාතිකය නම්‍යශීලීව පවත්වා ගැනීම අඛණ්ඩව සිදු කරන ලදී. විදේශීය මුදල් වර්ග විසි හතරකින් යුත් ව්‍යවහාර මුදල් පැසකින් සාද ගන්නා මූර්ත සඵල විනිමය අනුපාතිකය (REER) ඇතුළුව විනිමය වෙළෙඳපොළ දර්ශක සහ මුදල් වෙළෙඳපොළෙහි දර්ශක ගණනාවක් මඟින් විනිමය අනුපාතිකයේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කරනු ලැබිණි. එ.ජ. ඩොලර් මිලදී ගැනීම් හා විකිණීම් සඳහා වූ මහ බැංකුවේ විනිමය අනුපාතික අතර වෙනස සියයට 2 ක් විය. ලෝක විනිමය වෙළෙඳපොළවල් 1997 ට වඩා චංචල භාවයකට පත් විය. ජපානය ඉක්මණින් යථා තත්ත්වයට පත් වීමේ ඉඩ ප්‍රස්තා අඩු වීම නිසා එ.ජ. ඩොලර්/යෙන් අනුපාතිකයේ චංචල භාවය 1997 ට සාපේක්ෂව 1998 දී දෙගුණයකින් පමණ වැඩි විය. 1998 දී ශ්‍රී ලංකාවේ රුපියලේ අගය සියයට 9.6 කින් අවප්‍රමාණය විය. මූර්ත සඵල විනිමය අනුපාතයේ අගය සියයට 12 කින් අවප්‍රමාණ වූයෙන් මෙම 'තරඟකාරිභාවය පිළිබඳ දර්ශකයේ අගය' 1997 ජූලි මාසයේ පැවැති මට්ටමට පත් විය.

1998 වසරේ මාස 4 ක ආනයන මූල්‍යනය කිරීමට දළ නිල විදේශ වත්කම් ප්‍රමාණවත් විය. නිල වත්කම් සහ වාණිජ බැංකුවල විදේශ වත්කම් ඇතුළත් මුළු දළ විදේශ වත්කම් ප්‍රමාණය එ.ජ. ඩොලර් දශ ලක්ෂ 2,907 ක්වූ අතර එය මාස 5.9 ක ආනයන සඳහා ප්‍රමාණවත් විය.


## 1.9 මූල්‍ය අංශය


මූල්‍ය ප්‍රතිපත්තිය දැඩි අස්ථායී විදේශ වාතාවරණයක් යටතේ ක්‍රියාත්මක කෙරුණි. ගෝලීය මූල්‍ය අර්බුදය තුළ ලෝකයේ බැංකු කර්මාන්තය සහ මූල්‍ය වෙළෙඳපොළවල් තදබල අස්ථායීතාවයකට මුහුණ පාමින් සිටියහ. දේශීය අංශය ගත් කළ, විශාල රාජ්‍ය මූල්‍ය හිඟය පියවීමට රජයට තවදුරටත් සම්පත් අවශ්‍ය විය. එමනිසා, 1998 දෙවන භාගය තුළදී උද්ධමනය සැලකිය යුතු ලෙස අඩු වුවද, මූල්‍ය ප්‍රතිපත්තීන් තවදුරටත් ලිහිල් කිරීම මඟින් පොලී අනුපාතික අඩු කරලීමට නොහැකි විය.

කලාපීය මූල්‍ය වෙළෙඳපොළවල වූ අවිනිශ්චිතතාවය සහ 1998 ආරම්භයේ දක්නට ලැබූ තරමක් ඉහළ දේශීය උද්ධමනය නිසා වර්ෂයේ මුල් මාස කිහිපය තුළදී ප්‍රතිපත්ති දැඩි කිරීම අවශ්‍ය විය. මැයි මස මැද වනවිට ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකය සියයට 12.00 සිට සියයට 11.65 දක්වා අඩු කිරීම මඟින් දෙවන කාර්තුවේදී සුළු ලිහිල් බවක් පෙන්නුවද, විදේශ විනිමය වෙළෙඳපොළෙහි නැවතත් ඇති වූ චංචලතාවය හේතුවෙන් ප්‍රතිපත්ති තවදුරටත් දැඩි කරලීම අවශ්‍ය විය. කෙසේ වුවද, ජාත්‍යන්තර වෙළෙඳපොළවල චංචලතාවය සහ ඒ හා ආශ්‍රිතව වූ දේශීය සමපේක්ෂණ ක්‍රියාවලියක් නැවත ඇති වීම නිසා, මැයි මසදී ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකය සියයට 12.00 දක්වා නැවතත් වැඩි කිරීම මඟින් ප්‍රතිපත්තීන් දැඩි කරලීමට මහ බැංකුවට සිදු විය.

**1.9 රූප සටහන**

**මුදල් හා ණය**



**1.5 සංඛ්‍යා සටහන**
**මූල්‍ය ආයතන වලින් පෞද්ගලික අංශයට දුන් ණය**

(රුපියල් දශ ලක්‍ෂ)

| | 1994 දෙසැම්බර් | 1995 දෙසැම්බර් | 1996 දෙසැම්බර් | 1997 දෙසැම්බර් | 1998 දෙසැම්බර්(අ) |
|---|---|---|---|---|---|
| වාණිජ බැංකු | 163,278 | 210,704 | 229,771 | 263,139 | 294,064 |
| දේශීය ඒකක | 140,004 | 179,825 | 193,842 | 216,030 | 243,549 |
| රාජ්‍ය බැංකු | 85,728 | 105,781 | 106,007 | 111,650 | 122,512 |
| අනෙකුත් වාණිජ බැංකු | 54,276 | 74,044 | 87,835 | 104,380 | 121,037 |
| වි.ව්‍ය.මු.බැ.ඒකක | 23,274 | 30,879 | 35,929 | 47,109 | 50,515 |
| රාජ්‍ය බැංකු | 9,813 | 10,047 | 10,393 | 14,649 | 16,734 |
| අනෙකුත් වාණිජ බැංකු | 13,461 | 20,832 | 25,536 | 32,460 | 33,781 |
| වෙනත් මූල්‍ය ආයතන | 33,960 | 38,023 | 62,670 | 73,627 | 89,675 |
| ප්‍රා.ග්‍රා.සං.බැ. සහ ප්‍රා.සං.බැංකු | 1,872 | 2,406 | 2,888 | 3,397 | 3,750 |
| බලපත්‍රලත් විශේෂිත බැංකු | 23,987 | 28,349 | 46,118 | 54,053 | 66,938 |
| සංවර්ධන මූල්‍ය ආයතන (ආ) | 16,935 | 20,037 | 31,411 | 38,023 | 47,320 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 3,108 | 3,441 | 8,537 | 8,150 | 9,495 |
| නිවාස (ඇ) | 3,945 | 4,871 | 6,170 | 7,344 | 8,150 |
| වෙනත් ඉතිරිකිරීම් සහ සංවර්ධන බැංකු (ඈ) | - | - | - | 536 | 1,972 |
| මූල්‍ය සමාගම් | 8,100 | 7,269 | 13,664 | 16,178 | 18,987 |
| පෞද්ගලික අංශයේ මුළු ණය | 197,238 | 248,727 | 292,441 | 336,766 | 383,739 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව


(අ) තාවකාලික
(ආ) ලං.ස.මූ.ස.බැංකුව හා ජාතික සංවර්ධන බැංකුව අයත් වේ.
(ඇ) රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව සහ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව අයත් වේ.
(ඈ) ප්‍රමුඛ ඉතිරිකිරීම් හා සංවර්ධන බැංකුව සහ සණස සංවර්ධන බැංකුව අයත් වේ.


මෑත කාලීන වූ සංවර්ධනයන් තුළින් ඒකාග්‍ර විනිමය හා මූල්‍ය ප්‍රතිපත්තීන් පවත්වා ගැනීමේ අවශ්‍යතාවයද පැහැදිලිව පෙන්නුම් කෙරුණි. ගෝලීය මූල්‍ය අර්බුදය සහ එහි ප්‍රතිඵලයක් වූ ජාත්‍යන්තර මුදල් වෙළෙඳපොළවල ඇති වූ චංචලතාවය දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙහි යම් අවිනිශ්චිතතාවයක් ඇති වීමට හේතු විය. වෙළෙඳපොළේ ඇතැම් අංශ විසින් රුපියලෙහි විශාල අවප්‍රමාණයක් ප්‍රබල ලෙස ඉල්ලා සිටින තත්ත්වයක් සමග මෙම අවිනිශ්චිතතාවය 1998 වර්ෂයේදී ද පැවතිනි. සාර්ව ආර්ථික තත්ත්වයන්ගේ වෙනස්වීම් පිළිබිඹු කරමින් විදේශීය විනිමය අනුපාතිකය වෙනස් වීමට ඉඩ හරිනු මිස, දැනට පවතින පාලිත චල විනිමය අනුපාතික ක්‍රමය යටතේ එවැනි අක්‍රමික වූ අවප්‍රමාණයක් කිරීම අවශ්‍ය නොවීය. කෙසේ වුවද, උද්ධමන අනුපාතිකයේ පහත වැටෙන උපනතියක් තිබියදීත් විදේශීය විනිමය වෙළෙඳපොළෙහි අනවශ්‍ය ලෙස මැදිහත් නොවී විදේශීය විනිමය අනුපාතිකයේ පීඩනය සමනය කිරීමට කෙටිකාලීන පොලී අනුපාතික ඉහළ මට්ටමක පැවතීමට ඉඩ හරින ලදී. ඒ අනුව, සාපේක්‍ෂ වශයෙන් අඩු පොලී යටතේ ලබා ගන්නා ඒක්‍ෂණ වෙළෙඳපොළ අරමුදල් විදේශ විනිමය මිලට ගැනීමේ සමපේක්‍ෂණ කටයුතුවලට යොදා ගැනීම අධෛර්යමත් කිරීම සඳහා ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකය 1997 දෙසැම්බර් මස පදනම් අංක 200 කින්ද 1998 ජනවාරි මස පදනම් අංක 100 කින්ද තවදුරටත් වැඩි කරන ලදී. මහ බැංකුවේ වට්ටම් සහ ප්‍රතිවට්ටම් අනුපාතික සහ එම අනුපාතික අතර පරතරයද මෙම ප්‍රතිපත්ති දැඩි කිරීමට අනුකූල වන ලෙස ගලපන ලදී. මෙම පියවර සහ නැගෙනහිර ආසියාවේ මූල්‍ය වෙළෙඳපොළ සහ විනිමය අනුපාතික ස්ථාවරතාවයන් යම් තරමකට යහපත් අතකට හැරීමත්, සමපේක්‍ෂණ පීඩනයන් අඩු කරලීමට සමත් විය. මාර්තු සහ අප්‍රේල් මාසවල වාණිජ බැංකු විසින් මහ බැංකුවට එක්සත් ජනපද ඩොලර් දශ ලක්‍ෂ 54 ක් විකුණන ලදී.


ප්‍රතිමිලදී ගැනීමේ අනුපාතිකය මූලික සංඥා කිරීමේ යන්ත්‍රණය ලෙස ක්‍රියා කරමින්, විවට වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය මූල්‍ය ප්‍රතිපත්තියෙහි මූලික උපකරණය ලෙස යොදා ගැණුනි. මැයි මස සිට භාණ්ඩාගාර බැඳුම්කර දැරීම් සිය ද්‍රවශීල වත්කම්වල කොටසක් ලෙස සැලකීමට වාණිජ බැංකුවලට ඉඩ දුන් අතර, වාණිජ බැංකුවල ද්‍රවශීලතා කළමනාකරණයේදී ඒවා මහ බැංකුවේ ද්විතීයික වෙළෙඳ-පොළේ ගණුදෙනු සඳහා යොදා ගැනීමට ඉඩ දෙන ලදී. නොවැම්බර් මාසයේදී කෙටිකාලීන පොලී අනුපාතික ස්ථායී

කිරීම සඳහා එක් දින ප්‍රතිවිකුණුම් පහසුකම නැවත හඳුන්වා දෙන ලදී. එක් දින ප්‍රතිමිලදී ගැනීම් පහසුකම සහ එක් දින ප්‍රතිවිකුණුම් පහසුකම ද සැපයීම මගින් ඒකෂණ වෙළෙඳපොළෙහි චංචලතාවයන් ඇති වීම වැළැක්වීමටත් එහි ස්ථායීතාවයක් ඇති කරලීමටත් මහ බැංකුව බලාපොරොත්තු විය.

**1.10 රූප සටහන**
**පොලී අනුපාතික**




ද්‍රවශීලතාවය උකහා ගැනීම සඳහා වර්ෂය පුරා ඕනෑම අවස්ථාවක මහ බැංකු සුරැකුම්පත් යොද ගැනීමට හැකි විය. මෙම සුරැකුම්පත්වල පරිණත කාලය දින 7 ක් වූ අතර එළදව දින 7 කට අදළ ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකයට සමාන විය. මහ බැංකුවේ විවට වෙළෙඳ කටයුතු සඳහා එය සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණවත් වුයෙන්, 1998 දී මෙම පහසුකම යොද නොගැණුනි.


මැදි සහ දිගුකාලීන ණය පහසුකම සහ වෙනත් කිසිම කෙටිකාලීන පහසුකමක් යටතේ ප්‍රතිමූල්‍ය නොසැපයීමේ ප්‍රතිපත්තිය මහ බැංකුව විසින් දිගටම ගෙන යන ලදී. මහ බැංකුව වෙත දිගටම ණය ආපසු ගෙවීම් සිදු කෙරුන හෙයින් අතීතයේ සපයා නොපියවා තිබූ ප්‍රතිමූල්‍ය ණය 1997 අවසානයේදී පැවැති රුපියල් දශ ලක්ෂ 1,691 සිට 1998 අවසානයට රුපියල් දශ ලක්ෂ 1,122 ක් විය.

## මුදල් සැපයුම

උද්ධමන පීඩනය අඩු කරලීමට උපකාරී වෙමින්, ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුමෙහි ($M_{2b}$), එනම් විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකද ඇතුළත් වන පුළුල් මුදල් සැපයුමෙහි, වර්ධනය 1997 දී වාර්තා වූ සියයට 15.6 සිට 1998 දී සියයට 13.2 දක්වා අඩු විය. ශුද්ධ විදේශීය ලැබීම් සැලකිය යුතු ලෙස පහත වැටීම සහ පෞද්ගලික අංශයට දුන් ණය අඩු වේගයකින් වර්ධනය වීම මගින්, රාජ්‍ය අංශයට දුන් ණය වර්ධනය ඉහළ යාමෙන් වූ ප්‍රසාරණාත්මක බලපෑම සමහන් කරලීය. 1997 වර්ෂයේදී සියයට 4 ක අඩු වීමට සාපේක්ෂව රජයට දුන් ශුද්ධ ණය සියයට 43 කින් වැඩි විය. ආර්ථික වර්ධනයේ අඩු වීමක් පිළිබිඹු කරමින් පෞද්ගලික අංශයට දෙන ලද ණය 1997 සියයට 14.5 සමග සසඳන කල 1998 වර්ෂයේදී සියයට 12 කින් වැඩි විය. ආර්ථික ක්‍රියාකාරීත්වයෙහි අඩු වීමත් සමඟ ශක්තිමත් කරනු ලැබූ බැංකු අධීක්ෂණ කටයුතුද පෞද්ගලික අංශයට දෙන ලද ණය වර්ධනය අඩු වීමට දයක විය.

පෞද්ගලික අංශයට දුන් ණය අඩු වීම විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක සම්බන්ධව වඩාත් කැපී පෙනුන අතර, එම ඒකකවල ණය වර්ධනය 1997 දී වූ සියයට 31 සිට 1998 දී සියයට 7 දක්වා පහත වැටුණි. විදේශීය මූල්‍ය වෙළෙඳපොළවල දිගටම පැවති අවිනිශ්චිතතාවය සහ ශ්‍රී ලංකා ආනයනයන්හි වර්ධනය අඩුවීම වි.ව්‍ය.මු.බැ. ඒකකයන් මගින් සැපයූ ණය සංකෝචනය කිරීමකට මෙන්ම ඔවුන්ගේ ශුද්ධ විදේශීය වගකීම් අඩු කර ගැනීමටද හේතු විය. විනිමය වෙළෙඳපොළවල පැවති චංචල භාවය මෙන්ම සාපේක්ෂ වශයෙන් අඩු මට්ටමක පැවති දේශීය පොලී අනුපාතිකයන්ද නිසා විදේශීය ව්‍යවහාර මුදල් ඒකකයන්ගෙන් ණය ලබා ගැනීම කෙරෙහි දේශීය ව්‍යවසායකයන්ගේ ආකර්ශනීයත්වය අඩු විය. විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක, ශ්‍රී ලංකා රජයට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 100 ක සමූහ ණයක් ලබා දීමටද සිය අරමුදල් යොදවූහ. දේශීය බැංකු ඒකක විසින් සැපයූ ණය, 1997 දී වූ සියයට 11.4 වර්ධනයට සාපේක්ෂව 1998 දී සියයට 12.7 ක් වූ වැඩි

**1.11 රූප සටහන**
**රජයේ සුරැකුම්පත් සඳහා ඵලද වක්‍රය**




වේගයකින් වර්ධනය විය. මේ හේතුවෙන්, වි.ව්‍යා.මු.බැ. ඒකක විසින් දෙන ලද ණය ප්‍රමාණයෙහි අඩු වීම යම් දුරකට සමනය කරනු ලැබීය. ණය වර්ධනය කෙරේ වැඩි වශයෙන් දායක වූයේ විදේශීය බැංකු නොව දේශීය වාණිජ බැංකු බව පෙනේ.

1997 දී දක්නට ලැබුු සියයට 5 ක පහත වැටීමකට සාපේක්ෂව 1998 දී රාජ්‍ය සංස්ථාවලට දුන් ණය සියයට 26 කින් අඩු විය. ඛනිජ තෙල් සහ තිරිඟු සඳහා ජාත්‍යන්තර මිල ගණන් අඩු වීම නිසා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවේ මූල්‍ය තත්ත්වය යහපත් වීම හේතුවෙන්, එම ආයතනයන්හි බැංකුවලට ඇති වගකීම් අඩු කිරීමට හැකි විය. මෙමගින් වූ බැංකුවල ද්‍රවශීලතා වර්ධනය, ඔවුන් රජයේ ණය උපකරණ වල කරනු ලැබූ ආයෝජන වැඩි කිරීමට හේතු විය.

## සංචිත මුදල් සැලසුම් කිරීම

මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ වැදගත් අතරමැදි ඉලක්කයක් ලෙස මහ බැංකුව සංචිත මුදල් (අධි බලැති මුදල් හෙවත් පදනම් මුදල්) දිගටම භාවිතා කරනු ලැබීය. උද්ධමන පීඩනය අඩු කිරීම සඳහා සංචිත මුදල්වල අධික ප්‍රසාරණය වලක්වනු ලැබූ අතර ද්‍රවශීලතා හිඟතාවයන් හේතුවෙන් ආර්ථික කටයුතුවලට බාධාවක් නොවීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක්ද වෙළෙඳපොළට සපයනු ලැබීය. සංචිත මුදල් පුළුල් මුදල් සැපයුමේ වර්ධනයට වඩා අඩු අනුපාතිකයකින්, එනම් සියයට 9 කින් වැඩි විය. ඒ අනුව, 1998 දී මූල්‍ය ප්‍රතිපත්තියෙහි සුළු දැඩි බවක් පෙන්නුම් කරමින් පුළුල් මුදල් සංගුණකය 1997 අවසානයේදී 3.98 සිට 1998 අවසානයේදී 4.07 දක්වා සුළු වශයෙන් වැඩි විය.

## 1.10 ප්‍රශ්න සහ ගැටළු

1998 දී ශ්‍රී ලංකා ආර්ථිකය ලෝක මූල්‍ය වෙළෙඳපොළෙහි පැවැති කැළඹීමට මුහුණදීමේ හැකියාව තවදුරටත් පෙන්නුම් කළ අතර, සංවර්ධනය වෙමින් පවත්නා අනෙකුත් බොහෝ රටවල්වලට වඩා යහපත් ආර්ථික ක්‍රියාකාරිත්වයක් වාර්තා කළේය. මේ අනුව 1997 ට වඩා පහළ මට්ටමක උද්ධමනයක් හා සේවා වියුක්තියක්ද, සමස්ත ගෙවුම් ශේෂයෙහි අතිරික්තයක් හා සාපේක්ෂ වශයෙන් ස්ථාවර මූල්‍ය වෙළෙඳපළක්ද සහිතව ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 5 කට ආසන්න ආර්ථික වර්ධන වේගයක් වාර්තා කළේය. 1997 වාර්ෂික වාර්තාවෙහිද සඳහන් කළ පරිදි ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළ කැළඹීමට සාර්ථක අයුරින් මුහුණ දීමට හැකි වූයේ කරුණු කිහිපයක් නිසාය. පූර්ණ වශයෙන් ලිහිල් කරන ලද ජංගම ගිණුම සමග වඩාත් පරීක්ෂාකාරී ලෙස කෙටිකාලීන ණය අධික ලෙස ඒකරාශීවීම මහ හැරවීම පිණිස, ප්‍රාග්ධන ගිණුම පාලනය කිරීමක්ද, නම්‍යශීලී ආකාරයෙන් විනිමය අනුපාතික කළමනාකරණයද, සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධීකරණය දියුණු කිරීමද, මූල්‍ය ආයතන සඳහා වූ පාලනය හා අධීක්ෂණ කටයුතු ශක්තිමත් කිරීම ද ඒ අතර වේ.

1998 දී ළඟා කරගත් ආර්ථික වර්ධන අනුපාතිකය, 1980-89 කාලච්ඡේදයේ දී අත්කර ගනු ලැබූ සාමාන්‍ය වර්ධන වේගය වන සියයට 4.2 ට වඩා ඉහළ වූ අතර, 1990-97 කාලච්ඡේදයේදී ළඟා කරගත් සියයට 5.3 ක වර්ධන වේගයට වඩා තරමක් පහළ අනුපාතිකයකි. කෙසේ වෙතත්, මෙය දිගුකාලීන වර්ධන අනුපාතිකය වන සියයට 5 ට ආසන්න විය. 1998 දී මුහුණ පෑ ප්‍රධානම අභියෝගය වූයේ මූල්‍ය හා මිල ස්ථායීතාවට බාධා නොවන පරිදි සැලකියයුතු ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගැනීම වූ අතර මෙම අරමුණ සාක්ෂාත් කරගන්නා ලදී. මැදිකාලීන අරමුණු වන්නේ, උද්ධමනකාරී නොවන ආර්ථික වර්ධනයක් තුළින් ජීවන මට්ටමෙහි වේගවත් වැඩිදියුණුවීමක් අත්කර ගැනීම, වඩා හොඳ ආදායම් ව්‍යාප්තියක් සහ යහපත් ගෙවුම් තුලන තත්ත්වයක් අත්පත් කර ගැනීමත්ය.

මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා යෝජිත ප්‍රතිපත්ති අතර, වඩා වේගවත් ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීමට බාධා පමුණුවමින් තවදුරටත් ඉතිරිව පවත්නා ව්‍යුහාත්මක දුර්වලතාවන් ඉවත්කර ලීම ප්‍රධාන වේ. මූල්‍ය වෙළෙඳපොළ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම, රජය සතු මූල්‍ය ආයතනවල වාණිජමය ශක්‍යතාව වැඩිදියුණු කිරීම, ශ්‍රම වෙළෙඳපොළ වඩා නම්‍යශීලී කරලීම හා ශ්‍රම ඵලදායිතාව වැඩිකිරීම, රාජ්‍ය සේවය වඩා කාර්යක්ෂම හා ඵලදායී කිරීම පිණිස ප්‍රතිසංස්කරණය කිරීම, අයවැය මත ඇති දැඩි පීඩනය අඩුකරලීම හා උද්ධමනය හේතුවෙන් විශ්‍රාම ප්‍රතිලාභ ක්ෂයවීම මගහැරවීම සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම, වාණිජමය පැවැත්ම වැඩිදියුණු කරලීමේ අරමුණ සහිතව රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණය කිරීම සහ විකෘතිවීම් අඩුකර ආදායම ඉහළ මට්ටමක පවත්වා ගැනීමට හැකිවන පරිදි බදු ක්‍රමය සරල කරලීම පිණිස බදු ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම ද මෙම ප්‍රතිපත්ති නිර්දේශයන්වලට ඇතුලත් වේ. මීට අමතරව, මෑතකාලීන ලෝක මූල්‍ය අර්බුදය හා සම්බන්ධව සලකා බලන විට මූල්‍ය ක්‍රමයෙහි ශක්තිමත්භාවය හා මූල්‍ය ආයතන පාලනය වැඩිදියුණු කිරීම පිළිබඳව වැඩි අවධානයක් යොමු කළයුතු වේ. ඇතැම් අංශවල, විශේෂ-

යෙන්ම මූල්‍ය වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ, මූල්‍ය වෙළෙඳපොළ ශක්තිමත්භාවය වැඩිදියුණු කිරීම, පෞද්ගලික අංශයේ සහභාගිත්වය තුළින් රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය කිරීම සහ තීරුබදු ද ඇතුලත්ව බදු ප්‍රතිසංස්කරණවල සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇත. එහෙත්, අනෙකුත් අංශවල ප්‍රගතිය ප්‍රමාණවත් නොවේ. ඒ අතරම, කෙටිකාලීන අභියෝග සහ බාධාකාරී ප්‍රවනතාවන් කිහිපයක් පිළිබඳව ද විශේෂයෙන් පෙන්වා දිය යුතුව ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අර්බුදයෙන් පැතිර යන බලපෑම්වලට ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළ දැඩි ලෙස හසු නොවුවද, අඛණ්ඩව පැවතෙන ලෝක ආර්ථික අවපාතය, ශ්‍රී ලංකාවේ අපනයන කෙරෙහි බලපෑමේ තර්ජනයක් මතු වී තිබේ. පසුගිය සිව් වසර තුළදී ශ්‍රී ලංකාව, අපනයන පරිමාවේ සියයට 8 ක වාර්ෂික වර්ධන අනුපාතිකයක් පවත්වා ගන්නා ලදී. 1997 දී අපනයන පරිමාව සියයට 11 කින් වර්ධනය වූ අතර, එය ලෝක අපනයන වර්ධන වේගය සමඟ මෙන්ම දියුණුවන රටවල අපනයන වර්ධනය වේගය සමග ද සැසඳිය හැකිය. 1998 දී ලෝක අපනයන වර්ධනය සියයට 3.6 දක්වා දැඩි ලෙස සංකෝචනය වීමත් සමගම සංවර්ධනය වන රටවල අපනයන වර්ධනය සියයට 1.8 දක්වාත්, ශ්‍රී ලංකාවේ අපනයන වර්ධනය සියයට 0.1 දක්වාත් අඩුවිය. 1999 පිළිබඳ අපේක්ෂාවන් එතරම් දිරිගන්වන සුළු නොවේ. 1999 දෙවැනි භාගයේදී ලෝක වෙළෙඳාම එක්තරා දුරකට යථා තත්ත්වයට පත්වේ යැයිද, දියුණුවන රටවල අපනයන පරිමාව සියයට 4.7 කින් වර්ධනය වේයැයි ද අපේක්ෂා කෙරේ. කෙසේවෙතත්, ඉදිරි වසර දෙක තුළදී ලෝක වෙළෙඳාම සම්පූර්ණ වශයෙන් යථා තත්ත්වයට පත් වේයැයි අපේක්ෂා කළ නොහැකිය. මෙම තත්ත්වය, ලෝක ආර්ථිකය සමග බැඳී වඩාත් වේගවත් ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීමට තැත් කරන ශ්‍රී ලංකාව වැනි කුඩා විවෘත ආර්ථිකයන්ට අභියෝගයක් වනු ඇත. එමනිසා, පීඩනයට ලක්ව ඇති ලෝක ආර්ථික තත්ත්වයන්, 1999 දී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය හා රැකියා උත්පාදනය තරමක් දුරට අඩපණ කිරීමට හේතුවනු ඇත.

1998 දී අයවැය හිඟය විශාල වශයෙන් පුළුල් වීම තරමක බාධාකාරී තත්ත්වයක් උද්ගත කළේය. ලෝක ආර්ථික අවපාතයක් සහිත තත්ත්වයකදී අපනයන ඉල්ලුම හා ජාතික ආදයම් වර්ධනය අඩුවීම නිසා රජයේ ආදයම පහත වැටීමේ නැඹුරුවක් ඇති විය හැක. එවැනි තත්ත්වයකදී අයවැය හිඟය එක්තරා දුරකට පුළුල්වීම වැළැක්වීමට නොහැකි විය හැකිය. 1998 දී යම් ප්‍රමාණයකට ශ්‍රී ලංකාවේ සිදුවූයේ මෙයයි. ආර්ථික අවපාත තත්ත්වයකදී කේනිසියානු විසඳුම නම් රාජ්‍ය මූල්‍ය ප්‍රසාරණයක් මගින් අපනයන ඉල්ලුමේ පහත වැටීමට ප්‍රතිවිරුද්ධ වශයෙන් දේශීය ඉල්ලුම ඉහළ නැංවීමයි. ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තීන්හී අවසාන අරමුණ වන්නේ දේශීය සේවානියුක්තිය හා ආදයම් මට්ටම් පහත නොවැටී පවත්වාගෙන යාමයි. මෑතකදී ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති කෙරෙහි දක්වන අවධාරණයෙහි යම් වැඩිවීමක් දක්නට ලැබුනද, නොකඩවා ඉහළ මට්ටමක පවතින අයවැය හිඟයක් හා ඉහළ උද්ධමන වේගයක් සහිත ශ්‍රී ලංකාව වැනි රටක් එවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සාධාරණීකරණය කිරීම අසීරුය. අයවැය හිඟය ඉහළයාම මගින් අතිඋද්ධමනකාරී තත්ත්වයන් ඇතිවිය හැකි අතර වේගයෙන් රුපියල අවප්‍රමාණවීම තුළින් මෙම තත්ත්වය තවදුරටත් උග්‍රවනු ඇත.

ශ්‍රී ලංකාව දැනටමත් ඉහළ උද්ධමනයක් සහිත රටකි. ඉහළ අයවැය හිඟය, ඉහළ උද්ධමනය හා ඉහළ පොලී අනුපාතික මගින් පෞද්ගලික ආයෝජන අධෛර්‍යවත් කරන අතර ආර්ථික ප්‍රසාරණය පහත හෙලයි. ගෙවුම් ශේෂ තත්ත්වය ආරක්ෂාකර ගැනීමටත්, උද්ධමනය තවදුරටත් ඉහළයාමට ඇති ඉඩකඩ මහ හැරවීමටත්, විනිමය අනුපාතිකය මත පීඩනය අඩුකර ලීමට සහ රජයේ ආර්ථික ප්‍රතිපත්තීන් කෙරෙහි පෞද්ගලික අංශයේ විශ්වාසය හීනවීම වළක්වාලීමටත් අයවැය හිඟය පහත හෙලීමේ වැඩපිළිවෙල නැවතත් නිසි මඟට යොමුකිරීමේ හදිසි අවශ්‍යතාවයක් තිබේ.

වඩාත් පුළුල් වූ අයවැය හිඟයේ උද්ධමනාත්මක බලපෑම් 1998 දී වඩා තියුණු ලෙස අත්විඳීමට සිදු නොවීය. ඊට හේතුවූයේ පහත වැටුණු ලෝක වෙළෙඳපොළ තත්ත්වයන් යටතේ විශේෂයෙන්ම බොරතෙල්, තිරිඟු, පොහොර හා සීනි වැනි භාණ්ඩවල ආනයන මිල තියුණු ලෙස පහත වැටීමේ වාසිය ශ්‍රී ලංකාවට හිමිවීමයි. මෙම මිල පහත වැටීම්, රුපියලේ අගය එ.ජ.ඩොලරයට සාපේක්ෂව සියයට 9.6 කින් පහත වැටී තිබියදීත්, ආනයන වියදම්වල වර්ධනය සීමාකර ගැනීමට උපකාරී විය. මේ හේතුවෙන් බැංකු ක්‍රමය වෙත වැඩි සම්පත් ප්‍රමාණයක් ඉතිරිවිය. ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන ප්‍රධාන භාණ්ඩවල ජාත්‍යන්තර මිල පහත වැටීම මගින් ඉතිරි කරගනු ලැබූ සම්පත් සහ පෞද්ගලික අංශයට සපයන ලද ණයවල මන්දගාමී වර්ධනයත් නිසා පොලී අනුපාතික කෙරෙහි පීඩනයක් ඇති නොකර, විශාල අයවැය හිඟය මූල්‍යණය කිරීමට බැංකු ක්‍රමයට හැකිවිය. වර්තමාන ප්‍රවනතාවන්ට අනුව ආනයන මිල මට්ටම්වල තවදුරටත් විශාල පහත වැටීම් ඇතිවීමට ඉඩ නොමැති බව පෙනේ. මෙවැනි තත්ත්වයක් යටතේ, මෑතකාලයේ දක්නට ලැබුණු හිතකර උද්ධමන ප්‍රවනතාවය වෙනස් නොකොට ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් තවදුරටත් අනුගමනය කිරීමට රජයට ඉඩකඩ තිබිය නොහැකිය.

සමස්ත අයවැය හිඟය නිරපේක්ෂ වශයෙන් රුපියල් දශ ලක්ෂ 23,758 සිට රුපියල් දශ ලක්ෂ 93,819 දක්වා ඉහළ ගියේය. ආරක්ෂක වියදම් ඉහළයාමත් රජයේ ආදයම පහළ යාමත් අයවැය හිඟය වැඩිවීමට බලපෑ ප්‍රධානතම හේතුව විය. ප්‍රධාන වශයෙන්ම, අපේක්ෂිත ප්‍රමාණයට වඩා පිරිවැටුම්/භාණ්ඩ හා සේවා බදු, ආදායම් බදු හා ආනයන බදු මගින් එක් රැස් කරන ලද රජයේ ආදයම් පහත වැටීම, වැඩිවූ අයවැය හිඟයෙන් සියයට 50 කට පමණ දයක විය. වැටුප් හා වේතන සහ පාඩු ලබන රාජ්‍ය ආයතනයන වලට (ශ්‍රී ලංකා දුම්රිය සේවය සහ තැපැල් දෙපාර්තමේන්තුව) කරන ලද පැවරුම් වැනි ආරක්ෂක නොවන වියදම් ඉහළ යාමද අයවැය හිඟය වැඩිවීමට බලපෑවේය. 1998 දී අයවැය

ඉලක්ක වලින් බැහැරවීමේ ප්‍රමාණයෙහි විශාලත්වයද, 1999 දී ඉහළ ආර්ථික වර්ධනයක් පිළිබඳව ඇති අපේක්ෂා දුබල වීමද සලකා බලන කල 1999 දී අයවැය හිඟය දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 7.5 පමණ දක්වා අඩුකරලීමට පියවර ගතයුතු වේ. වසර 2000 දී තවදුරටත් රාජ්‍ය මූල්‍ය තත්ත්වය ශක්තිමත් කරලීම සඳහා ඉලක්ක කරගත හැක්කේ එමගිනි.

ආර්ථිකයේ උද්ධමනය පිළිබඳ අපේක්ෂා අඩුකරලීම සඳහා උද්ධමන වේගය තිරසාර ලෙස අඩුකරලීමට ශ්‍රී ලංකාව තවමත් සමත් වී නොමැත. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයට අනුව, සාමාන්‍ය මිල උද්ධමන අනුපාතිකය 1989-93 දක්වා වූ අවුරුදු පහ තුළ පැවති සියයට 13.5 සිට, පසුගිය වසර පහ තුළදී සියයට 10.2 දක්වා අඩුවී ඇති නමුත්, ස්වභාවයෙන්ම ඇති වී තිබෙන උද්ධමනාත්මක නැඹුරුවෙන් ඉවත්වීමට නම් සියයට 5 ට වඩා අඩු ස්ථායී උද්ධමන වේගයක් ලබා ගැනීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ උද්ධමන අනුපාතිකය, සිය වෙළෙඳ පාර්ශවකරුවන්ගේ හා තරඟකරුවන්ගේ සාමාන්‍ය උද්ධමන අනුපාතිකයට වඩා ඉහළ මට්ටමක පැවතුනි. මෙම තත්ත්වය, ලෝක වෙළෙඳපොළෙහි තරඟකාරිත්වය පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ විනිමය අනුපාතිකය වාර්ෂිකව සියයට 5-6 දක්වා පමණ ප්‍රමාණයකින් අවප්‍රමාණය වීමට මඟ පෑදීය. ආනයන අපනයන දෙකෙහි එකතුව මුළු දළ ජාතික ආදායමෙන් සියයට 70 ක් පමණ වන ශ්‍රී ලංකාව, 1997 වාර්ෂික වාර්තාවේද පෙන්වා දුන් පරිදි, වෙළෙඳාම මත දැඩිව රඳා පවතින රටකි. මෙවැනි තත්ත්වයකදී විනිමය අනුපාතිකය අවප්‍රමාණයවීම උද්ධමනය කෙරෙහි දැඩි ලෙස බලපායි. දේශීය වැටුප් මට්ටම් තීරණයවීමේ යන්ත්‍රණය බොහෝදුරට ශ්‍රම ඵලදායීතාවට වඩා සෘජු හෝ වක්‍ර ආකාරයෙන් උද්ධමනය හා බැඳී පවතී. මෙය උද්ධමනය-වැටුප්-විනිමය අනුපාතිකය යන සම්බන්ධතාවය ඇති කිරීමට බලපාන තවත් සාධකයකි. වැඩිවූ ආරක්ෂක වියදම් මගින් මෙම තත්ත්වය වඩාත් සංකීර්ණභාවයට පමුණුවා ඇත. මේනිසා, නොකඩවා ඉහළ මට්ටමක පවතින අයවැය හිඟයන්, ජනතාව තුළ ඇති ඉහළ උද්ධමන අපේක්ෂාවන් ඉවත්කරලීම වඩාත් අභියෝගාත්මක කාර්යයක් බවට පත්කර ඇත. එමනිසා ඉදිරි වසර තුන තුළදී අයවැය හිඟය සියයට 5 ට වඩා අඩු ස්ථායී තත්ත්වයකට පත්කරලීමේ පියවර ගතයුතුව ඇති අතර ඵලදාව මත පදනම් වූ වැටුප් තීර්ණය යන්ත්‍රණයක් හඳුන්වාදිය යුතුව ඇත. ශ්‍රම වෙළෙඳපොළ වඩාත් නම්‍යශීලීභාවයට පත් කරන හා ශ්‍රම වෙළඳපොළෙහි ව්‍යුහාත්මක දුර්වලතා ඉවත්කරලන පියවර මගින් මෙම ක්‍රියාදමය ශක්තිමත් කළ යුතුය. ඒ අතර, තරඟකාරී වාතාවරණයක් යටතේ සේව්‍යයන් හා සේවකයන් යන දෙපාර්ෂවයටම ආරක්ෂාවක් සැලසිය යුතුය.

ඉහත දැක්වූ ව්‍යුහාත්මක ප්‍රතිපත්තීන් අතර ස්ථායී සමාජ සංරක්ෂණ ක්‍රමයක් අරමුණු කරගත් විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම ප්‍රමුඛත්වයක් ගනී. අනෙකුත් සමාජ ආර්ථික තත්ත්වයන්ගේ වැඩිදියුණුවීම සමග ඇති වූ ජනගහණන වෙනස්වීම්, අනෙකුත් බොහෝ දියුණුවන රටවලට වඩා බෙහෙවින් අඩු ජනගහන වර්ධන අනුපාතිකයක් ශ්‍රී ලංකාවේ ඇති වීමට මඟ පෑදීය. එහෙත්, වාර්ෂිකව 200,000 වැඩි සංඛ්‍යාවක් ජනගහනයට අලුතින් එක්වීම, සීමිත සම්පත් මත පැටවෙන අමතර බරක් බවට පත්වී ඇත. ජනගහනයේ වර්තමාන ව්‍යුහය හා උපනතීන් හා බැඳුනු සමාජ-ආර්ථික ගැටලු කිහිපයක් වෙයි. සේවා වියුක්තිය, ඉඩම් කුඩා කොටස්වලට කැඩීයාම, අධ්‍යාපනය, සෞඛ්‍ය හා නිවාස වැනි සමාජ සුබසාධන වියදම් ඉහළයාම හා වයස්ගතවන ජනගහනය වැඩිවීම ඉක්මනින් අවධානය යොමු කළයුතු ගැටලු වේ. වයස්ගත වන ජනගහනය හා ඉහළ යන වයස්ගත යැපුම් අනුපාතය පිළිබඳ ගැටලු විසඳීම සඳහා මනාව සැලසුම් කළ ක්‍රමෝපායයන් ද, වයස්ගත පුද්ගලයන්ගේ ජීවන මට්ටම හීනවීයාම හා වැඩ කරන ජනගහනය මත අධික පීඩනයක් ඇතිවීම වළක්වාලන අන්දමට පරීක්ෂාකාරීව සකස් කරන ලද සමාජ ආරක්ෂණ ක්‍රමයක්ද අවශ්‍ය වේ. මෙය කළ යුත්තේ, ශ්‍රම වෙළෙඳපොළවල් වඩාත් නම්‍යශීලී වන ලෙස, වෙනස්වන ශ්‍රම වෙළෙඳපොළ අවශ්‍යතාවයන්ට ගැලපෙන ලෙස සහ වෙනත් ආර්ථික වර්ධන උපායමාර්ගයන්ට අනුපූරක වන ප්‍රතිපත්ති හඳුන්වා-දීම තුළිනි.

ශ්‍රී ලංකාවේ අපනයන, ජාත්‍යන්තර වෙළෙඳපොළවල දැඩි අභියෝගයන්ට මුහුණ දෙන අවස්ථාවකදී, නිෂ්පාදකයන් අතර අවිනිශ්චිතතාව තවදුරටත් වැඩි කරමින්, මෑත කාලයේදී ඇඟළුම් පංගු පරිපාලනයෙහි යම් ගැටලු සහගත වර්ධනයන් කිහිපයක් දක්නට ලැබුණි. පංගු ක්‍රමය, ලෝක රෙදිපිළි සහ ඇඟළුම් වෙළෙඳම පාලනය කරන ප්‍රධාන ක්‍රමයක් වේ. ක්‍රමයෙන් විකාශනය වී ඇති විවිධ වූ පංගු ක්‍රමයන් බෙහෙවින් අවුල් සහගත පාලන ක්‍රමයන් හා බැඳී පවතින අතර ඉහළ පංගු උපයෝජනයක් සඳහා ඒ පිළිබඳ සමීප සුපරීක්ෂණයක් හා අධීක්ෂණයක් අවශ්‍ය වේ. 1998 දී ශ්‍රී ලංකාවේ පංගු ක්‍රමය පරිපාලනයෙහි සුළු අවුල් සහගත තත්ත්වයක් ඇතිවිය. පිරිමි සහ ළමා කබා සහ කමිස වැනි ඇතැම් අයිතමයන්ගේ පංගු උපයෝජනය නියමිත ප්‍රමාණය ඉක්මවා ගිය අතර ඇමරිකා එක්සත් ජනපදය මගින් පැනවිය හැකිව තිබුණු ඇඟලුම් ආනයන තහනම් කිරීම් මඟ හරවා ගැනීම සඳහා රෙදිපිළි පංගු මණ්ඩලයට යම් යම් පියවර ගැනීමට සිදුවිය. රෙදිපිළි හා ඇඟළුම් පිළිබඳ උරුගුවේ ගිවිසුම අනුව වසර 2005 දී පංගු ක්‍රමය සම්පූර්ණයෙන් ඉවත් කරන තෙක් දැනට පවත්නා ජාත්‍යන්තර වෙළෙඳ රටාවෙන් ලබාගත හැකි වාසි ලබාගැනීම සහතික කරනු පිණිස, ලබාදී ඇති පංගු උපරිම වශයෙන් භාවිතයට ගත යුතුය. මේ සඳහා පංගු පරිපාලනය කාර්‍යක්ෂමව කළ යුතුය. වෙන්දේසි මගින් පංගු බෙදා හැරීමෙන් වෙළෙඳපොළ පදනම් වූ පංගු බෙදා හැරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කර පංගු උපයෝජනය පිළිබඳව වඩා හොඳ ප්‍රතිඵල ලබාගත හැකිව තිබුණි. එහෙත්, ශ්‍රී ලංකාවේ පංගු බෙදාහැරීමේ පරිපාලනය තුළට, නව ආයෝජන ප්‍රවර්ධනය, කර්මාන්ත ප්‍රාදේශීය වශයෙන් පිහිටුවීම හා වැඩියෙන් රැකියා උත්පාදනය කිරීම වැනි වෙනත් අරමුණුද ඇතුලත් වී තිබේ. පංගු පරිපාලනයෙහි මූලික වෙනසක් කිරීම අවශ්‍ය නොවිය හැකි නමුදු, රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්තයෙහි වර්ධනයට බාධාවක් නොවන පරිදි මෙම

ක්‍රමයෙහි සුගම ක්‍රියාකාරිත්වය සහතික කිරීම පංගු ක්‍රමය පාලනය කරන්නන්ගේ වගකීමක් වේ. මෙය වඩාත් වැදගත් වන්නේ ලෝක වෙළෙඳ තත්ත්වයන්ගේ පසුබෑම නිසා ලෝකයේ සැපයුම්කරුවන් අතර තරඟය තීව්‍රවීම සහ වසර 2005 දී පංගු ක්‍රමයක් රහිත නිදහස් වෙළෙඳ පරිසරයකට මුහුණදීම සඳහා කෙරෙන සුගම පරිවර්තනයකට මහ සැලසීමේ අවශ්‍යතාවයක්ද පවතින නිසාය.

ශ්‍රී ලංකාවේ ආයෝජන වර්ධනය මන්දගාමී තත්ත්වයක පවතී. මෙම මන්දගාමී තත්ත්වයට කරුණු කිහිපයක් බලපා ඇත. ප්‍රථමයෙන්ම, ආරක්ෂක වියදම් ඉහළ යන තත්ත්වයක් තුළ රාජ්‍ය අයවැය තුළින් ඇතිවිය හැකි උද්ධමනීය පීඩනය පාලනය කර ගැනීම සඳහා රජයේ ඇති කැපවීම හේතු-කොටගෙන, රාජ්‍ය ආයෝජන අඩුකිරීමට සිදුවිය. අනෙකුත් අංශවල වියදම් කපා හැරීම මගින් (උදාහරණ වශයෙන්, පාඩු ලබන රාජ්‍ය අංශයේ ආයතනවලට සැපයෙන සංක්‍රාම ගෙවීම් කපා හැරීම) රාජ්‍ය ආයෝජන මට්ටම වඩා ඉහළ මට්ටමක පවත්වාගත හැකිව තිබුණ නමුත් දේශපාලනමය-ආර්ථිකමය හේතූන් නිසා ඊට ඉඩ නොලැබුණි. දෙවනුව, ආරක්ෂක තත්ත්වය පිළිබඳ අවිනිශ්චිතතාව දේශීය මෙන්ම විදේශීය ආයෝජනද අධෛර්යවත් කළේය. තෙවනුව, ශ්‍රී ලංකාවේ ණය පොලී අනුපාතිකයන් දිගු කාලයක් මුළුල්ලේ සියයට 20 කට වඩා ඉහළ මට්ටමක පැවතීම පෞද්ගලික ආයෝජන අධෛර්යවත් කළේය. ඉහළ අයවැය හිඟයන්, 1980-96 කාලයේදී පැවැති සාමාන්‍යයෙන් සියයට 13 ට වඩා ඉහළ උද්ධමන අනුපාතිකයන් සහ රාජ්‍ය අංශයේ බැංකුවල ක්‍රියාකාරිත්වයේ අකාර්යක්ෂමතාවයන් හේතුකොටගෙන පොලී අනුපාතික ඉහළට තල්ලු කරනු ලැබීය. 1997 මුල් භාගයේදී මූල්‍ය ප්‍රතිපත්තියෙහි සුළු වශයෙන් වූ ලිහිල් කිරීම නිසාත්, 1994-97 කාලයේදී රාජ්‍ය මූල්‍ය අංශයේ වූ වැඩිදියුණුවීම් නිසාත්, පොලී අනුපාතිකයන් සැලකියයුතු අන්දමින් පහළ වැටුණු නමුදු ඉහළ උද්ධමනය හා ඉහළ පොලී අනුපාතික පිළිබඳ මහජනතාවගේ හැඟීම පහ වීමටත්, දිගුකාලීන පෞද්ගලික මූර්ත ආයෝජන යළිත් ඉහළ යාමටත්, වසර කිහිපයක් මුළුල්ලේ අඩු උද්ධමන වේගයක් පවත්වා ගැනීම අවශ්‍ය වේ. ක්‍රමානුකූලව අයවැය හිඟය, උද්ධමනය හා පොලී අනුපාතික පහත දැමීම පිළිබඳව ප්‍රමාණවත් ප්‍රගතියක් මෙතෙක් අත්කරගෙන නැත. හතරවනුව, ශ්‍රී ලංකාව විදේශීය සහභාගිත්වය සහිත අපනයනාභිමුඛ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 1977 ආර්ථික ලිහිල්කරණයෙන් පසුව, ඉතා සංකීර්ණ වූ ආයෝජන ප්‍රතිපත්තියක් පවත්වා-ගෙන යනු ලැබීය. මෙම ප්‍රතිපත්ති නිසා සම්ප්‍රදායික වැවිලි අංශයද ඇතුලත් සියළුම අපනයනාභිමුඛ නොවන අංශයන් සාපේක්ෂ වශයෙන් අවාසි සහගත තත්ත්වයකට පත්විය. මෙසේ එක් අංශයකට බරවූ දිරිගැන්වීමේ ක්‍රමය දිගුකාලයක් තිස්සේ ක්‍රියාත්මක විය. ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක නොවන අපනයනකරුවන්ට ද විදේශ ව්‍යවහාර මුදල් ණය ලබාදීම සහ ආයෝජන මණ්ඩලය යටතේ ලැබෙන සහන ලබාගැනීම සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය අපනයන අනුපාතය ලිහිල් කිරීමද ඇතුළු රාජ්‍ය මූල්‍ය දිරිදීම් ලබාදීම වැනි නව අංග ඇතුලත් කිරීමෙන් විවිධ අංශ සඳහා ලබාදී ඇති දිරිගැන්වීම්වල ඇති අසමානතා අඩුකිරීමට පියවර ගෙන ඇත. කෙසේවෙතත්, වත්මන් ආයෝජන ප්‍රතිපත්තිය ද, එහි අන්තර්ගත ස්වාභිමතය අනුව තීරණ ගැනීම් වළක්වනු පිණිස සරල කිරීම අවශ්‍යව ඇත. සියළුම අංශවලට සමාන දිරිදීම් සහ පටු නිෂේධාත්මක ලැයිස්තුවක් සහිත සරල හා විනිවිද පෙනෙන සුළු ආයෝජන පරිපාටියක් මගින් පෞද්ගලික ආයෝජන වඩාත් දිරිමත් වනු ඇත. පස්වනුව, ප්‍රමාණවත් යටිතල පහසුකම් නොතිබීම පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා බාධකයක්ව පැවතින. බලශක්තිය හා විදුලි සංදේශ අංශයන්හි සැලකිය යුතු වැඩිදියුණු කිරීම් කර ඇති නමුදු, සෞඛ්‍ය හා අධ්‍යාපනය ඇතුළු ප්‍රධාන අංශවල යටිතල පහසුකම් තවදුරටත් වර්ධනය කිරීම අවශ්‍යව ඇත. සයවනුව, වෙළෙඳ ප්‍රතිපත්තිදාමය, විශේෂයෙන්ම කෘෂිකර්මය සඳහා අදාළ ප්‍රතිපත්ති, විනිවිද පෙනෙන සුළු නොවීය. කලින් කලට අවිධිමත්ව වෙනස් කරන තීරුබදු හා බලපත්‍ර දීමේ ක්‍රමය, අනාගත වෙළෙඳ ප්‍රතිපත්තියෙහි දිශාව පිළිබඳව අවිනිශ්චිතතාවයක් ඇති කරයි. මෙම තත්ත්වය, පෞද්ගලික අංශය වාණිජමය කෘෂිකර්මයට නිසි අයුරින් ප්‍රවිෂ්ටවීමත්, එම අංශය, වැවිලි නොවන කුඩා පරිමාණ කෘෂිකාර්මික අංශය සමග වඩා හොඳ වෙළෙඳ සම්බන්ධතා ගොඩ නඟා ගැනීමත් අධෛර්යවත් කරයි. මෙම ප්‍රශ්නය පිළිබඳව දැනට සැලකිල්ල යොමුවෙමින් පවතී. 1996 දී ඉතිරිව පැවති සියළුම බලපත්‍ර ක්‍රම අහෝසි කරන ලද අතර, කෘෂිකාර්මික භාණ්ඩ සියයට 35 ක උපරිම තීරුබදු අනුපාතිකය යටතට ගෙන එනු ලැබ ඇත. කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා වැඩි ආරක්ෂණයක් ලබාදීමේ ඉල්ලීම් විවිධ සාකච්ඡාවලදී තවමත් ඉස්මතු වේ. විශ්වාසදායී හා ස්ථිරසාර කෘෂිකාර්මික ප්‍රතිපත්තියක් පිළිබඳව පෞද්ගලික අංශයට ඒත්තු ගැන්වීම සඳහා, කෘෂිකාර්මික නිෂ්පාදන හා සම්බන්ධ වර්තමාන නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තිය අඛණ්ඩව වසර ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක කිරීම සඳහා කැපවීම අවශ්‍ය වේ. හත්වැනිව, ආයෝජකයන්ගේ අවශ්‍යතා පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු නොකරන අනම්‍ය ශ්‍රම වෙළෙඳපොළවල් සහ අනම්‍ය කම්කරු නීති පෞද්ගලික ආයෝජනයේ වේගවත් වර්ධනයකට ප්‍රධාන බාධකයක් සේ සැලකේ. ඊළඟ වසර තුන තුළදී ශ්‍රී ලංකාවේ ආයෝජනය හා ආර්ථික වර්ධනය වේගවත් කිරීමට නම් මෙම දිගුකාලීන ව්‍යුහාත්මක ගැටළු විසඳා ගතයුතු වේ.

**විශේෂ සටහන - 3**

# තොරතුරු තාක්ෂණයේ නවෝත්පාදන මූල්‍ය ක්ෂේත්‍රය ඉදිරියේ ඇති අභියෝගයන්

ලෝකයේ සිදුවෙන වෙළඳාම, වාණිජ්‍යය හා බැංකු කටයුතු සම්පූර්ණ පරිවර්තනයකට පත්කිරීමට බලපෑ හැකි ලෙසට තොරතුරු තාක්ෂණයට අනුබල දෙන විශිෂ්ට ප්‍රගතියක් තාක්ෂණය විසින් විදුලි සංදේශ ක්ෂේත්‍රයෙහි ඇතිකර තිබේ. විද්‍යුත් වාණිජ්‍යය දනටම විවෘත වෙමින් පවතින අතර ශ්‍රී ලංකාව වැනි රටවල් මේ වෙනස්වීම්වලට අනුරූප වන ලෙස සකස් විය යුතුය. එසේ නොවුවහොත් පමාවීමේ හේතුවෙන් තමන්ට ලැබෙන්නට තිබෙන අනගි අවස්ථාවන් අහිමිකර ගැනීමට සිදුවෙනු ඇත. අනාගතයේදී දේශසීමා හරහා සිදු කෙරෙන ගණුදෙනු, ප්‍රමාණයෙන් හා අගයෙන් වැඩිවනවා පමණක් නොව ඒවා නවමානයක්ද ගනු ඇත. මෙම ගණුදෙනු සිදු කෙරෙන ආකාරය සීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතී. මේ වෙනස්වීම්වලට විරෝධය දක්වීම හා නිසි ප්‍රතිචාරය දක්වීමට අසමත්වීම අවාසිදායක වීමට ඉඩ ඇති අතර, එයින් ආර්ථික උපාය මාර්ගයන්ටද හානි සිදුවීමට ඉඩ තිබේ. මේ නව විධිවිධානයන් යටතේ ලෝක වෙළෙඳ-පොළට භාණ්ඩ හා සේවා සැපයීමට සූදනම් රටවලට, වෙළෙඳපලින් විශාල කොටසක් සතුකර ගැනීමට හා සාපේක්ෂ වාසි වැනි යහපත් ප්‍රතිඵල ලබා ගැනීමටද හැකිවෙන අතර, එසේ සහභාගි නොවන රටවලට පහළ ඵලදායීතාවයන් සහ ඉහළ අකාර්යක්ෂමතාවයන් අතර කල්මැරීමට සිදුවෙනු ඇත.

මහ බැංකුව, බැංකු ක්ෂේත්‍රයේ නියැලි අනෙක් ආයතනද සහභාගි කරගනිමින්, ගෝලීය බැංකු ක්ෂේත්‍රයේ සිදුවෙන වෙනස්වීම්වලට යහපත් ප්‍රතිචාර දක්වීමට අවශ්‍ය යටිතල පහසුකම් ඇතිකිරීමට හා වැඩිදියුණු කිරීමට උත්සාහ දරනු ඇත. මෙම උත්සාහයට පූර්ණ ලෙස සහභාගිවීම එම බැංකුවලටද ඵලදායී දෙයක් වනු ඇත. තියුණු වෙමින් පවතින තරඟකාරිත්වය, ඉහළ නගිමින් පවතින අරමුදල් පිරිවැය, ලාභාන්තික හීනවීමට ඇති බලපෑම හා මූල්‍ය මැදිහත්වීම්වලට ඇති අවස්ථාවන් අඩුවීමද මෙම කරුණු ආශ්‍රිතව පවත්නා අස්ථාවර ස්වභාවයන්ද සමග ගත්කල ණය සැපයීම බැංකුවල ලාභ ලැබීමේ ප්‍රධාන මාර්ගය ලෙස තවදුරටත් නොපවතිනු ඇත. ඒ වෙනුවට පරිගණක හා සන්නිවේදනය මගින් වැදගත් කාර්යයන් ඉටු කෙරෙන ගාස්තු මත පදනම් වූ සේවාවන් සැපයීම මූලික ආදායම් මාර්ගය බවට පත්වෙමින් පවතී. දියුණු අර්ථ ක්‍රමයන්ගෙන් ගලා ආ මුදල් කළමනා-කරණය, අරමුදල් පැවරීම, ගෙවීම් ක්‍රම හා නිශ්කාෂණ ක්‍රම යනාදියේ වර්ධනයන් බැංකු ක්‍රමය දේශීය වෙනුවට ගෝලීය තත්ත්වයට පත් කරයි.

එසේම විද්‍යුත් අරමුදල් පැවරීම හඳුන්වාදීම නිසා බැංකු සේවාවන් සැපයීමේ ක්‍රමයක් වශයෙන් පැවති සිල්ලර බැංකු ශාඛා ජාලයන් සමහර කරුණු අතින් යල් පැනගිය තත්ත්වයකට පත්වී තිබේ. දෛනිකව සිදු කෙරෙන ගණුදෙනුවල ස්වභාවය අනුව බැංකු ක්‍රමය ද්විස්ථර ක්‍රමයක් වෙත සේන්දුවෙමින් පවතී. ණය පහසුකම් සැලසීම වැනි පුහුණු පිරිස්බල අවදන අවශ්‍ය සංකීර්ණ බැංකු සේවාවන් සැපයීම ප්‍රාදේශීය කාර්යාල මගින් සිදු කෙරේ. දෛනික සාමාන්‍ය බැංකු සේවා සැපයීමේදී නිවසේ සිට ක්ෂණික ප්‍රතිචාරය දක්වෙන ලෙසින් කටයුතු කිරීමට හැකිවෙන ලෙසට සිය ක්‍රියාදමයන් ස්වයංක්‍රීය තත්ත්වයට පත්කිරීම් හා ශාඛා කාර්යාලවලින් වැඩි ප්‍රමාණයක් පුළුල් ලෙස විද්‍යුත් අරමුදල් පැවරීම, ස්වයංකෘත ටෙලර් යන්ත්‍ර හා ප්ලාස්ටික් කාඩ් භාවිතා කිරීම ආදී දේ පදනම්කර ගන්නාවූ පරිගණකගත කරන ලද ආකාරයේ සහ ක්‍රියාදමයන් බෙද වෙන්කර අඩු වියදමින් පවත්වාගෙන යාමට හැකිවන ආකාරයේ ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු කෙරේ.

දියුණු මූල්‍ය වෙළෙඳපොළවල් තුළ ඇතිවෙමින් පවතින තවත් වර්ධනයක් නම් රක්ෂණ සමාගම්, සුපිරි වෙළෙඳසල්, විශාල සාප්පු, දේපල ඒජන්තවරුන් වැනි වෙනත් ව්‍යාපාර සංවිධානයන් සම්ප්‍රදායානුකූල බැංකු දේශසීමාවන් ක්‍රමයෙන් ආක්‍රමනය කිරීමයි. රක්ෂණ සමාගම් විසින් ගෙවල් රක්ෂණය කිරීම පමණක් නොව ඒවා සඳහා මූල්‍ය පහසුකම් සැලසීමද වැඩියෙන් සිදු කරයි. සුපිරි වෙළෙඳසැල් හා විශාල සාප්පු පරිගණක මගින් ඉතා පහසුවෙන් ප්‍රවේශ වියහැකි ගණුදෙනුකරුවන් පිළිබඳ අති විශාල දත්ත සමුදායන් තමන් සතු කරගෙන සිටින අතර, මේවා බැංකු විසින් කරනු ලබන සාමාන්‍ය මූල්‍ය පහසුකම් ලබාදීම සඳහා ද භාවිතා කළ හැකිය. සම්ප්‍රදායානුකූලව මූල්‍ය උපකරණ ගණුදෙනු කිරීමේ යෙදෙන තැරැව්කරුවන්, බැංකු වලින් කෙරෙන කටයුතු කිරීම දක්වා සිය ක්ෂේත්‍රයන් පුළුල් කරගනිමින් සිටිති. දේපල විකිණීමේ හා පැවරීමේ කටයුතුවල නියැලි නිශ්චල දේපල ඒජන්තවරුන් වැඩි වැඩියෙන් උගස් කටයුතුවලට යොමු වෙමින් සිටිති. මේ සියළුදෙනා හා තෙල් සමාගම්, බහුජාතික සමාගම් වැනි තවත් බොහෝ ව්‍යාපාරික ආයතන සතුව බැංකු කටයුතු කරගෙන යාමට අවශ්‍ය මූල්‍ය සම්පත් ද ප්‍රවීණත්වයද විශේෂඥ ඥානයද ඇත. ඔවුන්ගේ වාසියට තිබෙන තවත් අතිරේක සාධකයක් වන්නේ බැංකු පාලකයින් හා බැංකු අධීක්ෂකයින් විසින් බැංකු වෙත පනවා ඇති නීතිමය විධි විධානයන් වැනි දෙයින් ඔවුන්ගේ කටයුතු සීමාකර නොතිබීමය.

**විශේෂ සටහන - 3 (සම්බන්ධයි)**

මෙම වෙනස්වීම් දියුණුවෙමින් පවතින මූල්‍ය වෙළෙඳපොළවල් කරා පැතිරීයාමට දිගුකාලයක් ගත නොවෙනු ඇත. මීළඟ දශකය තුළදී ශ්‍රී ලංකාවද මේ වෙනස්වීම් වලින් සමහරක් අත්දකිනු ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉදිරියේදී සිදු කිරීමට අදහස්කර ඇති ඇතැම් තොරතුරු තාක්ෂණ සංවර්ධනයන් නිසා මෙම ක්‍රියාවලියෙහි වේගවත් වීමක් සිදුවනු ඇත. සෘජුව කෙරෙන හර කිරීම් ආවරණය කිරීමට හැකිවන ලෙසට දැනට ක්‍රියාත්මක වෙමින් පවතින මාර්ග අපගත අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයේ ක්ෂේත්‍රය පුළුල් කිරීම, අනුරූප භාවිතය මගින් චෙක්පත් නිශ්කාෂණ ක්‍රමය ශක්තිමත් කිරීම, බැංකු අතර සිදු කෙරෙන මාර්ගගත ගිණුම් තැබීම් ක්‍රමයක් කරා යාම, ප්‍රධාන මූල්‍ය වෙළෙඳපොළවල සිදු කෙරෙන ආකාරයේ තත්කාලීන දළ පියවුම් ක්‍රමයක් හඳුන්වාදීම සහ ආවෘතවන්නාවූ පරාශය වඩාත් පුළුල් වන්නාවූ පොදුවේ භාවිතා කරන ජාලයක් ගොඩ නැගෙන ලෙසට දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලයන් ව්‍යාප්ත කිරීම වැනි පියවර මගින් රටේ දැනට පවතින ගෙවීම් ක්‍රමය වඩාත් නවීකරණය කිරීම සඳහා වන යෝජනා මහ බැංකුවේ සැලකිල්ලට යොමු වී තිබේ. ඒ සමගම මධ්‍යම තැන්පතු හලක් හා මුද්‍රිත ලේඛන නොමැති ක්‍රමයක් හඳුන්වාදීම මගින් වර්ධනයත් කාර්යක්ෂමතාවයත් වැඩිවන ලෙසට රජයේ ණය සඳහා වූ ද්විතීය වෙළෙඳපොළ නවීකරණය කිරීමටද මහ බැංකුව කටයුතු කරයි. මෙම ප්‍රයත්නයේදී සිය සාමාජිකයින්ට වඩාත් කාර්යක්ෂම ලෙස සේවය කිරීමට හැකිවෙන පරිදි සිදුකර ගෙන යන නිරන්තර වර්ධනය සහතික කිරීම සඳහා සේවක අර්ථසාධක අරමුදල වෙතද අවධානය යොමු කෙරෙනු ඇත.

1980 ගණන්වල සිට ක්‍රමානුකූලව සිදුවෙමින් පවතින රටේ ආර්ථික උපායමාර්ගවල වෙනස්වීම් සැල-කිල්ලට ගනිමින් 1995 අංක 26 දරණ මුදල් නීති පනතේ 105(අ) වගන්තිය මගින් ශ්‍රී ලංකා මහ බැංකුව බැංකු ක්ෂේත්‍රයේ තාක්ෂණික ප්‍රගතිය අත්කර ගැනීම සඳහා පිහිටුවන සමාගම්වල ප්‍රාග්ධනයට දායකවීමට හැකිවන ලෙසට ව්‍යවස්ථාපිත බලයන්ගෙන් සමන්විතව සිටී. මෙම පියවර, කර්මාන්ත වාණිජ්‍ය හා බැංකු කටයුතු ගෝලීයකරණයේ සම්පූර්ණ වාසිය ශ්‍රී ලංකා ආර්ථිකයට අත්කර ගැනීම සඳහා විදේශීය රටවල ඇතිවී තිබෙන දියුණුව අනුව යමින් බැංකු ක්‍රමය නවීකරණය කිරීමේ අවශ්‍යතාවයන් වටහා ගැනීම නිසා ඇතිවූ සෘජු ප්‍රතිඵලයකි.